2022 මාර්තු 02
2022 மார்ச் 02
02 March 2022

NAOSL

වාර්තාවේ අංකය : පීඊආර්/ඒ/එන්ජීඑස්/2020/06
அறிக்கை இல. : பீஈஆர்/ஏஎன்ஜீஎஸ்/2020/06
Report No : PER/A/NGS/2020/06

# රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය
# அரச சார்பற்ற பாடசாலைகள் தொடர்பான ஒழுங்குபடுத்தல் நடைமுறைகள
# Regulatory Process on Non-Governmental Schools




ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

# රජයේ නොවන පාසල් සම්බන්ධයෙන් වන නියාමන ක්‍රියාවලිය



වාර්තා අංකය : **PER/A/NGS/2020/06**

ජාතික විගණන කාර්යාලය

# පටුන


| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 1. | | විධායක සාරාංශය | 01 |
| 2. | | හැඳින්වීම | |
| | 2.1 | පසුබිම | 05 |
| | 2.2 | විගණනය සඳහා අධිකාර බලය | 06 |
| | 2.3 | විගණන ප්‍රවේශය | 06 |
| | 2.4 | විගණන ක්‍රමවේද | 08 |
| | 2.5 | විගණන අරමුණු හා නිර්ණායක | 09 |
| | 2.6 | විගණන විෂයපථය | 12 |
| | 2.7 | විගණන විෂයපථය සීමා කිරීම් | 12 |
| | 2.8 | සම්බන්ධිත ආයතන | 13 |
| 3. | | විස්තරාත්මක විගණන සොයාගැනීම් | |
| | 3.1 | ගුණාත්මක සම අධ්‍යාපනයක් උදෙසා වූ නෛතික පහසුකම් | 15 |
| | 3.2 | රජයේ අනුමත පෞද්ගලික පාසල් | 18 |
| | 3.3 | ජාත්‍යන්තර පාසල් | 39 |
| | 3.4 | ආගමික පාසල් | 65 |
| 4. | | නිර්දේශ | 76 |
| 5. | | ඇමුණුම් | 79 |

## 01. විධායක සාරාංශය

ශ්‍රී ලංකාවට බුදු දහම රැගෙන ඒමේ ප්‍රතිඵලයක් ලෙස හිමි වූ බෞද්ධ අධ්‍යාපනය, බෞද්ධ විහාරස්ථාන හා පිරිවෙන් මූලික කර ගනිමින් විකාශනය විය. ඉන්පසු යටත් විජිත ව්‍යාප්තියේ ආරම්භයත් සමඟ පළමුව වෙරළබඩ පළාත්වල හා පසුව අභ්‍යන්තරය තුළ ක්‍රිස්තියානි මිෂනාරි සංගම් අධ්‍යාපන කාර්යයයේ නිරත වීමට පටන් ගෙන ඇති අතර 1931 දී සර්වජන ඡන්ද බලය ලබා දීමෙන් පසු ආචාර්ය සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතාගේ මූලිකත්වයෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත විය. මේ යටතේ සැමට අධ්‍යාපනය ලබා දීම සඳහා රජය විසින් දිවයින පුරා මධ්‍ය මහා විද්‍යාල ආරම්භ කරන ලදි.

මෙම නිදහස් අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වෙමින් යන අතරතුර මිෂනාරි පාසල් හා ඇතැම් බෞද්ධ පෞද්ගලික පාසල් වශයෙන් ගාස්තු අයකරන පාසල් බොහොමයක් 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතින් රජයට පවරා ගැනීමට කටයුතු කර ඇත. වර්තමානය වන විට මෙවැනි රජයේ අනුමත පෞද්ගලික පාසල් 80 ක් හා ඒවායේ ශාඛා පාසල් 10ක් දිවයින පුරා ක්‍රියාත්මක වන අතර මෙම පාසල්වලින් බහුතරයකට ගුරු වැටුප්, සිසු නිල ඇඳුම්, පෙළ පොත් ආදිය ලබා දීම සඳහා වාර්ෂිකව රු.මිලියන 2,000කට අධික මුදලක් රජය විසින් වැයකරන බව නිරීක්ෂණය විය.

1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය මගින් අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාවේ (අවුරුදු 5-14 දක්වා) පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල් ආරම්භ කිරීමට පෞද්ගලික අංශයට නොහැකි බවට විධිවිධානයක් පනවා ඇත. එවැනි නීතිමය තත්ත්වයක් පැවතිය ද 1980 දශකය වනවිට ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටින විදේශීය ප්‍රජාවගේ දරුවන් ඉලක්ක කොට ගත් ජාත්‍යන්තර පාසල් නමින් අධ්‍යාපන ආයතන ආරම්භ වී ඇති අතර වර්තමානයේ ශ්‍රී ලාංකීය සිසුන් සැලකිය යුතු ප්‍රමාණයක් එම පාසල්වල දේශීය හා විදේශීය විෂය නිර්දේශ යටතේ ඉගෙනුම ලබති.

අධ්‍යාපනය සම්බන්ධ විශ්වීය හා දේශීය වශයෙන් බලපැවැත්වෙන නෛතික රාමුව පිළිබඳව සලකා බලන විට එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ අංක 29 හි 2 වන ඡේදය අනුව වයස අවු.18 ට අඩු ළමයෙකු සඳහා අධ්‍යාපනය ලබාදීමේ දී අනුකූල විය යුතු නිර්ණායක හඳුන්වා දී තිබිය යුතුය. එසේම ළමුන් වෙත අධ්‍යාපනය ලබාදෙන ආයතන විසින් රජය මගින් හඳුන්වා දී ඇති නිර්ණායක අනුව තම ආයතන පවත්වාගෙන යන බවට තහවුරුවක්ද ලබාදිය යුතුය.

එසේම 2030 තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු අංක 4 අනුව පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා එහි ඉලක්ක 4.1 අනුව, ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතියීක අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරුකල යුතුය.

මෙකී තත්ත්වයන් යටතේ 2020 වර්ෂය වන විට රජයේ පාසල් යන කාණ්ඩයෙන් බැහැරව ශ්‍රී ලාංකීය දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් හා මද්‍රසා පාසල් යන පාසල් නියාමනය වන ආකාරය ඇගයීම පිණිස මෙම කාර්යසාධන විගණනය සිදු කරන ලදි. මෙහිදී විවිධ රාජ්‍ය ආයතන මගින් තොරතුරු ලබාගත් නමුත්, ජාත්‍යන්තර පාසල් හා මද්‍රසා පාසල් සම්බන්ධයෙන් සමස්ත දත්ත ලබාගත හැකි රාජ්‍ය ආයතන නොමැතිවීමත්, පැවති කොවිඩ් 19 වාතාවරණය හමුවේ මෙම සියළු පාසල් භෞතිකව පරීක්ෂා කිරීමට නොහැකිවීමත් මෙම විගණනය කිරීමේදී පැවති සීමාවන් විය.

රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් මෙහිදී හඳුනාගත් ප්‍රධාන නිරීක්ෂණ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් රජයේ සියලු පාසල්වල ඉගෙනුම් ක්‍රියාවලිය අධීක්ෂණය කෙරුණ ද, අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂයපථයට අයත් නොවන බව පවසමින් රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් එවැනි පුළුල් අධීක්ෂණයක් සිදුකර නොමැති බවත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා චක්‍රලේඛ නිකුත් කර තිබුණු නමුත් එම චක්‍රලේඛවල සඳහන් කරුණුවලට අනුගත නොවන පාසල් පවතින බවත්, එවැනි රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණයට යාමේදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය එම පාසල්වලින් නොලැබෙන බවත් නිරීක්ෂණය විය.

එසේම අධ්‍යාපන අමාත්‍යාංශයේ මූලික අනුමැතියකින් තොරව ඇතැම් මව් පාසල් විසින් ශාඛා පාසල් ආරම්භ කර තිබීම, ගුරුවරුන් බඳවා ගැනීමේදී උපාධිධාරීන් නොවන ගුරුවරුන් බඳවා ගැනීම, විනය කාරණාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජනයකින් තොරව, පාසලෙන්, ආගමික නිකායන්ගෙන් පමණක් මූලික පරීක්ෂණ සිදු කිරීම යනාදී කරුණු නිරීක්ෂණය විය. මෙම පාසල්වල පවතින භෞතික හා මානව සම්පත් මෙන්ම ලබාදෙන සේවාවන් අනුව පාසල් ශ්‍රේණිගත කිරීමක් කොට ඒ අනුව අයකල යුතු උපරිම හා අවම ගාස්තු පරාසයන් පිළිබඳ සීමා පැනවීමක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. ඇතැම් රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා රජය විසින් නිලඇඳුම්, පොත්පත් හා ගුරු වැටුප් සඳහා වැය බරක් දැරුවද, එම පාසල්වල කළමනාකාරීත්වයේ අභිමතය පරිදි පාසල් ගාස්තු ඇතුළු වෙනත් අයකිරීම් කරනු ලබයි.

ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් අනාවරණය වූ ප්‍රධාන නිරීක්ෂණ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි වීමක් හෝ කිසිඳු ආකාරයක නියාමන කාර්යයක් මෙම පාසල් සම්බන්ධයෙන් සිදු නොවීම දැක්විය හැක. එහෙත් සමාගම් පනත/ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ව්‍යාපාරික ආයතන ලෙස ලියාපදිංචි වන මෙම පාසල්වල පවතින භෞතික පහසුකම්වල අඩුපාඩු, ගුරුවරුන්ගේ සුදුසුකම් හා ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගැටළු, ගාස්තු අයකිරීමේ විෂමතා ඇතුළු අනෙකුත් ගැටළු පිළිබඳ වරින් වර විවිධ මහජන නියෝජනයන් අධ්‍යාපන අමාත්‍යාංශයට වාර්තා වී තිබුණි. මේ අතර දිවයිනේ ඇතැම් ප්‍රසිද්ධ යැයි සම්මත, වැඩි දෙමාපිය ආකර්ශනයක් හිමි කරගත් ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් නිසිපරිදි ඉගැන්වීම් නොකිරීම, වරින් වර ගුරුවරුන් මාරුවීම, සුදුසුකම් නොලත් ගුරුවරුන් ඉගැන්වීම, විෂය නිර්දේශ ආවරණය නොකිරීම, ළමා මානසික තත්ත්වය තේරුම් නොගත් ඉගැන්වීම් ක්‍රම භාවිතා කිරීම, අසාධාරණ ලෙස ගාස්තු අයකිරීම, දරුවන්ට ලිංගික අපයෝජනයන් සිදුවීම වැනි සිදුවීම්වලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත් වීම අපේක්ෂා කර තිබූ අතර, එය අවම මට්ටමක පැවතීම මෙහිදී කැපී පෙනුණි.

මෙම ජාත්‍යන්තර පාසල් සම්බන්ධව පැනනැගුනු විවිධ ගැටළුකාරී අවස්ථාවලදී දේශීය හා විදේශීය පාර්ශවයන් විසින් විවිධ කරුණු අධ්‍යාපන අමාත්‍යාංශයෙන් විමසීම් කරනු ලබයි. එයින් අදහස් වන්නේ ජාත්‍යන්තර පාසල් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සම්බන්ධ නියමිත අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය බවට සමස්ත ප්‍රජාව විශ්වාස කිරීමයි. නමුත් මෙම සියළු විමසීම්වලදී අධ්‍යාපන අමාත්‍යාංශය තමන්ගේ මැදිහත්වීමක් නොමැති බවට ඒ ඒ ආයතනවලට පිළිතුරු ලෙස ලබා දුන්නද මෙම නියාමන කාර්යය අධ්‍යාපන අමාත්‍යාංශය සතු විය යුතු බව පිළිගත යුතු කරුණක් විය.

මද්‍රසා පාසල් සම්බන්ධ ප්‍රධාන නිරීක්ෂණ අතර මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති පාසල් සංඛ්‍යාව 317 ක් පමණක් වුවත් 2021 සැප්තැම්බර් 06 දින වන විට පාසල් 32ක් ක්‍රියාත්මක නොවන බව එම දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත දන්වා ඇත. දිවයින පුරා එවැනි පාසල් 1700 කට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක වන බවත් මේ සම්බන්ධ දත්ත නොමැතිවීම හා කිසිඳු රාජ්‍ය ආයතනයකින් මෙම පාසල් අධීක්ෂණය හෝ නියාමනයක් සිදුනොවීම දැක්විය හැක. මෙම දරුවන්ට සාමාන්‍ය අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් අදාල දිස්ත්‍රික්කවල පිහිටා තිබියදී මෙවැනි පාසල් සඳහා අනිවාර්යය අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ දරුවන් යොමුවීම පිළිබඳ නියාමනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් වී නොතිබුණි.

2019 අප්‍රේල් 21 දින පාස්කු ප්‍රහාරයත් සමඟ මදුසා පාසල් පිළිබඳ වැඩි අවධානයක් යොමු විය. ඒ අතර මෙම පාසල් සම්බන්ධ ජාතික වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය නිර්දේශයක් මත ඉගැන්වීම් සිදු නොකිරීම, පිළිගත් ආයතනයක් මගින් මෙම පාසල්වල ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු නොකිරීම, මෙම පාසල්වල ළමුන් සංඛ්‍යාව, උගන්වන ගුරුවරු සංඛ්‍යාව හා ඔවුන්ගේ සුදුසුකම් හා මෙම පාසල්වල ළමුන්ට මූලික පහසුකම් පවතීද යන්න පිළිබඳවත්, මෙම පාසල්වල මූල්‍ය තත්ත්වය කුමක්ද යන්න හා අරමුදල් සපයා ගන්නා ප්‍රභවය කුමක් ද යන්න පිළිබඳවත්, කිසිදු රාජ්‍ය ආයතනයකින් නියාමනයක් සිදු නොවන බවත් 2020 පෙබරවාරි 19 දිනැති ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික කමිටු වාර්තාවේ දක්වා තිබුණි.

ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ සියලු දරුවන්ට ජාතික වශයෙන් පිළිගත් ප්‍රමිති සහගත අධ්‍යාපනයක් ලබාදීමට පවතින රජයන් කටයුතු කළ යුතු බවත්, ගෝලීය අවශ්‍යතාවයන්ට සරිලන එවැනි අධ්‍යාපන ක්‍රමයක අවශ්‍යතාවය මේ වන විට මතුව ඇති හෙයින් එවැනි අවශ්‍යතාවයකට සරිලන අධ්‍යාපනයක් ලබාදෙන මුවාවෙන් ව්‍යාපාරික මධ්‍යස්ථාන බිහිවීම වැළැක්වීමට සියලු අධ්‍යාපන ආයතන නියාමනය කිරීමේ මධ්‍යම කේන්ද්‍රස්ථානය බවට අධ්‍යාපන අමාත්‍යාංශය පත්විය යුතු බවත් මෙම විගණනයෙන් නිර්දේශ කෙරේ.

## 02. හැඳින්වීම

### 2.1 පසුබිම

#### 2.1.1 නිදහස් අධ්‍යාපනයේ විකාශනය

ශ්‍රී ලංකාවේ ආරාම සහ පන්සල් මුල් කර ගත් පැවිදි අධ්‍යාපනය ක්‍රිස්තුපූර්ව 6 වන සියවස දක්වා විහිදී යයි. දහඅට වන සියවස අග භාගයේදී, බ්‍රිතාන්‍යයන් ලක්දිව අත්පත් කර ගැනීමෙන් පසුව ක්‍රිස්තියානි මිෂනාරී පාසල් ආරම්භ කරන ලදි.

වර්ෂ 1945 නිදහස් අධ්‍යාපන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමඟ මෙරට අධ්‍යාපන ක්‍රමයේ සුවිශාල වෙනස්කම් සිදු විය. වර්තමානයේදී ශ්‍රී ලංකාවේ රජය මගින් ප්‍රාථමික, ද්විතියික මෙන්ම ඇතැම් විට තෘතියික අධ්‍යාපනයද නොමිලේ ලබාදෙන අතර, අවුරුදු 5-16 අතර වයස් සීමාව දක්වා විධිමත් අධ්‍යාපනය අනිවාර්යය කර ඇත. එමෙන්ම ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති රාමුව තුළ සාමාන්‍ය අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ජාතික පොදු අරමුණු ඉටුකර ගැනීම උදෙසා වෙනස් වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත.

එවකට ගාස්තු අයකරන ඉංග්‍රීසි පාසල් වශයෙන් හා ආගමික පදනමක් සහිත පාසල් වශයෙන් පැවති පාසල් බොහොමයක් 1960 අංක 05 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතින් හා 1961 අංක 08 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතින් රජයට පවරා ගත් අතර, රජයට පවරා නොගත් බොහෝ පෞද්ගලික පාසල් යම් ගාස්තුවක් අයකරන බැවින් එවැනි පාසල් බොහොමයකට රජයේ පාසල්වලට වඩා නව පහසුකම් ලබා දිය හැකි බව පොදු පිළිගැනීමයි. මේ වන විට දිවයින තුල ක්‍රියාත්මක වන සමස්ත රජයේ අනුමත පෞද්ගලික පාසල් සංඛ්‍යාව 80 න් 48 ක් හා ඒවායේ ශාඛා පාසල් 10න් 09ක් ගුරු වැටුප් සඳහා රජයෙන් ආධාර ලබන පාසල් වන අතර, සෙසු පාසල් 32 හා එක් ශාඛා පාසලක් ගුරු වැටුප් ආධාර නොලබන පාසල් වේ. රජයේ සහනාධාර ලබන පාසල් සඳහා ගුරු වැටුප්, පෙළ පොත්, නිල ඇඳුම් සහ වෙනත් පහසුකම් රජය විසින් සපයනු ලැබේ.

මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටින විදේශීය ප්‍රජාවගේ දරුවන් ඉලක්ක කොට ගත් ජාත්‍යන්තර පාසල් 1980 දශකයේදී පමණ ආරම්භ වී ඇත. වර්තමානය වන විට මෙම පාසල් විදේශීය ප්‍රජාවට පමණක් සීමා නොවන අතර පන්ති ගාස්තු අයකෙරෙන බැවින් ගෙවීමේ හැකියාව හා කැමැත්ත ඇති ඕනෑම අයෙකුට මෙම පාසල්වලට සම්බන්ධ විය හැකිය. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ සිට සිදු කරන ලද සමීක්ෂණයකට අනුව මේ වන විට ජාත්‍යන්තර පාසල් 391 ක් පමණ ඇති බවට හඳුනාගෙන ඇත.

මීට අමතරව, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හා මුස්ලිම් ලෙස තම ආගම මුල්කර ගත් අධ්‍යාපන මධ්‍යස්ථාන ද ක්‍රියාත්මක වේ. මෙයින් ඇතැම් අධ්‍යාපන මධ්‍යස්ථාන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශිත විෂය නිර්දේශය යටතේ සාමාන්‍ය අධ්‍යාපනය ලබා දෙන අතර රජයේ විභාග සඳහා යොමු කෙරේ.

### 2.1.2 ශ්‍රී ලංකාවේ පාසල්යන වයසේ දරුවන් අධ්‍යාපනය හදාරන ආයතන

| | | ආයතනය | ආයතන සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | | රජයේ පාසල් (ජාතික හා පළාත්) | 10,165 | 4,061,653 |
| (ආ) | | රජයේ අනුමත පෞද්ගලික පාසල් | 89 | 135,600 |
| (ඇ) | | ජාත්‍යන්තර පාසල් | 391<br>(දළ වශයෙන්) | 139,727 |
| (ඇ) | | ආගමික පාසල් | | |
| | (i) | පිරිවෙන් | 801 | 68,319 |
| | (ii) | සීලමාතා ආයතන | 03 | 45 |
| | (iii) | කතෝලික- දෙවිසත්හල් | 04 | 16 |
| | (iv) | හින්දු- පූජකවරුන් සඳහා අධ්‍යාපනය ලබා දෙන | 03 | 40 |
| | (v) | මදුසා පාසල්/ අරාබි පාසල් | 317<br>(මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි සංඛ්‍යාව පමණි. මින් 32ක් ක්‍රියාත්මක නොවන බව දක්වා ඇත.) | 28,424 |

**(මූලාශ්‍ර : 2019 වාර්ෂික පාසල් සංගණන වාර්තාව, අදාල ආයතන වලින් දත්ත ලබා ගත් ලිපි)**

### 2.2 විගණනය සඳහා අධිකාර බලය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 3(1)(ඇ), 5(2), 12(ළු) වගන්ති අනුව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි.

### 2.3 විගණන ප්‍රවේශය

පහත සඳහන් ගැටළු සාකච්ඡා කිරීම පිණිස මෙම මාතෘකාව යටතේ කාර්යසාධන විගණනයක් සිදුකිරීමට ප්‍රවේශය සැලසුණි.

**(අ) රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා වන අධීක්ෂණ ක්‍රමවේදය ප්‍රමාණවත් නොවීම**

1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත යටතේ ක්‍රියාත්මක වන රජයේ ආධාර ලබන හෝ නොලබන පාසල් "රජයේ අනුමත පෞද්ගලික පාසල්" වේ. මෙවැනි පාසල් 80 ක් හා ශාඛා පාසල් 10 ක් දිවයින පුරා ව්‍යාප්තව ඇත. මෙම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයෙන් කළමනාකරණය වන අතර රජයේ ගුරු වැටුප්, පෙළ පොත්, නිල ඇඳුම් වැනි ආධාර ලබා දෙනු ලැබේ. 2020 වර්ෂයේදී ගුරු වැටුප් හා වේතන, වෙනත් දීමනා හා දේපළ ණය පොළී සඳහා පමණක් රු.2,053,868,481 ක වියදමක් දරා තිබුණි. රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සඳහා චක්‍රලේඛ, උපදෙස් ලිපි ආදිය නිකුත් කර තිබුණ ද, එම පාසල් ඒ සඳහා අනුගත නොවීමත්, එම පාසල්හි ගුණාත්මක තත්ත්වයන් පිළිබඳ ප්‍රමාණවත් අධීක්ෂණයක් සිදු නොවීමත් හේතුවෙන් විවිධ ගැටළු පැන නැගී ඇත.

**(ආ) ජාත්‍යන්තර පාසල් ලියාපදිංචියේ දී හා පවත්වාගෙන යාමේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයට යටත් නොවීම**

1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය මගින් අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාවේ (අවුරුදු 5-14 දක්වා) පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා පාසල් ආරම්භ කිරීමට පෞද්ගලික අංශයට නොහැකි බවට විධිවිධානවක් පනවා ඇත. එම නිසා ජාත්‍යන්තර පාසල් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස හෝ පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී අධ්‍යාපන ආයතන වශයෙන් කටයුතු කරයි. එලෙස අධ්‍යාපන ආයතන වශයෙන් ලියාපදිංචියේ දී, ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, කිසිඳු පූර්ව අනුමැතියක් ලබා නොගනී. ඒ අනුව එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නියාමනය නොවන බවත්, ඔවුන් ව්‍යාපාරික මට්ටමින් කටයුතු කරන බවත්, අධ්‍යාපන ප්‍රමිතිය පාසල් අතර බෙහෙවින් වෙනස්වන බැවින්, එය දරුවන්ගේ ගුණාත්මක අධ්‍යාපනයට බලපෑම් සිදු කර ඇති බවත් දැකිය හැක. මෙවැනි ජාත්‍යන්තර පාසල් 391ක් පමණ මේ වන විට දිවයින පුරා ක්‍රියාත්මක වන බවට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇත.

**(ඇ) ආගමික පාසල් නියාමනය සඳහා ප්‍රමාණවත් ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම**

ප්‍රධාන වශයෙන් තම ආගම මුල්කර ගත් අධ්‍යාපන ආයතන ද ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. බෞද්ධ, කතෝලික, හින්දු යන ආගම්වලට අදාලව

පූජකවරුන් බිහිකිරීම උදෙසා ආගමික පාසල් පවත්වාගෙන යාම පිළිබඳ පරීක්ෂාවේදී බෞද්ධාගම මූලිකකරගත් පිරිවෙන් ආයතන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශිත විෂය නිර්දේශය යටතේ ඉගැන්වීම් සිදු කරන ආයතන බවත් කතෝලික හා හින්දු ආගම සම්බන්ධව පූජකවරුන් බිහිකිරීම උදෙසා පවත්වාගෙන යන ආයතන සාමාන්‍ය අධ්‍යාපනය නිමාකරන ලද සිසුන් උදෙසා පවත්වාගෙන යන බවත් අනාවරණය විය. නමුත් අනිවාර්යය අධ්‍යාපන වයසේ පසුවන දරුවන් හට සාමාන්‍ය අධ්‍යාපනය ලබා නොදී ආගමික අධ්‍යාපනය පමණක් ලබාදෙන, අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ නියාමනය නොවන මදුසා අධ්‍යාපන ආයතන ද දිවයින පුරා ක්‍රියාත්මක වේ. ඒ අනුව මෙම දරුවන් හට සාමාන්‍ය අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථාව මගහැරී ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ද, සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබාගැනීමේ අයිතිය සහතික කිරීම දක්වා ඇත. ඒ අනුව ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මකවන රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් හා මදුසා යන පාසල්වල ඉගෙනුම ලබන දරුවන්ට ද ගුණාත්මකභාවයෙන් ඉහළ අධ්‍යාපනයක් ලබාදීම හා ක්ෂේත්‍රය තුල මතු වී ඇති පොදු ගැටළු හා එම ක්ෂේත්‍රය විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍ය අදාල රාජ්‍ය ආයතනවල නියාමනය ප්‍රමාණවත් ද යන්න ඇගයීම මෙම විගණනයෙන් අපේක්ෂා කෙරේ.

## 2.4 විගණන ක්‍රමවේද

(අ) වගකිවයුතු රාජ්‍ය ආයතන හා අදාල අංශ සමඟ සාකච්ඡා කිරීම හා තහවුරු කිරීම් ලබා ගැනීම

(i) අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉහළ කළමනාකරණය හා පෞද්ගලික පාසල් අංශය සමඟ සාකච්ඡා කිරීම, ප්‍රශ්නාවලි මගින් තොරතුරු ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

(ii) දරුවන් සම්බන්ධයෙන් කටයුතු කරන අධ්‍යාපන, සෞඛ්‍යහා වෙනත් අදාළ ක්ෂේත්‍රවල නිලධාරීන් සමඟ සාකච්ජා කිරීම, ප්‍රශ්නාවලි මගින් තොරතුරු ලබා ගැනීම හා ඒවා විශ්ලේෂණය කිරීම.

(iii) රජයේ මෙන්ම රජයේ නොවන පාසල් ද, රාජ්‍ය ආයතන මගින් නිකුත් කරන ලද අදාල මාර්ගොපදේශ, චක්‍රලේඛ, උපදෙස් ලිපි යනාදියට අනුගත වීම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්නාවලි යැවීම මගින් තොරතුරු ලබා ගැනිම හා ඒවා විශ්ලේෂණය කිරීම. මෙහිදී අදාල රාජ්‍ය ආයතන යනු මෙම විගණනය සඳහා සම්බන්ධිත ආයතන වේ.

(ආ) ලිපිගොනු පරීක්ෂා කිරීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය විසින් පවත්වාගෙන යනු ලබන ලිපිගොනු පරීක්ෂා කිරීම.

(ඇ) භෞතික නිරීක්ෂණයන්

අදාල පාසල් වෙත ගොස් ඒවායේ භෞතික පහසුකම්, ඉගැන්වීම් ක්‍රමවේද පරීක්ෂාව හා ළමුන්ගෙන් අදහස් ලබා ගැනීමට අපේක්ෂා කලද, රටේ පවතින වර්තමාන සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් භෞතික නිරීක්ෂණයන් ලබා ගැනීමට නොහැකි විය.

## 2.5 විගණන අරමුණ හා නිර්ණායක

### 2.5.1 විගණන අරමුණ

අනිවාර්යය අධ්‍යාපනය හැදැරිය යුතු වයසේ සිටින දරුවන් සඳහා ශ්‍රී ලංකාව තුල පවත්වාගෙන යන රජයේ පාසල් හැර අනෙකුත් පාසල් (රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, ආගමික පාසල්) සම්බන්ධයෙන් අදාල රාජ්‍ය ආයතන මගින් විධිමත් නියාමනයක් සිදුවන්නේ ද යන්න ඇගයීම මෙම විගණනයේ මූලික අරමුණ විය.

### 2.5.2 විගණන නිර්ණායක

| | නිර්ණායකය | මූලාශ්‍රය |
|---|---|---|
| | -------------- | -------- |
| (i) | VI වන පරිච්ඡේදයේ (ඖ) වගන්තිය - අධ්‍යාපනයේ අයිතිය සහතික කිරීම | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| (ii) | 2015 අංක 1 දරන ළමයින් අනිවාර්යයෙන් පාසැල්වලට පැමිණීමේ නියෝග | 1939 අංක 31 දරණ අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය යටතේ නිකුත් කල 2016 අප්‍රේල් 20 දිනැති අංක 1963/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රය |
| (iii) | මග පෙන්වීමේ මූලධර්ම | ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය (2016 කෙටුම්පත) |
| (iv) | 28 හා 29 වගන්ති - ළමුන්ට අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය | එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය |

| | | |
|---|---|---|
| (v) | අරමුණ 4- ඉලක්ක 1 - සියළු ළමුන්ට සමාන සහ ගුණාත්මක අධ්‍යාපනයක් තහවුරු කිරීම | තිරසර සංවර්ධන අරමුණු |
| (vi) | පෞද්ගලික පාසල් රජයට පවරා ගැනීමට අදාල පනත<br>- 6(a) වගන්තිය - රජයේ අනුමත පෞද්ගලික පාසල් රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුගත විය යුතු බව<br>- 6(h) වගන්තිය - ගුරුවරයෙකු ඉවත් කිරීමට අදාල විධිවිධාන | 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත |
| (vii) | 25 වන වගන්තිය - නව පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි බව | 1961 අංක 08 දරන උපකෘත පාසල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත |
| (viii) | ආධාර නොලබන පාසල්වලට මූල්‍ය ආධාර ලබාදීමේ විධිවිධාන | 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත |
| (ix) | රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් සඳහා අවසර ලබා දීමේ කොන්දේසි | අංක අමප/18/0850/742/017 හා 2018 මැයි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය |
| (x) | රජයේ අනුමත ආධාර ලබන/ නොලබන පෞද්ගලික පාසල්වල අධ්‍යාපනික හා ආයතනික කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධ උපදෙස් | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 2005/31 හා 2005 ඔක්තෝබර් 31 දිනැති චක්‍රලේඛය |
| (xi) | රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ආයතනික හා අධ්‍යාපනික කටයුතු ක්‍රියාත්මක කිරීම සම්බන්ධ උපදෙස් | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ඊඩී/01/10/01/01/16 හා 2008 නොවැම්බර් 13 දිනැති උපදෙස් ලිපිය |

| | | |
|---|---|---|
| (xii) | අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් තෝරා ගැනීමට අදාල නිර්ණායක | අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 20/2016 දරණ 2016 ජූලි 08 දිනැති චක්‍රලේඛය |
| (xiii) | උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා ඒවායේ ගුරුවරුන්ගේ සුදුසුකම්, පත්වීම් සහ පුහුණු වීමේ කාලපරිච්ඡේද සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නියමයන් | 1983 දෙසැම්බර් 09 දිනැති ගැසට් පත්‍රයේ අධ්‍යාපන ආඥා පනතේ 37 වගන්තිය යටතේ සාදන ලද 1983 උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා නියෝග |
| (xiv) | ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 5.1, 5.2, 7.2.1 හා 7.2.2 වගන්ති | 2014 ඔක්තෝබර් 23 දිනැති අංක 1885/38 දරණ අති විශේෂ ගැසට් පත්‍රය |
| (xv) | රජයේ අනුමත පෞද්ගලික පාසලක සිටිය යුතු අධ්‍යයන කාර්යය මණ්ඩලය නිර්ණය කිරීමට අදාල කොන්දේසි | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2018 ජුනි 20 දිනැති අංක 17/2018 දරණ චක්‍රලේඛය |
| (xvi) | ජාත්‍යන්තර පාසල් සම්බන්ධ නිර්දේශ | 2013 සැප්තැම්බර් 17 දිනැති ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම පිළිබඳ සලකා බැලීම සඳහා පත්කරන ලද කමිටු වාර්තාව |
| (xvii) | විදේශීය ආයෝජකයකු විසින් ශ්‍රී ලංකාවට කරනු ලබන විදේශීය ආයෝජනයකදී සලකා බැලෙන කොන්දේසි | 1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ 16 වන වගන්තිය |
| (xviii) | සමාගමක් ලියාපදිංචියේ දී සලකා බැලෙන නිර්ණායක | 2007 අංක 07 දරන සමාගම් පනත |
| (xix) | ව්‍යාපාරයක් ලියාපදිංචියේ දී සලකා බැලෙන නිර්ණායක | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත |

| | | |
|---|---|---|
| (xx) | රජයේ නව පාසලක් ආරම්භ කිරීමේ දී සලකා බැලෙන නිර්ණායක | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 1981 පිළියෙල කර ඇති පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 2.1 ඡේදය |
| (xxi) | පාසලකට අවශ්‍ය භෞතික සම්පත් සඳහා මානයන් | අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළියෙල කර ඇති භෞතික සම්පත් කළමනාකරණය හා භෞතික සම්පත් සඳහා මානයන් පිළිබඳ විදුහල්පති අත්පොත |
| (xxii) | සුරක්ෂා රක්ෂණාවරණය ලබා දීම සම්බන්ධ කොන්දේසි | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017/35 දරණ 2017 සැප්තැම්බර් 29 දිනැති චක්‍රලේඛය |
| (xxiii) | පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සහ ඇගයීම දර්ශක | අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 ජනවාරි 22 දිනැති අංක ඊඩී/1/21/6/4 දරණ චක්‍රලේඛය |
| (xxiv) | ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික කමිටු වාර්තාවේ සඳහන් නිරීක්ෂණ | ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික කමිටු වාර්තාව |
| (xxv) | මද්‍රසා අධ්‍යාපන පද්ධතිය පිළිබඳ පර්යේෂණ වාර්තාවේ සඳහන් නිරීක්ෂණ | ශ්‍රී ලංකාවේ නූතන මද්‍රසා අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සිදුකරන ලද අධ්‍යයන වාර්තාව |

## 2.6 විගණන විෂයපථය

රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල් හා මද්‍රසා පාසල්වල කටයුතු පිළිබඳව පමණක් මෙම විගණනයේදී අවධානය යොමු කෙරේ.

## 2.7 විගණන විෂයපථය සීමා කිරීම්

(අ) ජාත්‍යන්තර පාසල්වලට පිවිස එම පාසල් භෞතිකව පරීක්ෂා කිරීමට අදාල නෛතික ප්‍රතිපාදන නොමැති හෙයින්ද, පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය මත විගණන කාලපරිච්ඡේදය තුල වසා තිබීම හේතුවෙන් රජයේ අනුමත පෞද්ගලික හා ආගමික පාසල් ද භෞතික පරීක්ෂාවකට ලක් කිරීමට නොහැකි වීම.

(ආ) ජාත්‍යන්තර පාසල් පිළිබඳව ප්‍රමාණවත් දත්ත අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොපැවතීම.

(ඇ) සමස්ත මද්‍රසා පාසල් පිළිබඳව ප්‍රමාණවත් දත්ත මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව සතුව නොපැවතීම.

(ඈ) විවිධ හේතු මත විවිධ පාසල්වලට දරුවන් ඇතුළත් කරගැනීම සඳහා දෙමාපියන් දැඩි තරඟකාරීත්වයකින් කටයුතු කරයි. ඒ අනුව දෙමාපියන් තුළ පාසල් සම්බන්ධයෙන් පවතින කැමැත්ත කෙසේ ඇතිවේද යන්න මැනීම සඳහා නිර්ණායක නොමැති වීම.

## 2.8 සම්බන්ධිත ආයතන

| | ආයතනය | සම්බන්ධ වන ආකාරය |
|---|---|---|
| (අ) | අධ්‍යාපන අමාත්‍යාංශය | ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් වගකීම දරණු ලබන ප්‍රධාන රාජ්‍ය ආයතනය වන්නේ අධ්‍යාපන අමාත්‍යාංශයයි. මෙම විගණනයේදී සාකච්ඡා කරණු ලබන රජයේ අනුමත පෞද්ගලික පාසල් පමණක් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය මගින් අධීක්ෂණය කෙරේ. |
| (ආ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු | රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා ආධාර ලබාදීමේදී සහ අධීක්ෂණයේදී අධ්‍යාපන අමාත්‍යාංශය පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු සම්බන්ධ කර ගනී. මෙම දෙපාර්තමේන්තු වෙත රාජ්‍ය නොවන පාසල් සම්බන්ධව ලැබෙන ලිපි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරනු ලැබේ. |
| (ඇ) | සෞඛ්‍ය අමාත්‍යාංශය | සියළු පාසල් දරුවන්ට පාසල තුල සෞඛ්‍ය සේවා සැපයීමට සෞඛ්‍ය අමාත්‍යාංශය බැඳී ඇත. පළාත් මට්ටමින් එම වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතද, දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතද පැවරී ඇත. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පාසල තුල පාසල් සෞඛ්‍ය වැඩසටහන සංවිධානය කිරීමේ වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂක සතු වේ. |

| | | |
|---|---|---|
| (ඈ) | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව | සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මගින් ජාත්‍යන්තර පාසල් නමින් හැඳින්වෙන අධ්‍යාපන ආයතන "සමාගම්" ලෙස ලියාපදිංචිය සිදු කිරීම. |
| (ඉ) | ආයෝජන මණ්ඩලය | ජාත්‍යන්තර පාසල් සඳහා ආයෝජනයට අනුමැතිය ලබා දීම. |
| (ඊ) | විභාග කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | දේශීය විෂය මාලාව ඉගෙන ගන්නා ළමුන්ගේ විභාග කටයුතු පැවැත්වීම. |
| (උ) | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, හින්දු ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. |
| (ඌ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරිය | අධ්‍යාපනය ලබන වයසේ දරුවන්ගේ ගැටළු සම්බන්ධයෙන් මැදිහත් වීම. |

## 3. විස්තරාත්මක විගණන සොයාගැනීම්

### 3.1 ගුණාත්මක සම අධ්‍යාපනයක් උදෙසා වූ නෛතික පහසුකම්

#### 3.1.1 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VI වන පරිච්ඡේදයේ රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් යටතේ නූගත්කම සහමුලින් ම තුරන් කිරීම සහ සියලු තැනැත්තන්ට අධ්‍යාපනයේ සෑම අවස්ථාවකදීම සර්ව සාධාරණ හා සමාන ඉඩ ප්‍රස්ථා ලබා ගැනීමේ අයිතිය සහතික කිරීම දක්වා ඇත.

#### 3.1.2 අධ්‍යාපන ආඥා පනත

1939 අංක 31 දරන අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යවරයාට පැවරී ඇති බලතල අනුව 2016 අප්‍රේල් 20 දිනැති අංක 1963/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි, 2015 අංක 1 දරන ළමයින් අනිවාර්යයෙන් පාසැල්වලට පැමිණීමේ නියෝගයන්හි "වයස අවුරුදු පහකට නොඅඩු සහ අවුරුදු දහසයකට නොවැඩි සෑම ළමයෙකුගේ ම දෙමාපියන් විසින්, ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අයුරකින් ප්‍රමාණවත් හා සුදුසු විධිවිධාන සළස්වා ඇත්නම් මිස, නිතිපතා පාසලකට පැමිණ අධ්‍යාපනයක් ලැබීමට කටයුතු සළස්වා දිය යුතු ය" යනුවෙන් සඳහන් වේ.

එමෙන්ම එහි 13 වන නියෝගය අනුව අනිවාර්යය අධ්‍යාපන වයසේ පසුවන දරුවන් පාසැල් නොයැවීමට හේතු විය හැක්කේ, අසනීපයක්, මානසික හෝ කායික දුබලතාවයක් හෝ වෙනත් වෛද්‍ය හේතූන් නිසා ළමයා පාසලට පැමිණීම වැළකී ඇති බව, අතුරු පියවරක් වශයෙන් නොවිධිමත් අධ්‍යාපන සාක්ෂර මධ්‍යස්ථානයකට, උපකෘත විශේෂ පාසලකට හෝ තාක්ෂණ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයකට නැතහොත් 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ අර්ථානුකූල වූ පිරිවෙනකට හෝ ළමයා යැවීම බව හෝ වෙනත් නොවැළැක්විය හැකි හේතුවක් නිසා පමණක් බව ද වැඩිදුරටත් සඳහන් වේ

#### 3.1.3 2016 යෝජිත සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තිය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවසන් වරට 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා යෝජනා සකස් කර ප්‍රසිද්ධියට පත්කර තිබුණ ද විගණන දිනය වන විටත් එය අනුමත ප්‍රතිපත්තියක් ලෙස අධ්‍යාපන පද්ධතියට එක් වී නොතිබුණි. එහෙත් එහි ඇති යෝජනා සලකා අවශ්‍යතාවය පරිදි ඇතැම් ප්‍රතිසංස්කරණ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කර ඇති බව විගණනය වෙත දන්වා ඇත. එම ප්‍රසිද්ධියට පත් කර ඇති අධ්‍යාපන ප්‍රතිපත්තියේ මග පෙන්වීමේ මූලධර්ම ලෙස සඳහන් යෝජනා 17 ක් අතරින් පහත කරුණු අවධාරණය කෙරේ.

- වයස 18ට අඩු සෑම පුද්ගලයෙකුම ළමයෙක් යනුවෙන් නිර්වචනය කෙරේ.
- පාසල යනු ප්‍රජාවට අධ්‍යාපන සේවාව ලබාදෙන ප්‍රධාන සැපයුම්කරු වන අතර, සෑම ශ්‍රී ලාංකේය ළමයෙකුටම මෙම සේවාවන් සැපයිය යුත්තේ ඔහු/ඇයගේ අයිතිවාසිකමක් ලෙසය.
- රජය විශේෂ අවධානයකින් යුක්තව ළමයින්ගේ කායික, මානසික, සදාචාරාත්මක, ආගමික හා සාමාජීය පූර්ණ සංවර්ධනය තහවුරු කිරීමට සහ ඔවුන් සූරා කෑමෙන් හා වෙනස්කම් දැක්වීමෙන් ආරක්ෂා කර ගැනීමට ඔවුන්ගේ අයිතීන් රජය විසින් විශේෂ අවධානයකින් යුතුව ප්‍රවර්ධනය කළ යුතුය.
- කායික හෝ මානසික අපරිණිතභාවය නිසා හෝ කායික අශක්නුතාවට පත්වීම නිසා ළමයකුට අදාළ නෛතික රැකවරණය ඇතුලුව විශේෂ ආරක්ෂාවන්, අවධානය හා සැලකිල්ල අනුකූල වියයුතුය.
- ළමයින් සඳහා වයස හතරේ සිට දහසය දක්වා අධ්‍යාපනය අනිවාර්ය වියයුතුය.
- සුදුසු ක්‍රීඩා හා විනෝදාත්මක කටයුතුවල යෙදීම පිණිස විවේක කාලයන් තිබීමට ළමයාට ඇති අයිතිවාසිකම රජය පිළිගෙන බලාත්මක කළයුතු අතර සංස්කෘතික හා කලාත්මක ජීවිතයට හවුල්වීමට ළමයාට ඇති අයිතිවාසිකමට ගරු කරමින් එය ප්‍රවර්ධනය කළයුතු වේ. ශ්‍රී ලාංකේය ළමයින් සැමටම පාසලෙන් සංස්කෘතික, කලාත්මක, විනෝදාත්මක සහ විවේක කටයුතු සඳහා සුදුසු සහ සමාන අවස්ථා සැපයිය යුතුය.

එහිදී විශේෂයෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සංවර්ධනය, අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය, ඉගෙනුම් පරිසරය යනාදී කරුණු පිළිබඳ විස්තරාත්මක යෝජනා දක්වා ඇත. මෙම විගණනයේ දී රජයේ අනුමත පෞද්ගලික පාසල්, ජාත්‍යන්තර පාසල්, ආගමික පාසල් වැනි අධ්‍යාපනික ආයතනවල පවත්නා අඩුපාඩු සම්බන්ධයෙන් ඉදිරියේදී සාකච්ඡා කෙරෙන විගණන නිරීක්ෂණයන් පිළිබඳ සැලකීමේදී, සමස්ත අධ්‍යාපනය සඳහාම සකස් කල අනුමත අධ්‍යාපන ප්‍රතිපත්තියක් පොදු නීතියක් බවට පත් වී නොතිබීම ද, එම පද්ධතියෙහි පවත්නා අඩුපාඩු නිවැරදි කරගත නොහැකි වීමට හේතුවක් වී ඇති බව නිරීක්ෂණය කෙරේ.

### 3.1.4 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය යනු ළමුන්ගේ අයිතිවාසිකම් කවරේදැයි සඳහන්ව ඇති ජාත්‍යන්තරව පිළිගත් ලියවිල්ලකි. මෙම සම්මුතිය ලංකා රජය විසින්ද අත්සන් කර වර්ෂ 1991දී ස්ථිර කර පිළිගෙන ඇත. මෙම සම්මුතිය මගින් විශ්ව ව්‍යාප්ත මට්ටමින් සෑම ළමයෙකුම භුක්ති විඳිය යුතු අයිතිවාසිකම් දක්වා ඇති අතර එම අයිතිවාසිකම් තහවුරු කිරීම වැඩිහිටියන්ගේ මෙන්ම රාජ්‍යයන්ගේ වගකීම බවද අවධාරනය කරයි. මෙහි 28 වන වගන්තිය

අනුව අධ්‍යාපනය ලැබීමට සියලු ළමුන්ට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්යය කිරීමටත්, එය නොමිලේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීම බව දක්වා ඇත.

මෙහි 29 වන වගන්තිය අනුව අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ළමයාගේ පෞරුෂත්වය, දැනුම, කුසලතා සහ මානසික ශාරීරික හැකියාවන් පරිපූර්ණ වර්ධනය කිරීමයි. වගකීමෙන්, සාමකාමීව නිදහස් සමාජයක ජීවත් වීමටද අනිත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වටහා ගෙන පරිසරයට ගරු කරමින් ජීවත් වීමටද අධ්‍යාපනය තුළින් ළමුන් සූදානම් කල යුතුය.

### 3.1.5 තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන න්‍යාය පත්‍රයේ (2015-2030) අරමුණු 4 හි ඉලක්ක 1 අනුව ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකි වන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ, ප්‍රාථමික සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරුකල යුතුය. තවද අරමුණු 4හි ඉලක්ක (අ) අනුව ළමුන්, ආබාධිත පුද්ගලයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය කෙරෙහි සංවේදී ආකාරයට අධ්‍යාපන පහසුකම් ගොඩනැංවීම වැඩිදියුණු කිරීම සහ සියළු දෙනාම ආරක්ෂාකාරී, ප්‍රචණ්ඩත්වයෙන් තොර සියළු දෙනා අන්තර්කරණය වූ ඵලදායී ඉගෙනුම් පරිසරයක් තහවුරු කර දීම කළ යුතුය.

මෙම වාර්තාවේ ඉදිරියේදී සාකච්ඡා කෙරෙන විගණන නිරීක්ෂණයන්ට අනුව, රජයේ නොවන පාසල්වල අධ්‍යාපනය ලබන දරුවන්ට ලබාදෙන අධ්‍යාපනය තුල ඉහත තිරසර සංවර්ධන අරමුණු 4හි ඉලක්කය කරා ලඟා වීමට එම පාසල් ලියාපදිංචියේ දී, පවත්වාගෙන යාමේදී හා අධීක්ෂණයේ දී, පාසලක තිබිය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක පිලිවිතර සම්පූර්ණ වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

## 3.2 රජයේ අනුමත පෞද්ගලික පාසල්

### 3.2.1 පසුබිම

විස්තර පහත පරිදි විය.

(අ) 1945 නිදහස් අධ්‍යාපන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වීමත් සමඟ ගාස්තු අයකරන ඉංග්‍රීසි පාසල් වශයෙන් පැවැති පාසල් හා ආගමික පදනමින් පවත්වා ගෙන ආ පාසල්වලට නිදහස් අධ්‍යාපනයට පැමිණීමට අවස්ථාව ලබාදී තිබුණි.

(ආ) මෙලෙස පාසල් රජයට පවරා ගැනීමේ ප්‍රතිපත්තිය තවදුරටත් ක්‍රියාත්මක කිරිමේ ප්‍රතිඵලයක් ලෙස 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනත හා 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත නීතිගතකර ඇත. එමගින් උපකෘත පාසල් රජයට පවරාගෙන ඇති අතර, එලෙස පවරාගැනීමට අකමැති වූ පාසල් එම අවස්ථාවේ දී "ආධාර නොලබන පාසල්" ලෙස හඳුන්වා ඇත. ආධාර නොලබන පාසල් වුවද රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුගත විය යුතු බව 1960 අංක 05 පනතේ 6(a) වගන්තියේ දක්වා ඇත. මේ අවධිය වන විට පැවති සියලුම පෞද්ගලික පාසල් පොදුවේ "ආධාර නොලබන පාසල්"වශයෙන් පවත්වා ගෙන ගොස් ඇත.

(ඇ) මෙලෙස ආධාර නොලබන පෞද්ගලික පාසල් වශයෙන් පැවති ඇතැම් පාසල්වලට ගුරුවැටුප් ගෙවීමේ ආර්ථික අපහසුතා හේතුවෙන්, 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත නීතිගත කර, "ආධාර නොලබන පාඨශාලාවලට මුදල් ආධාර ලබාදීමේ නියෝග" හඳුන්වා දී, ඒ යටතේ ගුරු වැටුප් ගෙවීම සඳහා ආධාර ලබාදිම රෙගුලාසිගත කර ඇත. මෙලෙස ආධාර ලැබීමත් සමඟ ගුරු වැටුප් සඳහා ආධාර ලබන පෞද්ගලික පාඨශාලා "ආධාර ලබන පාසල්" ලෙසත් එලෙස ගුරු වැටුප් ආධාර නොලබන පාසල් "ආධාර නොලබන පාසල්" ලෙසත් වර්ගීකරණයට ලක්වී ඇත. වර්තමානය වන විට "රජයේ අනුමත පෞද්ගලික පාසල්" යන නාමය යටතේ මෙම පාසල් සියල්ල හඳුන්වනු ලැබේ.

(ඈ) 2020 දෙසැම්බර් 31 දින වන විට දිවයින තුළ ක්‍රියාත්මක වන සමස්ථ රජයේ අනුමත පෞද්ගලික පාසල් සංඛ්‍යාව 80 කි. ඉන් 47 ක් ගුරු වැටුප් සඳහා ආධාර ලබන පාසල් වන අතර, සෙසු පාසල් 33 ගුරු වැටුප් ආධාර නොලබන පාසල් වේ. මීට අමතරව ආධාර ලබන මව් පාසල් 07 ක් විසින් ශාඛා පාසල් 09 ක් ද, ආධාර නොලබන මව් පාසල් 01 ක් විසින් එක් ශාඛා පාසලක්ද වශයෙන් ශාඛා පාසල් 10 ක් පවත්වා ගෙන යනු ලැබේ. පෞද්ගලික පාසල් අංශයෙන් විගණනය වෙත ලැබී ඇති දත්ත අනුව

2019 ජුනි 01 දිනට රජයේ අනුමත පෞද්ගලික පාසල්හි ඉගෙනුම ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 132,800කි.

(ඉ) රජයේ අනුමත පෞද්ගලික පාසල් සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි යන මාධ්‍යයන් වලින් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද දේශීය විෂය මාලාව ඉගැන්වීම් කටයුතු සිදුකරයි. සිසුන් ඇතුලත්වීමේදී ලබා ගන්නා ආධාර මුදලට අමතරව, වාර්ෂිකව හෝ මාසිකව යම් ගාස්තුවක් අයකරන බැවින් මෙම පාසල් බොහෝමයකට රජයේ පාසල්වලට වඩා නව පහසුකම් ලබා දිය හැකි බව පොදු පිළිගැනීමයි.

(ඊ) රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට පහත සඳහන් වරප්‍රසාද රජය මගින් ලබාදෙනු ලැබේ.

(i) රජයේ අනුමත අධාර ලබන පෞද්ගලික පාසල්වලට පමණක් ගුරු වැටුප් සඳහා ආධාර ලබා දෙනු ලැබේ. මෙම පාසල්වල අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා පසුගිය වර්ෂ 4 දී රජය විසින් දරන ලද වියදම පහත පරිදි විය.

**(රු.මිලියන)**

| **වැය ශිර්ෂය** | **වර්ෂය** | | | |
|---|---|---|---|---|
| | **2017** | **2018** | **2019** | **2020** |
| වැටුප් හා වේතන | 930.29 | 1,012.33 | 1,179.99 | 1,594.49 |
| වෙනත් දීමනා | 664.27 | 506.67 | 449.04 | 458.68 |
| රාජ්‍ය සේවක දේපළ ණය පොළී | - | 0.03 | 0.34 | 0.70 |
| **එකතුව** | 1,594.56 | 1,519.03 | 1,629.37 | 2,053.87 |

**(මූලාශ්‍රය : අධ්‍යාපන අමාත්‍යාංශය)**

(ii) රජයේ අනුමත ආධාර ලබන හා ආධාර නොලබන පාසල් දෙවර්ගය සඳහාම පහත ප්‍රතිලාභ ලබා දෙනු ලැබේ. (ඇතැම් ප්‍රතිලාභ පාසල් කළමනාකරණයේ කැමැත්ත හා ඉල්ලීම පරිදි ලබා දේ.)

- සිසුන් සඳහා නිල ඇඳුම් හා පෙළ පොත් ලබා දීම.
- ජාතික විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම්, මඟපෙන්වීම් ලබාදීම.
- දායක විශ්‍රාම වැටුප් ක්‍රමයේ ප්‍රතිලාභ (රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා පමණි)

- වෘත්තිකභාවය සඳහා ගුරු පුහුණුවීම් ලබා දීම. (රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා පමණි)
- සේවාස්ථ ගුරු පුහුණු ලබා දීම. (රජයේ අනුමත පත්වීම්ධාරී ගුරුවරුන් සඳහා පමණි)
- පාසල් අධීක්ෂණය හා උපදෙස් ලබා දීම.
- ඇතැම් නිල ලිපි ලේඛන ලබා දීම. (නාම ලේඛන, සිසුන් ඇතුළත් කිරිමේ පොත, ශිෂ්‍ය කාර්යය දර්ශකය ආදී....)
- චක්‍රලේඛ හා උපදෙස් ලබා දීම.
- සිසුන්ට රජයේ පාසල් විභාගවලට පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමට අවස්ථාව ලබා දීම.
- සිසුන්ට සුරක්ෂා රක්ෂණ වරප්‍රසාදය ලබා දීම.
- අනුමත ගුරුවරුන්ට අග්‍රහාර රක්ෂණ ක්‍රමයේ වරප්‍රසාද, අඩුපොළී දේපළ ණය වරප්‍රසාද ලබා දීම.

(උ) මෙම පාසල් නියාමනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය නමින් වෙනම ඒකකයක් ස්ථාපනය කර ඇත. එක් අධ්‍යක්ෂකවරයෙකු හා සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සමඟ සහායක කාර්යය මණ්ඩලයක් සහිත එම ඒකකය මගින් මෙම පාසල් සම්බන්ධ කටයුතු සිදු කෙරේ.

### 3.2.2 රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතු නීතිමය ප්‍රතිපාදන

රජයේ අනුමත පෞද්ගලික පාසල් ආරම්භ කිරීම, අධ්‍යයන කටයුතු නියාමනය, මූල්‍යාධාර සැපයීම, ගුරුවරුන් පත් කිරීම හා ඉවත් කිරීම, අධ්‍යාපනික හා ආයතනික කටයුතු ආදිය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සතුව පවත්නා නෛතික ප්‍රතිපාදනයන් පහත පරිදි විය.

(අ) 1960 අංක 5 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතෙහි 6(අ) වගන්තියෙහි, රජයේ අනුමත පෞද්ගලික පාසල් රජයේ අධ්‍යාපන ප්‍රතිපත්ති අනුව සිසුන්ට ඉගැන්වීම් හා පුහුණු කිරීම් කටයුතු සිදුකළ යුතු බව සඳහන් වන අතර, 6(ඖ) වගන්තිය ප්‍රකාරව ගුරුවරයෙකු ඉවත් කිරීමට අදාළ විධිවිධාන දක්වා ඇත.

(ආ) 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 25 වන වගන්තිය අනුව නව පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි බව දක්වා ඇත.

(ඇ) 1981 අංක 65 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත මගින් මව්පනතට සංශෝධනයක් එක් කරමින් ආධාර නොලබන පාසල්වලට මූල්‍ය ආධාර ලබාදීමේ විධිවිධාන දක්වා ඇත.

(ඈ) අධ්‍යාපන ආඥා පනත යටතේ සකස් කර ඇති අනු නීති මාලාවේ 16 (i), (iii), (iv), 31ඒ ගුරුවරුන් පත් කිරීම, ඉවත් කිරීම පිළිබඳ විධිවිධාන.

(ඉ) අංක අමප/18/0850/742/017 හා 2018 මැයි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් රෙගුලාසිගත කිරීම.

(ඊ) අංක 2005/31 හා 2005 ඔක්තෝබර් 31 දිනැති "රජයේ අනුමත ආධාර ලබන/ නොලබන පෞද්ගලික පාසල්වල අධ්‍යාපනික හා ආයතනික කටයුතු" චක්‍රලේඛය

(උ) අංක ඊඩී/01/10/01/01/16 හා 2008 නොවැම්බර් 13 දිනැති "රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ආයතනික හා අධ්‍යාපනික කටයුතු ක්‍රියාත්මක කිරීම" යන උපදෙස් ලිපිය

(ඌ) 1983 දෙසැම්බර් 09 දිනැති අධ්‍යාපන ආඥා පනත යටතේ පනවා ඇති ගැසට් නියෝගය මගින් සියළුම උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා ඒවායේ ගුරුවරුන්ගේ සුදුසුකම්, පත්වීම් සහ පුහුණුවීමේ කාලපරිච්ඡේද සම්බන්ධයෙන් පිළිපැදිය යුතු නියමයන් දක්වා ඇත.

(එ) 2017 ඔක්තෝබර් 24 දිනැති අංක 40/2017 දරන චක්‍රලේඛය

(ඒ) වරින්වර නිකුත් කර ඇති චක්‍රලේඛ හා උපදෙස් ලිපි

මේ අනුව ඉහත නෛතික ප්‍රතිපාදන යටතේ රජයේ අනුමත පෞද්ගලික පාසල්වල කටයුතු සිදුකිරීම හා බැහැරවීම් පිළිබඳ විගණන නිරීක්ෂණයන් වාර්තාවේ ඉදිරි පරිච්ඡේදවලදී සාකච්ඡා කෙරේ.

### 3.2.3 රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය, අධීක්ෂණය හා පරිපාලනය

#### 3.2.3.1 මාර්ගෝපදේශන සකස්කර නොතිබීම

අංක අමප/18/0850/742/017 හා 2018 මැයි 23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබා දී ඇති පරිදි අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව MF5/NP/CP/18/52 හා 2018 මැයි 08 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ නිරීක්ෂණවල, “සියළු රජයේ අනුමත ආධාර ලබන පෞද්ගලික පාසල් නියාමනය කිරීමට අවශ්‍ය මාර්ගෝපදේශන අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කිරීම අත්‍යවශ්‍ය වේ” යනුවෙන් සඳහන් වේ. නමුත් විගණන දිනය වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එම මාර්ගෝපදේශන සකස් කර අනුමත කරවාගෙන නොතිබුණි. 2005 ඔක්තෝබර් 31 දිනැති 2005/31 දරණ චක්‍රලේඛය හා 2008 නොවැම්බර් 13 දිනැති උපදෙස් ලිපිය මගින් මෙම පාසල් සඳහා උපදෙස් ලබා දීම පමණක් සිදු කර තිබුණි.

### 3.2.3.2 රජයේ අනුමත පෞද්ගලික පාසල් පරිපාලනය

රජයේ අනුමත පෞද්ගලික පාසල්වල පරිපාලනය කළමනාකාරීත්ව භාරයක් මගින් සිදු කෙරන අතර මෙම පාසල් බොහොමයක් ආගම් කේන්ද්‍ර කරගත් ඒවා වන අතර යම් යම් ආගමික නිකායන්ගේ මැදිහත්වීම සෘජුවම හෝ වක්‍රාකාරයෙන් පාසල් පරිපාලනයට සම්බන්ධ වේ. ඒ අනුව ශිෂ්‍යයන් පාසලට ඇතුලත් කර ගැනීම, ගාස්තු අය කිරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, ගුරුවරුන් සම්බන්ධ කටයුතු යනාදී ලෙස සියළුම අවස්ථාවන්වලදී එම පාසලේ කළමනාකාරීත්වයේ හා අදාල ආගමික නිකායේ මැදිහත්වීමෙන් සිදුවන බවත්, එවැනි අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

### 3.2.3.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ නියාමනය හා අධීක්ෂණය

විස්තර පහත පරිදි විය.

(අ) රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය පිළිබඳ විමසීමේදී ගුරුවරුන්ගේ පෞද්ගලික ලිපිගොනුවට අදාල ආයතනික ගැටළු දිගින් දිගටම පවතින විට ඇතැම් සුවිශේෂී ගැටළු ඇතිවන අවස්ථාවල දී පමණක් පෞද්ගලික පාසල් ශාඛාව විසින් රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය කරනු ලබන බව සඳහන් කර ඇත. ඒ අනුව එම ශාඛාව මගින් සිදු කෙරෙන අධීක්ෂණය පාසල් කළමනාකාරීත්වයට අදාළ කරුණුවලට පමණක් සීමා වී තිබුණි. ඒ අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ඉගැන්වීම් කටයුතු, අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධන කටයුතු, ගුරු කාර්යය මණ්ඩලය සම්බන්ධ ඇතැම් කටයුතු යන අංශ අධීක්ෂණ කාර්යයයෙන් ගිලිහී ගොස් තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරණ චක්‍රලේඛයේ අංක 4(අ)(iii) ඡේදය ප්‍රකාරව පාසල් කටයුතු පරීක්ෂා කිරීමට හෝ තොරතුරු ලබා ගැනීමට හෝ අධීක්ෂණය කිරීම සඳහා හෝ පැමිණෙන පළාත් අධ්‍යාපන නිලධාරීන් සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් ගේ අනන්‍යතාවය තහවුරු කොට ගෙන අවශ්‍ය ලේඛන පරීක්ෂාව/ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලිය අධික්ෂණය කොට වාර්තා ලබා ගැනීම/ සටහන් තැබීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්විය යුතු බව දන්වා ඇත. නමුත් එම චක්‍රලේඛවල සඳහන් කරුණුවලට අනුගත නොවන පාසල් පවතින බවත්, රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණයට යාමේදී ඒ සඳහා අවශ්‍ය සහයෝගය එම පාසල්වලින් නොලැබෙන බවත් පෞද්ගලික පාසල් අංශය මගින් විගණනයට තහවුරු කර සිටින ලදි.

නිදසුනක් ලෙස කොළඹ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක් 2015 ජූලි මස 21 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය මගින් අධීක්ෂණයට ලක්කිරීමේදී පාසලේ භෞතික සම්පත් නිරීක්ෂණය කළයුතු බව පවසා සිටි අවස්ථාවේ ඒ සඳහා අවශ්‍ය සහයෝගය එම පාසලෙන් ලැබී නොතිබුණි. ඒ අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සඳහා බලපැවැත්වෙන නෛතික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බව මෙයින් ගම්‍ය වේ.

ඒ අනුව පාසල් අධීක්ෂණය සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනට පවතින නීතිමය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් එම තත්ත්වය මගහැරවීම පිණිස අවශ්‍ය නෛතික ප්‍රතිපාදන හඳුන්වාදීමට අවශ්‍ය මූලික පියවර අධ්‍යාපන අමාත්‍යාංශය ගෙන නොතිබුණි.

(ඇ) අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් හා එහි මෙහෙයවීමෙන් රජයේ සියලු පාසල් අධීක්ෂණය කෙරේ. එහෙත් රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය පිළිබඳ විමසීමේදී විගණන දිනය වන විටත් එවැනි පුළුල් අධීක්ෂණයක් සිදු කර නොමැති බවත්, එම පාසල් අධීක්ෂණය ඔවුන්ගේ විෂය පථයට අයත් නොවන බවත් විගණනය වෙත වාර්තා කර ඇත. ඒ අනුව අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් පහත සඳහන් ප්‍රමිති ඔස්සේ සිදුකෙරෙන විධිමත් අධීක්ෂණ ක්‍රියාවලිය රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා සිදු නොකරන බව නිරීක්ෂණය විය.

**අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වූ නව ඇගයීම් ක්ෂේත්‍ර**

(i) ශිෂ්‍ය සාධනය
(ii) ඉගෙනුම, ඉගැන්වීම හා ඇගයීම
(iii) විෂය සමගාමී කටයුතු
(iv) ශිෂ්‍ය සුභසාධනය
(v) නායකත්වය හා කළමනාකරණය
(vi) භෞතික සම්පත් කළමනාකරණය
(vii) පාසල හා ප්‍රජාව

ඉහත දක්වන ලද කරුණු අනුව, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ඉගෙනුම ලබන 132,800 කට ආසන්න ශිෂ්‍යය ප්‍රමාණයකගේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳ පිළිගත් නිර්ණායක අනුව අධීක්ෂණයක් සිදු නොවන බවත් මෙම පාසල් සඳහා රජය විසින් වාර්ෂිකව වියදම් කරනු ලබන මුදල් හා දෙමාපියන් වශයෙන් දරනු ලබන අධ්‍යාපන වියදමට සාපේක්ෂව අදාල ප්‍රතිලාභ දරුවන් විසින් අත්පත්කර ගන්නේ ද යන්න පිළිබඳ පසු විපරමක් සිදු නොවන බවත් නිරීක්ෂණය කෙරේ.

#### 3.2.3.4 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් පාසල් අධීක්ෂණය

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු මගින් රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය පිළිබඳ විගණනය මගින් සිදුකරන ලද තොරතුරු විමසීමේ දී ඒ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී ඇති පළාත් 06 න් සබරගමුව පළාත හැර අනෙක් පළාත් 05හි, එම පළාත්වලට අයත් රජයේ අනුමත පෞද්ගලික පාසල් අධීක්ෂණය සිදු කර නොමැති බව නිරීක්ෂණය විය. මෙහිදී නැගෙනහිර පළාතට අයත් රජයේ අනුමත පෞද්ගලික පාසල් කිසිවක් නොමැති බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් ශාඛාව මගින් සඳහන් කර ඇති අතර මධ්‍යම පළාත මේ සම්බන්ධයෙන් පිළිතුරු ලබා දී නොතිබුණි.

#### 3.2.3.5 කලාප කාර්යාල මගින් පාසල් අධීක්ෂණය

(අ) ප්‍රාදේශීය මට්ටමින් පාසල් අධීක්ෂණය සිදුකිරීමේ දී කලාප අධ්‍යාපන කාර්යාල මගින් සිදුකරන අධීක්ෂණය තුල සමීප අධීක්ෂණයක් සිදු කිරීමට ඉඩ ප්‍රස්ථා තිබුණ ද නියැදි පරීක්ෂාවට ලක් වූ කොළඹ කලාප කාර්යාලයට අයත් පාසල් 19 න් කිසිදු පාසලක් 2018 හා 2019 වර්ෂයන්හිදී අධීක්ෂණය කර නොතිබුණු අතර 2020 වර්ෂය සඳහා එක් පාසලක් පමණක් අධීක්ෂණයට ලක් කර තිබුණි.

(ආ) පාසල් අධීක්ෂණය සම්බන්ධයෙන්, තෝරා ගත් කලාප කාර්යයාල 08 කින් තොරතුරු කැඳවා සිටිය ද කොළඹ කලාපය හැර ජයවර්ධනපුර, පිළියන්දල, ගම්පහ, කැළණිය, මීගමුව, කළුතර, මහනුවර යන අනෙක් කිසිදු කලාප කාර්යයාලයක් විගණනයට පිළිතුරු ලබා දී නොතිබුණි.

### 3.2.4 රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධ දත්ත හා වාර්තා පවත්වාගෙන යාම

#### 3.2.4.1 පාසල් සම්බන්ධ මූලික තොරතුරු

රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධ කටයුතු පවත්වාගෙන යාම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයක් ස්ථාපිත කර ඇත. විගණනය විසින් එම අංශයෙන් ලද තොරතුරු අනුව පාසල් 11 ක ගුරු සංඛ්‍යා පිළිබඳ දත්තද එක පාසලක ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ දත්තද අඩංගු නොවීය. ඒ අනුව පාසල් සම්බන්ධ දත්ත පවත්වාගෙන යාමේ දුර්වලතා ඇති බව නිරීක්ෂණය විය. රටේ සමස්ත අධ්‍යාපන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත පදනම්ව තීරණ ගතයුතු අවස්ථාවලදී රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධ නිවැරදි තීරණ ගැනීමට මේ අනුව නොහැකි වනු ඇත.

**3.2.4.2රජයේ අනුමත පෞද්ගලික පාසල් ගාස්තු අය කිරීම**

(අ) රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් බොහොමයක් වාර්ෂිකව සිසුන් ඇතුලත් කිරීමේ කාලයන්හිදී අයදුම් පත්‍ර ගාස්තු ලෙස වැඩි මුදලක් අයකරමින් විශාල අයදුම් පත්‍ර ප්‍රමාණයක් අලෙවි කරන අතර, ඉන්පසු සීමිත සිසුන් පිරිසක් ඒ ඒ පාසල්වලට අභිමත නිර්ණායක අනුව බඳවා ගැනීමේදී ඉහල ඇතුළත් වීමේ ගාස්තු, පරිත්‍යාග, පාසල් ගාස්තු ආදිය විවිධ වට්නාකම්වලින් අයකරනු ලැබේ. ඒ අනුව එම අයකිරීම් සම්බන්ධ කිසිඳු නිර්ණායකයක් හා නියාමනයක් සිදු නොවන බැවින් අසාධාරණ ලෙස මුදල් අයකිරීම් සඳහා ඉඩ ප්‍රස්ථා ලැබී තිබුණි.

(ආ) මෙම පාසල්වල පවතින භෞතික හා මානව සම්පත් මෙන්ම ලබාදෙන සේවාවන් අනුව පාසල් ශ්‍රේණිගත කිරීමක් කොට ඒ අනුව අයකල යුතු උපරිම හා අවම ගාස්තු පරාසයන් පිළිබඳ සීමා පැනවීමක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සිදු කර නොතිබුණි. ඇතැම්විට අය කරනු ලබන මෙම ගාස්තු ප්‍රමාණයට සාපේක්ෂව ගුණාත්මක අධ්‍යයාපනයක් ළමුන්ට ලැබේ ද යන්න ගැටළු සහගත වන නමුත් ඒ පිළිබඳ පසු විපරම් කිරීමක් සිදු නොවන බැවින් හුදු ව්‍යාපාරික පරමාර්ථයෙන් වුවද මෙම ආයතන පවත්වාගෙන යාමට හැකියාව ලැබී තිබුණි.

(ඇ) 2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරන චක්‍රලේඛයේ ද ගාස්තු අයකිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබා දී නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය නීති රීති සකස් කර නොතිබුණි. ඒ අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගාස්තු අයකිරීමේ පදනම හා සාධාරණත්වය ආරක්ෂා කිරීම සඳහා කිසිඳු නියාමනයක් සිදු කිරීමට අදාල චක්‍රලේඛ මගින් ද ඉඩ ප්‍රස්ථා ලැබී නොතිබුණි.

(ඇ) 2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරන චක්‍රලේඛයේ (05) ඡේදයට අනුව සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සියලු ආකාරයේ ලැබීම් සහ ගෙවීම් අඩංගු ආදායම්, වියදම් පිළිබඳ වාර්තාවක් සෑම වර්ෂයක් සඳහාම පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතු වුවද කිසිඳු පාසලක් එම වාර්තා එවා නොතිබුණු අතර එම වාර්තා ගෙන්වා ගැනීමට ද කටයුතු කර නොතිබුණි. එසේම මේ සම්බන්ධව කොළඹ අධ්‍යාපන කලාපයෙන් කල විමසීමකදී ද අනාවරණය වූයේ එම කලාපයට අයත් පාසල් 19 න් කිසිඳු පාසලක් කලාප කාර්යාලය වෙත අදාල ආදායම් වාර්තා ඉදිරිපත් කර නොතිබුණු බවයි. එසේම එපරිදි ආදායම් වාර්තා නොඑවන පාසල් සම්බන්ධයෙන් ගනු ලබන පියවරයන් සඳහන් කර නොමැති වීම තුල එම අවශ්‍යතාවයෙන් මිදී කටයුතු කිරීමට රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට හැකියාව ලැබී තිබුණි.

**3.2.4.3විදේශීය විෂය මාලා ඉගැන්වීම**

1960 අංක 05 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (විශේෂ විධිවිධාන) පනතේ අංක 06 වගන්තිය ප්‍රකාරව රජයේ සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල් ද අධ්‍යාපනය ලබාදිය යුතු බව දක්වා ඇත. නමුත් පෞද්ගලික පාසල් අංශය විසින් සිදුකරන ලද අධීක්ෂණ වාර්තාවකට අනුව වෙනත් විදේශීය විෂය මාලා (Cambridge, Edexcel වැනි) ඉගැන්වීම් සිදු කෙරෙන එක් පාසලක් නිරීක්ෂණය කර තිබුණි. ඒ සම්බන්ධයෙන් විගණනය විසින් කල විමසීමට අනුව එලෙස වෙනත් විදේශීය විෂය මාලා ඉගැන්වීම් සිදු කෙරෙන පාසල් පිළිබඳ කිසිදු තොරතුරක් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය සතුව නොපැවතුණි.

**3.2.5 ශාඛා පාසල් ආරම්භ කිරීම**

2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරන චක්‍රලේඛයේ (ඉ)(i) හි රජය අනුමත ආධාර ලබන/ නොලබන විදුහල්වල ශාඛා පාසල් ආරම්භ කිරීම සපුරා තහනම් බව සඳහන් වුවද 2017 ඔක්තෝබර් 24 දිනැති අංක 40/2017 දරන චක්‍රලේඛයෙන් එම ඡේදය ඉවත් කර තිබුණි.

2018 වර්ෂය වන විට රජයේ අනුමත පෞද්ගලික පාසල් 08 ක ශාඛා පාසැල් 09ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අනුමැතියකින් තොරව ආරම්භ කර පවත්වා ගෙන ගොස් තිබුණි. පසුව එම ශාඛා පාසල් 09 සඳහා ඒ දක්වා ලබා ගෙන තිබූ ගුරු වැටුප් සඳහා අනුමැතිය ලබා ගැනීමටත්, ඉදිරියේදී එම ශාඛා පාසල්වලට ගුරු වැටුප්, අදාළ ගුරු සේවක සංඛ්‍යා ගණනයට අනුව ලබා දීමටත් කැබිනට් මණ්ඩලය වෙත යෝජනා ඉදිරිපත්කර තිබුණි. එහිදී 2018 මැයි 23 දිනැති අංක අමප/18/0850/742/017 දරන අමාත්‍ය මණ්ඩල තීරණය හා එයට යා කර ඇති නිරීක්ෂණවලට අනුව, ඉදිරියේ දී යම් පෞද්ගලික මව් පාසලක් විසින් දිවයිනේ යම් ස්ථානයක ශාඛා පාසලක් ආරම්භ කිරීමේදී එක් මව් පාසලක් සඳහා උපරිමය ශාඛා පාසල් 05ක් වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන නිර්ණායකවලට යටත්ව පූර්ව අනුමැතිය ලබා දීමට අනුමත කර තිබුණි. ඒ අනුව 2020 දෙසැම්බර් 31 දිනට මව් පාසල් 8 ක් විසින් ශාඛා පාසල් 10 ක් පවත්වා ගෙන යන බව නිරීක්ෂණය විය.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනුවත්භාවයකින් තොරව ශාඛා පාසල් පවත්වාගෙන ගොස් පසුව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අනුමැතියකින් තොරව පවත්වාගෙන ගොස් තිබූ මෙම ඇතැම් ශාඛා පාසල් වසර 20 කට පමණ පෙර සිට ආරම්භ කර ඇති බව සඳහන් කර තිබුණද, එම ශාඛා පාසල් සත්‍ය වශයෙන් ආරම්භක කල දිනය පිළිබඳ නිවැරදි තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. ඉන් ශාඛා පාසල් 05ක

නීතිගතභාවය ලද දිනය වන 2019 ජනවාරි 01 පාසල් නිල වශයෙන් ආරම්භ කළ දිනය ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සළකනු ලබන බව සඳහන් කර ඇත.

(ඇ) ඒ අනුව පූර්ව අනුමැතියකින් තොරව ආරම්භ කර තිබූ එම පාසල් 09 ම ආධාර ලබන පාසල් වන අතර මව් පාසලේ ගුරු සේවක මණ්ඩල ගණනයේදී ඒ සඳහා පදනම් කරගන්නා ශිෂ්‍ය සංඛ්‍යාවට ශාඛා පාසල්වල සිසුන් ද ඇතුළත් කර ගුරු කාර්යය මණ්ඩලය ගණනය කර, වසර 20 ක පමණ සිට මව් පාසල් හරහා ශාඛා පාසල්වල සේවය කරන ගුරුවරුන්ට ගුරු වැටුප් ආධාර ලබා ගෙන තිබුණි. ඒ අනුව එම කාලය තුල අදාල පාසල් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු වී නොතිබුණු බව ද නිරීක්ෂණය විය.

(ඈ) ශාඛා පාසල් ආරම්භ කිරීමට ලබා දී තිබූ කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව, ඉදිරියේදී යම් මව් පාසලක් විසින් දිවයිනේ යම් ස්ථානයක ශාඛා පාසලක් ආරම්භ කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන නිර්ණායකවලට යටත්ව පූර්ව අනුමැතිය ලබා දිය යුතු බවට අනුමැතිය ලබා දී තිබුණි. මෙම නිර්ණායක සකසා අධ්‍යාපන ලේකම්තුමාගේ අවධානයට යොමු කර ඇති බව අධ්‍යාපන අමාත්‍යාංශය සඳහන් කර තිබුණද, විගණන දිනය වන විටත් එලෙස අවශ්‍ය නිර්ණායක සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

### 3.2.6 අක්‍රීය පාසල් නැවත සක්‍රීය කිරීම

විස්තර පහත පරිදි විය.

(අ) රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් අදාල වන අංක 2005/31 හා 2005 ඔක්තෝබර් 31 දිනැති චක්‍රලේඛයේ (04)(ඇ), (ඉ)(viii) සහ (ix) අනුව විදුහලක් නව පරිශ්‍රයකට මාරු කරනු ලබන විටකදී හෝ අක්‍රීය තත්ත්වයට පත්ව තිබී පසුව සක්‍රීය තත්ත්වයට පත් කරන විටකදී හෝ පාසලක් පවත්වා ගන යන විටදී කටයුතු කල යුතු ආකාරය දක්වා ඇත.

එහෙත් එහි සඳහන් නිර්ණායක ප්‍රමාණවත් නොවන බැවින් පෞද්ගලික පාසල් අංශය මගින් අක්‍රීය පාසලක් නැවත සක්‍රීය කිරීමේදී ප්‍රායෝගිකව යම් යම් කරුණු සලකා බලන බව විගණනයට දන්වා ඇත. එමෙන්ම මෙම නිර්ණායක සකසා අධ්‍යාපන ලේකම්තුමාගේ අවධානයට යොමුකර ඇති බව සඳහන් කර තිබුණද, විගණනය වෙත ඉදිරිපත් කර තිබුණේ කෙටුම්පත් කරන ලද ලේඛනයක් පමණි.

(ආ) එලෙස 1961 න් පසුවද රජයේ අනුමත පෞද්ගලික පාසල් වශයෙන් පවත්වාගෙන ගොස් පසුව අක්‍රීය වූ පාසල් යළි සක්‍රීය කර ගන්නා ලද අවස්ථා නිරීක්ෂණය විය. 1986 සිට 2010 දක්වා එවැනි පාසල් 09 ක් නියැදි පරීක්ෂාවේ දී අනාවරණය විය.

### 3.2.7 රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අධ්‍යාපනික කටයුතු පවත්වාගෙන යාම

### 3.2.7.1 සිසුන් බඳවා ගැනීම

රජයේ අනුමත පෞද්ගලික පාසල් බොහොමයක් ආගම් කේන්ද්‍ර කරගත් ඒවා වන අතර යම් යම් ආගමික නිකායන්ගේ මැදිහත්වීම සෘජුවම හෝ වක්‍රාකාරයෙන් පාසල් පරිපාලනයට සම්බන්ධ වේ. එම පාසල් සඳහා සිසුන් බඳවා ගැනීමේදී ප්‍රධාන නිර්ණායකය බවට අදාල ආගමේ දරුවෙකු වීම බලපාන අතර අනෙකුත් නිර්ණායක පාසල් කළමනාකාරීත්වයේ අභිමතය අනුව වෙනස් වන අතර කිසිඳු විනිවිදභාවයකින් තොරව සිදු වේ. මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ කිසිඳු මැදිහත් වීමක් සිදු නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.2.7.2 කාලසටහන් අනුමත කර ගැනීම

අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් ශාඛාව මගින් රජයේ අනුමත පෞද්ගලික පාසල් නියාමනය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරන චක්‍රලේඛයේ අංක 4(අ) අධ්‍යාපන කටයුතු (i) දරන ඡේදය ප්‍රකාරව සෑම පාසලකම ඉගෙනුම්, ඉගැන්වීම්, ක්‍රියාවලිය විධිමත්ව ඉටුකිරීම සඳහා කාලසටහනක් පවත්වාගෙන යායුතු අතර, එකී කාලසටහන සෑම වසරක් සඳහාම ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ/ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ හෝ ඒ වෙනුවට කටයුතු කරන නිලධාරියෙකුගෙන් හෝ අනුමත කරගත යුතු ලෙස දක්වා ඇත. මේ සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් රජයේ අනුමත පෞද්ගලික පාසල් 19න් කාලසටහන් අනුමත කරවා ගෙන තිබුණේ 2019 වර්ෂය සඳහා එක් පාසලක් හා 2020 වර්ෂය සඳහා පාසල් 06ක් පමණි.

(ආ) අධ්‍යාපන අමාත්‍යාංශයේ නිළධාරීන් පිරිසක් 2015 ජූලි 21 දින කොළඹ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක සිදුකල අධීක්ෂණයේදී නිරීක්ෂණය වී ඇති පරිදි 2015 වර්ෂයේ කාලසටහන ප්‍රදර්ශනය කර නොතිබූ අතර අගරදගුරු නිවසින් පමණක් එය අනුමත කර ගත් බව අධීක්ෂණ කණ්ඩායමට දැන්වූ බව අදාල අධීක්ෂණ වාර්තාවේ දක්වා තිබුණි. ඒ අනුව කාලසටහන් මගින් ආවරණය විය යුතු කාලච්ඡේද හා විෂයයන්වල අන්තර්ගතය පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයට නියාමනයක් සිදු කිරීමට මෙම තත්ත්වය බාධාවක් වන බවත් අනිවාර්යය අධ්‍යාපනය ලබන සිසුන්ගේ ගුණාත්මක අධ්‍යාපන සංවර්ධන කටයුතු සඳහා එක් එක් ආගමික නිකායන්ට මැදිහත් වීමට ඇති හැකියාව තුළින් අනිවාර්යය අධ්‍යාපනය පිළිබඳ ළමුන්ට ඇති අයිතිය එමගින් උල්ලංඝනය වන බැවින් එම මැදිහත්වීම ගැටළු සහගත වුවද ඒ පිළිබඳ ප්‍රමාණවත් අවධානයක් යොමු වී නොතිබුණි.

(ඇ) 2015 මැයි 19 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් නිලධාරීන් 05 දෙනෙකු නුගේගොඩ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක සිදු කරන ලද අධීක්ෂණ කාර්යයට අදාළ වාර්තාවේද දක්වා ඇත්තේ පාසල් කාලසටහන කලාප අධ්‍යාපන කාර්යාලයෙන් අනුමත කරගෙන නොතිබූ බවයි.

**3.2.7.3 රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සිසුන් උසස් පෙළ විෂය ධාරාවන් තෝරාගැනීම**

වර්තමානය වන විට දිවයින පුරා ක්‍රියාත්මක වන රජයේ අනුමත පෞද්ගලික පාසල් 80 හි හා ඒවායේ ශාඛා පාසල් 10 හි උසස් පෙළ විෂය ධාරාවන් ඉගැන්වීම සිදුකරන ආකාරය අනුව විද්‍යා/ ගණිත විෂය ධාරාවන් උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව 53ක් බවත්, වාණිජ හා කලා විෂය ධාරාවන් උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව පිළිවෙලින් 66ක් හා 68ක් ද, තාක්ෂණවේදය උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව 09ක් බව ද නිරීක්ෂණය වූ අතර මෙම විෂය ධාරාවන් 4ම උගන්වන්නේ පාසල් 07 ක පමණක් බවත් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි විය.

| විෂය ධාරාව | උගන්වන පාසල් සංඛ්‍යාව |
|---|---|
| විද්‍යා/ ගණිතය | 53 |
| වාණිජ | 66 |
| කලා | 68 |
| තාක්ෂණවේදය | 09 |

වර්තමාන රැකියා වෙළඳපලට ගැලපෙන ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ පරමාර්ථයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති තාක්ෂණවේදය වැනි විෂය ධාරාවන් ක්‍රියාත්මක වන්නේ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් සියයට 10ක් වැනි අඩු ප්‍රමාණයක් විය.

**3.2.7.4 විභාග කටයුතු**

රජයේ අනුමත පෞද්ගලික පාසල්වල 2018 හා 2019 වර්ෂයන්හි අ.පො.ස.(සා.පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අ.පො.ස.(උ.පෙළ) විභාග ප්‍රතිඵල**

රජයේ අනුමත පෞද්ගලික පාසල් 80 න් හා ඒවායේ ශාඛා පාසල් 10 න් 2018 හා 2019 වර්ෂයන්හිදී අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලට අනුව සමත්වීමේ ප්‍රතිශතය 2018 හා 2019 නව විෂය නිර්දේශය යටතේ සාමාන්‍යය සියයට 67 ක් වූ අතර 2019 පැරණි විෂය නිර්දේශය යටතේ සාමාන්‍යය සියයට 72ක් විය. විස්තර පහත පරිදි විය.

| වර්ෂය | පාසල් සංඛ්‍යාව | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය (සියයට) | සමත් ප්‍රතිශතය සියයට 50ට අඩු | |
|---|---|---|---|---|---|---|
| | | | | | පාසල් සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
| 2018 | 61 | 8,449 | 5,690 | 67 | 17 | 385 |
| 2019- නව විෂය නිර්දේශය | 70 | 7,495 | 5,034 | 67 | 20 | 375 |
| 2019- පැරණි විෂය නිර්දේශය | 55 | 1,624 | 1,183 | 72 | 08 | 32 |

**(මූලාශ්‍රය:-ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව)**

**(ආ) අ.පො.ස.(සා.පෙළ) විභාග ප්‍රතිඵල**

රජයේ අනුමත පෞද්ගලික පාසල් 90න් 2018 හා 2019 වර්ෂයන්හිදී අ.පො.ස.(සා.පෙළ) විභාගයේ ප්‍රතිඵලවලට අනුව සමත්වීම 2018 දී සාමාන්‍යය සියයට 75ක් වූ අතර 2019 දී සාමාන්‍යය සියයට 70ක් විය. විස්තර පහත පරිදි විය.

| වර්ෂය | පාසල් සංඛ්‍යාව | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය (සියයට) | සමත් ප්‍රතිශතය සියයට 50ට අඩු | |
|---|---|---|---|---|---|---|
| | | | | | පාසල් සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
| 2018 | 75 | 11,027 | 8,194 | 74.71 | 15 | 192 |
| 2019 | 83 | 11,975 | 8,387 | 70.04 | 14 | 318 |

**(මූලාශ්‍රය:-ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව)**

(ඇ) මේ අනුව විභාගයන් සඳහා පෙනී සිටි සිසුන්ගෙන් සමත්වීම සියයට 50 කට අඩු පාසල් පිළිබඳ විශේෂ අවධානයක් යොමුකල යුතු වුවද එවැනි තත්ත්වයක් විගණනයේදී නිරීක්ෂණය නොවීය.

### 3.2.7.5 අධ්‍යාපනික කටයුතු සම්බන්ධ දෙමාපිය පැමිණිලි

මෙම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ඉගෙනුම ලබන සිසුන් විසින් මුහුණ දෙනු ලබන විවිධ ගැටළු සම්බන්ධයෙන් වරින් වර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත මහජන නියෝජනයන් ඉදිරිපත් වී තිබූ අතර නියැදි විගණන පරීක්ෂාවේදී පාසල් 07කට අදාලව චක්‍රලේඛ අනුව අවස්ථාව තිබියදී වුවද උසස් පෙළ පන්ති සඳහා සිසුන් පාසලට ඇතුලත් කර නොගැනීම, විෂයයන් ඉගැන්වීම් නිසි පරිදි සිදු නොකිරීම, විභාග අක්‍රමිකතා, කුඩා පංතිවල දරුවන්ට සිදුවන හිංසනයන්, දරුවන්ගේ ශිෂ්‍යභාවය අහෝසි කිරීම වැනි කරුණු සම්බන්ධයෙන් අනාවරණය වූ එවැනි මහජන නියෝජනයන් විය. මෙම අවස්ථාවන්වලදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් උපදෙස් ලිපියක් පමණක් නිකුත් කර තිබුණි. එමෙන්ම එවැනි අවස්ථාවන්වල දී රජයේ අනුමත පෞද්ගලික පාසල් වශයෙන් එම පාසල් රජයේ චක්‍රලේඛ අනුගමනය කිරීමෙන් බැහැර වී ඇති බවද තවදුරටත් නිරීක්ෂණය කරනු ලැබේ.

### 3.2.8 රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සෞඛ්‍ය කටයුතු පවත්වාගෙන යාම

මෙම වාර්තාවේ සඳහන් පාසල්වල සෞඛ්‍ය වැඩසටහන් නියාමනය සම්බන්ධව අදහස් දැක්වූ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අංක MH/FCC/02/AR-School Health/2020 දරන හා 2021 අගෝස්තු 20 දිනැති ලිපියේ ප්‍රකාරව පෞද්ගලික පාසල්වල දරුවන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් එම පාසල් දක්වා ඇති අවධානයද අඩු වන බව තහවුරු වන බැවින් අදාළ සෞඛ්‍ය සේවා සැපයීමට එම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් හෝ පාසල් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් හෝ සිදු කරන ලද ඉල්ලීම් අදාළ පෞද්ගලික පාසල් විසින් ලිඛිතව ප්‍රතික්ෂේප කර ඇති බවත් මෙම පාසල් ද පෞද්ගලික ව්‍යාපාර ලෙස ලියාපදිංචි වී ඇති බැවින් එම පාසල්වලට සේවා ලබා ගැනීමට බලපෑම් කිරීමේ හැකියාවක් හෝ නීතිමය ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශය සතුව නොමැති බවත් දක්වා ඇත.

මේ අනුව විගණිත දින වන විටත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සියළු රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට සෞඛ්‍ය සේවා සැපයීමට, නිරීක්ෂණය හා නියාමනය කිරීමට හැකි වන පරිදි බලතල සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දී නොතිබීම හේතුවෙන් එම පාසල්වල සිසුන්ගේ සෞඛ්‍ය තත්ත්වය අවදානමකට ලක්වීමට ඉඩකඩ සැලසී තිබුණි.

### 3.2.9 ගුරුවරුන් බඳවා ගැනීම

රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සිදු කරන්නේ අදාළ පාසලේ කළමනාකාරීත්වය විසිනි. මෙසේ පාසල් කළමනාකාරීත්වයෙන් බඳවා ගන්නා ගුරුවරුන් සඳහා රජයේ අනුමත පත්වීමක් ලබා දීමට කළමනාකාරිත්වය තීරණය කරන්නේ නම් පත්වීම් යෝජනා පත්‍රයක් කලාප/ පළාත් අධ්‍යාපන අධිකාරියේ නිර්දේශ සහිතව අධ්‍යාපන අමාතයාංශයට ඉදිරිපත් කර අනුමත කර ගනී. ඒ අනුව එම ගුරුවරයා දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට හිමිකම් ලබයි.

#### 3.2.9.1 ගුරුවරුන් බඳවා ගැනීමට අදාල සුදුසුකම්

**(අ) 1983 උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා නියෝග**

මේ අනුව සියළුම උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා ඒවායේ ගුරුවරුන්ගේ සුදුසුකම්, පත්වීම් සහ පුහුණුවීමේ කාලපරිච්ඡේද සම්බන්ධයෙන් පහත දැක්වෙන නියමයන් පිළිපැදිය යුතු බව දක්වා ඇත. 1983 න් පසු පත්කරන සියලුම ගුරුවරුන්ට යටත් පිරිසෙයින් පහත දැක්වෙන සුදුසුකම්වලින් එකක්වත් තිබිය යතුය.

(i) විශ්වවිද්‍යාල උපාධිය

(ii) පුහුණු ගුරු සහතිකය

(iii) සංගීතය, නැටුම්, චිත්‍ර, කෘෂිකර්මය, ගෘහවිද්‍යාව, තාක්ෂණික විෂයයන් සහ කලින්කල නිවේදනය කරනු ලබන වෙනත් යම් විෂයයන් පිළිබඳ ඩිප්ලෝමා සහතිකය.

(iv) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය (මෙම ගුරුවරුන් සේවයට බැඳී අවුරුදු දහයක් ඇතුලත පුහුණු ගුරු සහතිකය ලබාගත යුතුය)

**(ආ) 2014 ඔක්තෝබර් 23 දිනැති අංක 1885/38 දරන ගුරු සේවා ව්‍යවස්ථාව**

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2015 මැයි 27 දිනැති අංක ED/01/10/01/01/16/135 දරන ලිපිය මගින් අංක 35/2014(1) දරන ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාව රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුභවතුන් සඳහා අදාල වන බව දක්වා ඇත.

| **ශ්‍රේණිය** | **අධ්‍යාපන සුදුසුකම්** |
|---|---|
| 3 පන්තිය-II ශ්‍රේණිය | අ.පො.ස (උ.පෙළ) සුදුසුකම් ලැබූවන් |
| 3 පන්තිය - I(ඇ) ශ්‍රේණිය | ඩිප්ලෝමාධාරීන් |
| 3 පන්තිය- I(ආ) ශ්‍රේණිය | ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරීන් |
| 3 පන්තිය I-(අ) ශ්‍රේණිය | උපාධිධාරීන් |
| 2 පන්තිය-II ශ්‍රේණිය | අධ්‍යාපනවේදී උපාධිධාරීන් |

ඒ අනුව උපකෘත පාඨශාලා පනත යටතේ පාලනය වන රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳ විගණන පරීක්ෂාවේදී අනාවරණයවූ පරිදි 1983 උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා නියෝගවල හා ගුරු ව්‍යවස්ථාවේ අ.පො.ස(උ.පෙළ) සමත්වූවන් ද ගුරු සේවය සඳහා බඳවා ගත හැකි ලෙස දක්වා ඇත. එහෙත් රජයේ පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීමේදී උපාධිධාරීන් හා විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන් බඳවා ගන්නා නමුත් 2019 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 තෙක් රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කල ගුරු පත්වීම් ලිපි පරීක්ෂාවේදී අනාවරණය වූයේ පාසල් 61ක් සඳහා බඳවාගත් ගුරුවරුන් 1025 දෙනෙකුගෙන් ගුරුවරුන් 461 දෙනෙකු පමණක් උපාධිධාරීන් වන අතර 564 දෙනෙකු උපාධිධාරීන් නොවන බවයි.

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ.පෙළ) විභාගයෙන් විෂයයන් තුනකින් සාමාර්ථය ලබාගත් අයවලුන් ගුරුවරුන් ලෙස සේවයට බැඳී අවුරුදු දහයක් ඇතුලත පුහුණු ගුරු සහතිකය ලබාගත යුතුය යන්න 1983 උපකෘත පාඨශාලා සහ ආධාර නොලබන පාඨශාලා නියෝගවල සඳහන් වේ. ඒ අනුව එම අවශ්‍යතාවය සම්පූර්ණ වන්නේ ද යන්න පිළිබඳ පසුවිපරමක් සිදුවන බව විගණනයේදී අනාවරණය නොවීය.

**3.2.9.2නව ගුරුවරුන් බඳවා ගැනීම**

(අ) නව ගුරුවරුන් බඳවා ගැනීමට පෙර යෝජනාපත්‍ර නිර්දේශ කර අනුමත කරගන්නේ ද යන්න කල විමසීමේදී, කොළඹ අධ්‍යාපන කලාපයට අදාළව ගුරුවරුන් බඳවා ගැනීමට පෙර යෝජනා පත්‍ර අනුමත කර නොගන්නා බවත්, පාසල විසින් ගුරුවරුන් බඳවා ගැනීමෙන් පසුව යෝජනා පත්‍ර නිර්දේශය සඳහා ඉදිරිපත් කරන බවත් දන්වා ඇත.

(ආ) එමෙන්ම අදාල යෝජනා පත්‍ර සඳහා නිර්දේශ ලබා දීමේ දී ගුරුවරයාගේ සුදුසුකම් සනාථකර නොගන්නා බවත්, පෞද්ගලික පාසල් අධ්‍යක්ෂ විසින් යෝජනා පත්‍ර අනුමත කර එවූ පසු පත්වීම් ලිපිය නිකුත් කරන අතර ලියාපදිංචි අංකය නිකුත් කිරීමට පෙර ගුරුවරයාගේ සුදුසුකම් සනාථ කරගනු ලබන බවත් විගණනය වෙත දන්වා ඇත.

**3.2.9.3ගුරු පත්වීම් අනුමත කිරීම සම්බන්ධ ගැටළු**

**(අ)** රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරුවරුන් බඳවා ගැනීම පිළිබඳ විගණන පරීක්ෂාවේදී පාසලෙන් පත්වීම ලබා දුන් දිනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එම පත්වීම වලංගු කල දිනය අතර දිගු කාලීන පරස්පරතා පවතින බව නිරීක්ෂණය විය. ඒ අනුව පාසල් 61 ක 2019 ජනවාරි 01 සිට 2020 දෙසැම්බර් 31 දක්වා ගුරු පත්වීම් 1025 ක් සඳහා අනුමැතිය ලබා දී තිබූ අතර පාසලෙන් පත්වීම ලබා දුන් දිනය හා අධ්‍යාපන අමාත්‍යාංශය එම පත්වීම වලංගු කල දිනය අතර වර්ෂ 01ට අඩු කාල පරාසයක් සහිත පත්වීම් 615ක් ද, වර්ෂ 1-3 අතර පත්වීම් 240ක්ද, වර්ෂ 4-6 අතර පත්වීම් 123ක්ද, වර්ෂ 7-9 අතර පත්වීම් 42ක්ද, වර්ෂ 10-12 අතර පත්වීම් 4ක් සහ වර්ෂ 13-15 අතර පත්වීම් 01ක්ද ලෙස කාල පරාසයන් පවතී. ඒ අනුව ගුරුවරුන්ගේ පත්වීම් අනුමත කිරීම සම්බන්ධව විධිමත් නියාමනයක් සිදු නොවීම හේතුවෙන් මෙවැනි ප්‍රමාදයක් සිදුවන බවත් මේ හේතුවෙන් ගුරුවරුන්ගේ රැකියා අභිප්‍රේරණය සම්බන්ධ ගැටළු හා දායක විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධ ගැටළු පැනනැඟිය හැකි බව විගණනයේ දී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| පාසල් සංඛ්‍යාව | 2019.01.01සිට 2020.12.31 තෙක් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් අනුමත කල ගුරු පත්වීම් සංඛ්‍යාව | පාසලෙන් පත්වීම ලබා දුන් දිනය හා අධ්‍යාපන අමාත්‍යාංශය පත්වීම වලංගු කල දිනය අතර වෙනස්කම් පවතින ගුරු පත්වීම් සංඛ්‍යාව | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂ 1ට අඩු | වර්ෂ 1-3 අතර | වර්ෂ 4-6 අතර | වර්ෂ 7-9 අතර | වර්ෂ 10-12 අතර | වර්ෂ 13-15 අතර |
| 61 | 1025 | 615 | 240 | 123 | 42 | 4 | 1 |

**(ආ) හිඟ වැටුප් ගෙවීම**

ඉහත පරිදි පසු දාතම් කර බඳවා ගත් ගුරුවරුන් සඳහා හිඟ වැටුප් ගෙවීම් පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලයේ රජයේ අනුමත පෞද්ගලික පාසල් 08ක 2011-2019 කාලපරිච්ඡේදයට අදාලව බඳවාගත් ගුරුවරුන් 68 ක් සඳහා හිඟ ගුරු වැටුප් ලෙස රු.29,924,374 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

**3.2.9.4 ගුරු සංඛ්‍යා අනුමත කර ගැනීම**

අංක 2005/31 හා 2005 ඔක්තෝබර් 31 දිනැති චක්‍රලේඛය මගින් රජයේ අනුමත ආධාර ලබන/ නොලබන පාසල්වල අධ්‍යාපනික කටයුතු හා ආයතනික කටයුතු ක්‍රියාත්මක විය යුතු ආකාරය දැක්වේ. ඒ අනුව මෙම චක්‍රලේඛයෙහි අංක 04(ආ)(iv) අනුව සෑම වසරක් සඳහාම අදාළ චක්‍රලේඛවලට අනුකූලවන පරිදි පාසලට හිමි ගුරු සංඛ්‍යාව සහ විශේෂ තනතුරුධාරීන් සංඛ්‍යාව, පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් අනුමත කරගත යුතු බව දැක්වේ.

නියැදි පරීක්ෂාවට අනුව කොළඹ කලාප කාර්යාලයට අයත් පාසල් 19න් පාසල් 05ක් 2021අප්‍රේල් 30 දින වන විටත් ගුරු සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා නිර්දේශයට ඉදිරිපත් කර නොතිබුණු අතර, එයින් එක් පාසලක් 2017 වර්ෂයේ සිටම එලෙස ගුරු සංඛ්‍යාව අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබූ බව අනාවරණය වුවද අදාල චක්‍රලේඛ අනුව කටයුතු නොකරන ලද පාසල් සම්බන්ධව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එමෙන්ම එවැනි අවස්ථාවලදී ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව අදාල චක්‍රලේඛවල ද පැහැදිලි ප්‍රතිපාදන නොවීය.

**3.2.9.5 ගුරු පත්වීම් අනුමත කිරීම, සංශෝධනය කිරීම හා අනෙකුත් කරුණු**

රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට අදාල ලිපිගොනු පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) අඛණ්ඩ සේවා කාලයක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය**

නියැදි පරීක්ෂාවේ දී අනාවරණය වූ රජයේ අනුමත පෞද්ගලික පාසලක ගුරුභවතෙකු මොරටුව පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක (ගුරු සේවයේ 3-I) 2005 සිට 2009 තෙක් වසර 4 ක සේවා කාලයකින් පසු 2009 ජනවාරි 08 දින සිට 2010 ජනවාරි 07 දින දක්වා විදේශ ගත වී සිටි බවත්, 2010 ජනවාරි 08 දින සිට ඉල්ලා අස්වී ඇති බව දක්වා ඇත. නැවත බොරැල්ල පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක (ගුරු සේවයේ 3-I) 2011 ජුනි මස දින 02ක් (ජුනි 28/29) පමණක් සේවය කර ඇති බව දක්වා ඇති අතර 2011 ජුනි 30 දින ඉල්ලා අස්වී ඇත. 2014 ජූලි 15 සිට 2015 මාර්තු 15 තෙක් මොරටුව පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක (ගුරු සේවයේ 3-II) සේවය කිරීම හා මාස 08කින් පසු 2015 මාර්තු16 සිට නැවත කළුතර

පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක 3-II ශ්‍රේණියේ ගුරුවරයකු ලෙස ගුරු පත්වීම අනුමත කර තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ 2014 නොවැම්බර් 03 දිනැති ලිපිය අනුව 2014 ජූලි 15 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත මොරටුව පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක 3-II ශ්‍රේණියේ ගුරුවරයකු ලෙස ගුරු පත්වීම අනුමත කර තිබූ අතර මෙසේ වරින් වර සේවා බණ්ඩනයක් සහිත පුද්ගලයකු සඳහා ගුරු පත්වීම අනුමත කර තිබීම විගණනයේදී ගැටළු සහගත විය.

**(ආ) පත්වීම් දිනය හා පත්වීම අනුමත කළ දිනය අතර වෙනස්කම් පැවතීම**

(i) යාපනය පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලකට 2011 අප්‍රේල් 26 දින සිට පත්කර තිබූ ගුරු මහත්මියකගේ අධ්‍යාපන සුදුසුකම් ලෙස උසස් පෙළ සමත් බවය දක්වා තිබුණි. එම පාසලේ විදුහල්පති විසින් 2019 අප්‍රේල් 01 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂ ඇමතූ ලිපියෙන් ඇයගේ පත්වීම 2019 ජනවාරි 01 දින සිට අනුමත කරන ලෙස දක්වා තිබුණි. ඒ අනුව නිරීක්ෂණය වන්නේ අදාළ ඉල්ලීම කර තිබුණේ බඳවා ගැනීම සිදුකර වර්ෂ 7½ කට පසුව බවය. අධ්‍යාපන අමාත්‍යාංශයෙන් මෙම පත්වීම අනුමත කර තිබුණේ 2019 ජූනි 03 දින සිට වලංගු වන පරිදි 2019 අගෝස්තු 26 දිනදීය. ඒ අනුව මෙම ගුරුවරිය බඳවා ගෙන වර්ෂ 08 කට පසු අදාළ පත්වීම අනුමත කර ඇත.

(ii) මෙම පාසලේ තවත් ගුරුවරයකු 1980 සැප්තැම්බර් 08 දින සිට ක්‍රියාත්මක වන පරිදි අනුමත පත්වීම්ලාභී ගුරුවරයකු ලෙස සේවයකර ඇති අතර එම ගුරුවරයාගේ පුහුණු සහතිකය වලංගු වන 1990 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මකවන පරිදි පත්වීම් අනුමත කර ඇත. නැවත 2005 ඔක්තෝබර් 28 දිනැති අංක ED/01/10/01/02/06 දරන අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජ්‍ය පාසල් අධ්‍යක්ෂකගේ ලිපියක් මගින් මෙම පත්වීම් දිනය 1980 සැප්තැම්බර් 08 දින බව දක්වා ඇත. ඒ අනුව වරින් වර මෙම පත්වීම් දින වෙනස් කිරීම ගැටළු සහගත විය.

(iii) කොළඹ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක ගුරුවරියක් රජයේ අනුමත පෞද්ගලික පාසල් කිහිපයක සේවය කර තිබුණි. 2001 ජනවාරි 02 දින සිට 2006 දෙසැම්බර් 31 තෙක් පිළියන්දල පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලකද 2007 මාර්තු 27 දින සිට 2015 දෙසැම්බර් 31 තෙක් කොළඹ පිහිටි වෙනත් රජයේ අනුමත පෞද්ගලික පාසලකද 2018 පෙබරවාරි 05 දින සිට නැවත එම පාසලේමද වශයෙන් සේවය කර තිබුණි.

නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂකගේ 2019 මැයි 30 දිනැති හා අංක ED/01/10/01/03/07(x) දරණ ලිපිය ප්‍රකාරව 2018 පෙබරවාරි 05 දින සිට මුලින් දැක්වූ විද්‍යාලයට ලබාදී ඇති පත්වීම 2017 ජුනි 01 දින සිට පසුදාතම් කිරීම සිදු කර ඇති බව නිරීක්ෂණය වේ.

**(ඇ) පත්වීම් සංශෝධනය කිරීම**

ගල්කිස්ස පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක සේවය කරන ගුරු මහත්මියකට අදාළ පත්වීම් ලිපිය ප්‍රදානයේදී ඇයගේ අධ්‍යාපන සුදුසුකම් ලෙස කලා උපාධිය (2008) ලෙස දක්වා ඇති අතර, ඒ අනුව 2009 ජනවාරි 01 දින සිට අදාළ වන පරිදි 3-I ශ්‍රේණියේ ගුරුවරියක ලෙස පත්වීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත්තේ 2014 ඔක්තෝබර් 20 දිනදීය.

නමුත්, ප්‍රතිඵල සනාථ කිරීමේ ලිපියට අනුව උපාධි සහතිකය වංලගු වන්නේ 2010 ජනවාරි 01 දින සිට බව සඳහන් කර ඇත. ඒ අනුව උපාධිය වලංගු දිනය අනුව 3-I ශ්‍රේණියේ පත්වීම් දිනය සංශෝධනය විය යුතු බැවින් 2009 ජනවාරි 01 දින සිට 2009 දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදය 3–II ශ්‍රේණියේ ගුරු පත්වීමක් ලෙස සලකන උපාධි සහතිකය වලංගු වන දිනය වන 2010 ජනවාරි 01 දින සිට 3-I ශ්‍රේණියට පත් කිරීමට පිළියන්දල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා 2017 නොවැම්බර් 06 දින අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2017 නොවැම්බර් මස දින රහිත අංක ED/01/03/02/10(v) දරන ලිපිය මගින් අදාළ ඉල්ලීම අනුමත කර තිබුණි. ඒ අනුව අදාළ සුදුසුකම් නිවැරදිව සනාථ කර ගැනීමකින් තොරව පත්වීම් ලිපි ප්‍රදානය කර ඇති බව නිරීක්ෂණය විය.

**(ඈ) වැටුප් රහිත එතෙර නිවාඩු අනුමත කිරීම් සම්බන්ධ ගැටළු**

කළුතර පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක ගුරුභවතකු ලෙස සේවය කල පියතුමකු ධර්ම ප්‍රචාරණ කටයුතු සඳහා 2018 අගෝස්තු 23 දින සිට 2020 අගෝස්තු 22 දින දක්වා විදේශගතවීමට වැටුප් රහිත නිවාඩු අයදුම් කර ඇත. මෙම නිවාඩු ලබා ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 ජූලි 30 දින අනුමත කර ඇත.

මෙම විදේශ නිවාඩු ලබාගැනීමට අදාළ අයදුම්පත්‍රය අදාළ ගුරුවරයා විසින් 2018 අගෝස්තු 20 දින ඉදිරිපත් කර ඇති අතර, කළුතර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් එය නිර්දේශ කර තිබුණේ 2019 අප්‍රේල් 24 දිනදීය. පසුව එය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කර තිබුණේ 2019 ජූලි 30 දිනදීය. එනම් අදාළ ගුරුවරයා විදේශගත වී වසරකට ආසන්න කාලයක් පසුවිය.

මේ සම්බන්ධව ජාතික හා අගරදගුරු පදවි අධ්‍යාපන අධ්‍යක්ෂ පියතුමා විසින් 2019 මාර්තු 18 දින දක්වා ඇත්තේ අදාළ ගුරුවරයා මෙම විදේශ නිවාඩු අයදුම්පත්‍රය කලට වේලාවට ඉදිරිපත් කල ද අගරදගුරු නිවසේ කතෝලික පාසල් අංශයෙන් ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති බවකි.

**(ඉ) පංති සඳහා ගුරුවරුන් අනුයුක්ත කිරීම**

නියැදි පරීක්ෂාවට ලක්වූ නුගේගොඩ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක 1 වන ශ්‍රේණියට බඳවා ගත් සිසුවියන්, 2 වන ශ්‍රේණියට සමත් කිරීමේදී සියලු පන්තිවල දරුවන් මිශ්‍ර කර ඔවුන්ගේ පන්තිභාර ගුරුතුමියන්ද වෙනස් කර ඇති බව 2019 පෙබරවාරි 01 දින දෙමාපියකු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැමිණිලි කර තිබුණි. අධ්‍යාපන අමාත්‍යාංශයේ 1998 නොවැම්බර් 23 දිනැති 1998/44 අංක දරන චක්‍රලේඛය ප්‍රකාරව මෙම ක්‍රියාවලිය දෝෂසහගත බැවින් 2012 මැයි 08 දිනැති හා 2012/13 දරන චක්‍රලේඛය අනුව මෙම ක්‍රියාවලිය නොකළ යුතු කාර්යයක් බව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 පෙබරවාරි 28 දින අදාළ පාසලේ විදුහල්පති වෙත දන්වා ඇත.

**(ඊ) දැනුම් දීමකින් තොරව සේවය අත්හිටුවීම**

නියැදි පරීක්ෂාවට ලක් වූ කොළඹ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක අනුමත ගුරුවරයෙක්හට 2020 පෙබරවාරි 20 දින චෝදනා පත්‍රයක් ඉදිරිපත් කර චෝදනා සම්බන්ධයෙන් කිසිඳු විනය පරීක්ෂණයක් නොපවත්වා සේවය අත්හිටුවා ඇති බවට පැමිණිලි කර තිබුණි.

### 3.2.10 ගුරුවරුන්ගේ විනය

රජයේ අනුමත පෞද්ගලික පාසල්වල සේවය කරන ගුරුවරුන්ගේ පත්වීම් හා විනය බලධාරියා පාසල් කළමණාකරු බව දක්වමින් මෙම පාසල්වල ගුරුවරුන් සම්බන්ධ විනය කරුණුවලදී පාසල් කළමණාකාරීත්වය විසින් පවත්වන විනය පරීක්ෂණයකින් පසු අදාල ගුරුභවතා නැවත සේවයේ පිහිටුවීම හෝ පහකිරීම පිළිබඳ ගන්නා තීරණයට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමැතිය පමණක් ලබාදෙන බව විගණනයේදි නිරීක්ෂණය විය.

ඒ අනුව අදාල විනය පරීක්ෂණය සඳහා කොට්ඨාශ අධ්‍යාපන /කලාප අධ්‍යාපන /පළාත් අධ්‍යාපන හෝ අධ්‍යාපන අමාත්‍යාංශය මට්ටමින් කිසිඳු නිලධාරියෙකු සහභාගී නොවීම හේතුවෙන් අගතියට පත්වූ පාර්ශවයට අපක්ෂපාතී තීරණයකින් සාධාරණ විසඳුමක් ලැබීමේ අවිනිශ්චිතතාවය විගණනයේදී නිරීක්ෂණය විය.

නියැඳි ලිපිගොනු පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි නුගේගොඩ පිහිටි රජයේ අනුමත පෞද්ගලික පාසලක ගුරුවරයකු ළමා අපචාර චෝදනාවන් සම්බන්ධව බලගතු චෝදනා ලබා ඇති බවත්, ඒ පිළිබඳව ළමාරක්ෂක සේවා අධිකාරියට පැමිණිල්ලක් සිදුකර ඇති බවත් පාසලේ කළමණාකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත 2018 අගෝස්තු 03 දින වාර්තා කර තිබුණි.

මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2018 අගෝස්තු 20 දින අදාල පාසලේ කළමණාකරු වෙත දන්වා ඇත්තේ ළමාරක්ෂක සේවා අධිකාරියට පැමිණිල්ලක් සිදුකර ඇත්තේ දරුවෙකු සම්බන්ධ ළමා අපචාර චෝදනාවකට නම් එය සාපරාධී වරදක් වන නිසා අදාල ගුරු භවතාගේ වැඩ තහනම් කිරීම කල යුතු බවත්, විධිමත් විනය පරීක්ෂණයකින් පසු අදාල ගුරුභවතා නැවත සේවයේ පිහිටුවීම හෝ පහකිරීම අධ්‍යාපන බලධාරීන්ගේ අනුමැතිය ලබාගෙන සිදුකල යුතු බවත්ය.

මෙම ගුරුවරයා පිළිබඳව එම පාසලේ විදුහල්පති විසින් 2018 සැප්තැම්බර් 29 දින අදාල ආගමික නිකායේ සාමාන්‍යාධිකාරී ප්‍රධාන පියතුමා වෙත ලිඛිතව දක්වා ඇත්තේ අදාල ගුරුවරයා මෙම පාසලට කිසිදු දිනක ගුරුවරයකු ලෙස නැවත නොඑවන ලෙසත්,වෙනත් කුමන හෝ වයසක දරුවන් සිටින පාසලකට ගුරුවරයකු ලෙස නොයවන ලෙසත්ය.

නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂ ගේ 2019 ජූනි 19 දිනැති හා අංක ED/03/10/06/05(I) දරන ලිපිය මෙන්ම 2020 මාර්තු 12 දිනැති හා ED/03/10/06/05(II) මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අමතා දන්වා ඇත්තේ මෙම ගුරුවරයා පිළිබඳව පාසල් කලමණාකරු විසින් සිදුකරන ලද විධිමත් විනය පරීක්ෂණය අනුව මෙම ගුරුවරයා ට එල්ල වී ඇති චෝදනා වලින් නිදොස් කොට නිදහස් කර ඇති බැවින් ඔහු නැවත සේවයේ පිහිටවීම අනුමත කරන බවත්ය.

ඉහත දක්වන ලද ඡේද අනුව රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් පොදුවේ නිරීක්ෂණය වන්නේ, මෙම පාසල් නියාමනය සඳහා ලබාදී ඇති සීමිත ප්‍රතිපාදන යටතේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ අදාළ ඒකකය මගින් ඉටුවිය යුතු කාර්යය දිගින් දිගටම මගහැරී ඇති බව හා ප්‍රමාද වන බවයි. එමගින් එම පාසල් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධීක්ෂණයෙන් තවදුරටත් ගිලිහී යාමට ඉඩ ප්‍රස්ථා උදා වී තිබුණි.

එමෙන්ම රජය මගින් නියාමනය වන රජයේ අනුමත පෞද්ගලික පාසල් ද අධ්යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ හා උපදෙස්වලට අනුගතව කටයුතු නොකරන බව ද, එලෙස අනුගත වීමට එම පාසල් නෛතික වශයෙන් වන බැඳීමෙන් මිදී ඇති බවත්ය.

### 3.3 ජාත්‍යන්තර පාසල්

මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ පදිංචි වී සිටින විදේශීය ප්‍රජාවගේ දරුවන්ගේ අධ්‍යාපනය ඉලක්ක කොට ගත් ජාත්‍යන්තර පාසල් 1980 දශකයේදී පමණ ආරම්භවී ඇත. වර්තමානය වන විට මෙම පාසල් විදේශීය ප්‍රජාවට පමණක් සීමා නොවන අතර ඉහළ පන්ති ගාස්තු අයකෙරෙන බැවින් ගෙවීමේ හැකියාව හා කැමැත්ත ඇති ඕනෑම අයෙකුට මෙම පාසල්වලට ඇතුලත්විය හැකිය. විවිධ ආගමික, දේශපාලනික හා සමාජ කරුණු අනුව විෂම ආකාරයට විහිදී ගිය ශ්‍රී ලාංකික පාසල් පද්ධතිය තුල රජයට පවරාගත් නාගරික කේන්ද්‍රයේ පාසල් සහ රජයට පවරා නොදුන් පාසල් භෞතික හා මානව සම්පත් අතින් ඉහල තත්ත්වයට පත්වූ අතර ඒවා කෙරෙහි දෙමාපියන්ගේ ආකර්ශණය ද ඉහල ගොස් ඇති බවට සාධක ඇත. එහෙත් වර්තමානයේ රජයේ ජනප්‍රිය පාසල්වලට ඇතුලත්වීමට ඇති බාධාවන් හේතුවෙන් වර්තමානය වන විට ජාත්‍යන්තර පාසල් දේශීය ප්‍රජාවගේ ආකර්ෂණය ලබා ගැනීමට සමත්ව ඇත.

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ පනතින් ආරම්භ කර අධ්‍යාපන ආයතන වශයෙන් කටයුතු කරන මෙම පාසල් අතර අධ්‍යාපන ප්‍රමිතිය බෙහෙවින් වෙනස් වේ. ඒ අනුව ශ්‍රී ලංකාවේ බොහෝ ජාත්‍යන්තර පාසල් ඔවුන්ගේ සිසුන් Edexcel හෝ Cambridge සාමාන්‍ය සහ උසස්පෙළ විභාග සඳහා සූදානම් කරයි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2015 වර්ෂයේ සිට සිදු කරන ලද සමීක්ෂණයකට අනුව මේ වන විට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් 391ක් හඳුනාගෙන ඇත.

#### 3.3.1 අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාත්‍යන්තර පාසල් නියාමනය

1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය අනුව වයස අවුරුදු 5-14 වයස් සීමාවේ පසුවන දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකිබව දක්වා ඇත. ඒ හේතුවෙන් සමාගම් පනත යටතේ සමාගමක් වශයෙන් හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ තනි පුද්ගල හෝ හවුල් ව්‍යාපාර වශයෙන් මෙම ජාත්‍යන්තර පාසල් නම් ආයතන විශේෂය ලියාපදිංචි කෙරේ. ඒ අනුව **ජාත්‍යන්තර පාසල්,** අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි ආයතන නොවන හෙයින් ඒවා නියාමනය කිරීමේ නෛතික බාධාවන් පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂකගේ 2020 ජූලි මස අංක ED/03/10/01 දිනැති ලිපියෙන් දන්වා ඇත.ඒ අනුව ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිසිදු ජාත්‍යන්තර පාසලක් රජය මගින් පාලනයක් හෝ නියාමනයක් සිදු නොවන බව පැහැදිලි වේ. මේ හේතුව නිසා අධ්‍යාපනයේ ගුණාත්මකභාවය බැහැර කරමින් ව්‍යාපාරික පරමාර්ථයෙන් එම ආයතන පවත්වාගෙන යාමට ඉඩකඩ ලැබී තිබුණු අතර ඒ හේතුවෙන් අධ්‍යාපනයේ ප්‍රමිතිය සියලු පාසල් අතර ඒකාකාරීව පවත්වාගෙන යාමට ඇති ඉඩකඩ ඇහිරී තිබුණි.

### 3.3.2 ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම පිළිබඳ කමිටුව

1980 දශකයේ සිට මෙරට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා 2013/ED/E/13 හා 2013 ජුනි 03 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කරනු ලැබ ඇත.

එම අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගේ නිර්දේශ සමඟ සලකා බැලීමෙන් අනතුරුව අමාත්‍ය මණ්ඩලය විසින් මෙම කරුණ පිළිබඳ අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් පරිදි නිලධාරීන්ගෙන් යුතු කමිටුව පත් කිරීමට තීරණය කර තිබුණි.

(i) අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
(ii) ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ නියෝජිතයකු
(iii) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිතයකු
(iv) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු
(v) අධ්‍යාපන අමාත්‍යතුමා විසින් නම් කරනු ලබන පිළිගත් අධ්‍යාපනඥයින්
(vi) මෙම ක්ෂේත්‍රයේ නියැලි පෞද්ගලික අංශයේ නියෝජිතයින්
(vii) සෙසු පාර්ශවකරුවන්

ඒ අනුව මෙම නිලධාරි කමිටුව 2013 අගෝස්තු 28 දින සාකච්ඡා කර එකඟතාවයට එළඹි පහත කරුණු පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමට තීරණය කර තිබුණි.

(අ) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල ඉගෙනුම ලබන සියළුම ශ්‍රී ලාංකික දරුවන්ට මව්බස, ආගම හා ඉතිහාසය යන විෂයයන් ඉගෙනීම අනිවාර්යය කොන්දේසියක් බවට පත්කිරීම.

(ආ) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කර පවත්වාගෙන යාම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නියාමන හා අධීක්ෂණ ක්‍රියාවලියක් ස්ථාපනය කිරීමට හැකිවන පරිදි 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධි විධාන) පනතේ 25 වගන්තිය සංශෝධනය කිරීම.

(ඇ) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල අධ්‍යාපනික ක්‍රියාවලිය ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියේ පොදු රාමුව තුළ සිට විධිමත්ව නියාමනය කිරීමට හැකි වන පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පෞද්ගලික පාසල් අංශය, ලේකම් කාර්යාලයක් (Secretariat) බවට පරිවර්තනය කර ව්‍යවස්ථාපිත බලතල පැවරීම හා එකී පාසල්වල මානව හා භෞතික සම්පත්වල ගුණාත්මකභාවය නියාමනය කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම. මේ යටතේ පහත නිරීක්ෂණයන් දැක්වේ.

(i) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් වශයෙන් සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක වන පාසල් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ හැකියාවක් නොමැති නිසා ඒ ඒ වර්ෂවල උපත් සංඛ්‍යාව හා පාසල් අධ්‍යාපනයට පිවිසෙන ශිෂ්‍ය සංඛ්‍යාව අතර වෙනසක් පවතින අතර, ඔවුන්ව ජාතික වශයෙන් නියෝජනය වීමක් සිදු නොවේ. එම දරුවන්ද ජාතික අධ්‍යාපන පද්ධතියේ ඉගෙනුම ලබන දරුවන් වශයෙන් නියෝජනය වන ක්‍රමවේදයක් සැකසීම අත්‍යවශ්‍ය වන බව.

(ii) උසස් ප්‍රමිතියකින් යුක්ත ජාත්‍යන්තර පාසල් පද්ධතියක් පැවතීම, ආසියාවේ දැනුමේ කේන්ද්‍රයක් බවට රට සංවර්ධනය කිරීමේ ක්‍රමෝපායට අනුව ඉතා වැදගත් බැවින් හා රටේ විදේශ ආයෝජනය ඉහළ නැංවීමට ද ඉවහල් වනබැවින්, ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල කටයුතු ප්‍රමිතියකට අනුව විධිමත් කිරීම මගින් රටේ ආර්ථික සංවර්ධනයට ද ප්‍රබල රුකුලක් ලැබෙනු ඇති බව.

(iii) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල භෞතික හා මානව සම්පත්වල ගුණාත්මකභාවය හා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ ගුණාත්මකභාවය මත එකී පාසල් ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් හඳුන්වා දීමටද නිර්දේශ කර ඇති අතර එමගින් ප්‍රමිතියකින් තොර ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් බිහිවීම වැළැක්වීමත්, පවතින ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල ප්‍රමිතිය ඉහළ නැංවීමට උත්ප්‍රේරකයක් සැපයීමක් සිදු වන බවටත් සියලු පාර්ශව එකග වී තිබීම.

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනට ක්‍රියාත්මක වන පෞද්ගලික පාසල් අංශය, රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ගුරු ආයතනික කටයුතු සම්බන්ධව පමණක් කටයුතු කරන හෙයින් එම අංශයේ කටයුතු ඉහත දැක්වූ විෂය කරුණු ද ඇතුලත් වන සේ යලි සකස් කර, එම අංශය බලතල සහිත ලේකම් කාර්යාලයක් බවට පත්කර, පෞද්ගලික පාසල් නියාමනය කිරීමේ බලතල එකී ලේකම් කාර්යාලය වෙත ලබා දීම සඳහා නිර්දේශ කර තිබීම.

(v) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් ලේකම් කාර්යාලයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ආරම්භ කිරීම මගින්, අධ්‍යයන කටයුතු සඳහා මෙරටට පැමිණෙන විදේශීය සිසුන් සඳහා වීසා නිර්දේශ ලබා ගැනිමටත්, අනවශ්‍ය විදේශ ආගමනයන් පාලනය කිරීමටත් හැකියාව ලැබෙන බවද එය දැනට ක්‍රියාත්මක වන ක්‍රමවේදය වඩාත් නියමානුකූල කිරීමට ඉතා වැදගත් සාධකයක් වනබවටත් සියලුදෙනා නිර්දේශ කර තිබීම.

(ඇ) ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත විෂය මාලාවන් හා උපදෙස් යටතේ ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල අධ්‍යාපනය ලබන ලාංකික සිසුන් වෙනුවෙන් දේශීය විෂය මාලාව ආශ්‍රිතව පාඨමාලා /පන්ති ක්‍රියාත්මක කරන්නේ නම්, එවැනි අවස්ථාවලදී ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිර්දේශිත විෂයමාලාව හා උපදෙස් පිළිපැදීමේ අවශ්‍යතාව ඉතාමත් වැදගත් බවට නිර්දේශ කර ඇත.

(ඉ) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්, පොදු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට ද අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම පිණිස රෙගුලාසි මාලාවක් සැකසීමේ ඇති කාලීන වැදගත්කම පිළිබඳ සියලු පාර්ශව එකගත්වය ප්‍රකාශ කර තිබීම.

ඒ අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා පත්කරන ලද මෙම කමිටුවේ ඉහත නිර්දේශ හා නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලයේ අවධානය පිණිස 2013 සැප්තැම්බර් 17 දින ඉදිරිපත් කර තිබුණි. මෙම යෝජනා ඵලදායී හා ප්‍රායෝගික ඒවා වන නමුත් එම යෝජනා සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය විසින් දෙනලද නිර්දේශ හෝ නියමයන් පිළිබඳ විස්තර විගණනය විසින් ඉල්ලා සිටියද ඒවා ඉදිරිපත් නොවූ අතර , ඒ අනුව ජාත්‍යන්තර පාසල් සම්බන්ධව ඉහත යෝජනා තුල ඇතුලත් කරුණු ඉටු වීමේ සාර්ථකත්වය ඇගයීමට ලක් කළ නොහැකි විය.

(ii) 2013 සැප්තැම්බර් 17 දිනැති වාර්තාවේ නිර්දේශ කර ඇති පරිදි 1961 අංක 08 උපකෘත පාඨශාලා සහ අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය සංශෝධනය කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග සාමාජීය හේතු හා වෙනත් ප්‍රායෝගික හේතු මත සාර්ථක වී නොමැති බවට අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදහස් දක්වා තිබුණි.

(iii) ඉහත (අ) නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා අංක 1863/10 හා 2014 මැයි 20 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල්වල 1 වන ශ්‍රේණියේ සිට 8 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන ශ්‍රී ලාංකික දරුවන්ට මව්බස, ආගම හා ලංකා ඉතිහාසය යන විෂයයන් ඉගැන්වීම අනිවාර්යය කිරීමේ නියෝග හඳුන්වා දී තිබුණි. එහෙත් එම නියෝග ජාත්‍යන්තර පාසල් විසින් අනුගමනය කරනු ලබන්නේද යන්න පිළිබඳ කිසිදු පසු විපරමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

### 3.3.3 ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය හා දත්ත පවත්වාගෙන යාම

#### 3.3.3.1 අධ්‍යාපන අමාත්‍යාංශය සතු දත්ත

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක ජාත්‍යන්තර පාසල් සම්බන්ධ නිවැරදි දත්ත පද්ධතියක් අධ්‍යාපන අමාත්‍යාංශය සතුව නොමැති අතර, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් 2015 වසරේදි පළකරන ලද පුවත්පත් දැන්වීමකට ලද තොරතුරු අනුව දළ වශයෙන් ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව 391ක් පමණ පවතින බව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂකගේ 2020 ජුලි මස අංක ED/03/10/01 ලිපියෙන් දන්වා ඇත. එහෙත් මෙම පාසල් සත්‍ය වශයෙන්ම පවතීද යන්න පිළිබඳව මෙතෙක් භෞතිකව කිසිදු තහවුරුවක් සිදුකර නොමැත.

#### 3.3.3.2 ආයෝජන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති ජාත්‍යන්තර පාසල්

1978 අංක 4 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතේ (BOI) (ආයෝජන මණ්ඩල පනත) 16 වන වගන්තිය යටතේ ජාත්‍යන්තර පාසල් 07 ක් සඳහා පමණක් අනුමැතිය ලබා දී ඇත. මෙම ජාත්‍යන්තර පාසල් අනුමත කිරීමේදී ආයෝජන මණ්ඩලය විසින් සලකා බලන ලද්දේ විදේශීය ආයෝජකයකු විසින් ශ්‍රී ලංකාවට කරනු ලබන ආයෝජනයකදී සලකා බලනු ලබන කොන්දේසි පමණක් බව ආයෝජන මණ්ඩල අධ්‍යක්ෂ (ආයෝජන ඇගයීම්) ගේ 2020 ජුලි 22 දිනැති ලිපියෙන් විගණනයට දන්වන ලදි. මෙම පාසල් ආයෝජන මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ අනුමැතිය ලබා දී ඇති පාසල් වන බැවින් එම ආයතන පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කිරීම ආයෝජන මණ්ඩලයේ කාර්යයක් නොවන බවත් ඒ සඳහා ඔවුන් නෛතිකව බැඳී නොසිටින බවත් පෙනී යයි. ඒ අනුව මෙම අධ්‍යාපනික ආයතනවල සිදුකෙරෙන කටයුතු පිළිබඳ නියාමන කාර්යයන් සිදු කිරීමේ වගකීමෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට තවදුරටත් බැහැර විය නොහැකි බව විගණනයේ අදහස වේ.

#### 3.3.3.3 සමාගම් පනතේ ප්‍රතිපාදන හා රෙජිස්ට්‍රාර්වරයාගේ කාර්යභාරය

**(අ) සමාගම් පනත යටතේ ලියාපදිංචි ජාත්‍යන්තර පාසැල්**

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් ලෙස පාසැල් 21ක් ලියාපදිංචි වී ඇති අතර සමාගමක් ලියාපදිංචියේදී සලකා බලන නිර්ණායකයන්ට අමතරව පාසලක් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය අනෙකුත් නිර්ණායක හා ප්‍රමිතීන් පිළිබඳ අවධානය යොමු නොවන ලෙස පිහිටුවා තිබීම හා කිසිදු අයුරකින් නියාමනයක් සිදු නොවීම තුළ හුදෙක් ව්‍යාපාර වශයෙන් ලියාපදිංචි වීම හා ව්‍යාපාරික අරමුණු ඇතිව පවත්වාගෙන යමින් තිබුණි. ශ්‍රී ලංකාව තුළ අනාගත මානව ප්‍රාග්ධනය ගොඩනැගීමේදී එහි ගුණාත්මක බව මෙන්ම දේශීයත්වයට ගැලපෙන පරිදි සිදු නොවීම මෙන්ම ජාත්‍යන්තර මට්ටමට ගැලපීම යන කිසිදු අවශ්‍යතාවයක් සපුරා තිබේද යන කරුණු පිළිබඳව ඇගයීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය.

**(ආ) සමාගම් ලියාපදිංචිය අත්හිටුවීමේ තීරණය ක්‍රියාත්මක නොවීම**

ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය පිළිබඳව බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් කරන ලද විමසීමට පිළිතුරු වශයෙන් විගණනය වෙත දන්වා තිබුණේ පහත දැක්වෙන කැබිනට් තීරණය මත පිහිටා ඔවුන් ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා නොදෙන බවයි.

එම අංක අමප/01/71/11/004 හා 2001 ජනවාරි 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පහත පරිදි වේ.

"ජාත්‍යන්තර පාසල් ලෙස හඳුන්වනු ලබන පාසල්, අධ්‍යාපනය පිළිබඳ ජනාධිපති කාර්යසාධන බල මණ්ඩලය විසින් අපේක්ෂිත පරිදි, ජාතික අධ්‍යාපන ක්‍රමය තුළ ඒවා කටයුතු කිරීමත්, ඒවායේ නියමිත ප්‍රමිතීන් පවත්වාගෙන යාමත් සහතික වනු පිණිස එකී පාසල් විධිමත්ව පාලනය කිරීම පිණිසත්, නෛතික විධිවිධාන ගෙනඒම පිණිස පියවර ගතයුතුයයි එකඟවන ලද බවය. මේ පිළිබඳ මූලික වාර්තාවක් 2001 පෙබරවාරි මස 15 වන දින වනවිට ඉදිරිපත් කරන ලෙස ඇමතිතුමාට දැනුම් දෙන ලදි. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ පිළිබඳව ක්‍රියාකරනු ලබනතුරු, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින්, ජාත්‍යන්තර පාසල් පවත්වාගෙන යාම පිණිස සමාගම් ලියාපදිංචි කිරීම වහාම අත්හිටුවිය යුතුයයි වැඩිදුරටත් තීරණය කරන ලදි." යනුවෙන් දක්වා ඇත.

ඒ අනුව 2001 න් පසුව ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වූ ජාත්‍යන්තර පාසල් පැවතිය නොහැකි අතර මේ වන විට ජාත්‍යන්තර පාසල් සඳහා නියමිත ප්‍රමිතීන් හඳුන්වා දීමට කටයුතු කර තිබිය යුතුය. එහෙත් විගණන දිනය වන විටත් ජාත්‍යන්තර පාසල් ජාතික අධ්‍යාපන ක්‍රමයට ඇතුලත් වී නොමැති අතර, තවදුරටත් ජාත්‍යන්තර පාසල් පැවතීමෙන් නිරීක්ෂණය වන්නේ ඉහත දක්වන ලද අමාත්‍ය මණ්ඩල තීරණය ක්‍රියාත්මක මට්ටමක නොපවතින බවයි.

**(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ මැදිහත් වීම**

සමාගම් රෙජිස්ට්‍රාර් යටතේ ලියාපදිංචි වීමෙන් මෙම පාසල් සම්බන්ධව වන මැදිහත් වීම පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ අනෙකුත් නිරීක්ෂණ පහත දැක්වේ.

**(i) ජාත්‍යන්තර පාසල් සමාගම් ලෙස ලියාපදිංචි කිරීම**

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ අංක 19072716561 දරන හා 2019 අගෝස්තු 13 දිනැති ලිපිය මගින් ඔහු වෙත ලද ජාත්‍යන්තර පාසලක් සී/ස සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමට ලද ලේඛන පරීක්ෂාවේදී අධ්‍යාපන කටයුතු සම්බන්ධ ව්‍යාපාරයක් ලෙස හැඟීගිය බැවින්, සමාගම් ව්‍යවස්ථාවලිය

සලකා බලා නිරීක්ෂණ හා නිගමන දන්වා එවන ලෙසත් පූර්ව අනුමැතීන් ලබා ගත යුතු නම් ඒ පිළිබඳ විස්තරද සමඟ දන්වන මෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් අමතා දන්වා ඇත. නමුත් එම ලිපියට පිළිතුරු ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂ විසින් දක්වා ඇත්තේ උපකෘත පාසල් පනත අනුව ජාත්‍යන්තර පාසල් සම්බන්ධව කිසිඳු නියාමනයක් සිදු නොවන බවය. ඒ අනුව ව්‍යාපාරික ආයතන ලියාපදිංචි කිරීමේ නිර්ණායකවලට අනුකූලව ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය සමාගම් පනත අනුව සිදු වුවද එම පාසල්වල අධ්‍යාපන කටයුතු නියාමනය කිරීමට ශ්‍රී ලංකාවේ කිසිඳු රාජ්‍ය ආයතනයක් මැදිහත් නොවී ඇති බව නිරීක්ෂණය විය.

**(ii) නාමය වෙනස් කිරීම**

2019 ඔක්තෝබර් 09 දින ගම්පහ පිහිටි ජාත්‍යන්තර පාසලක නාමය වෙනස් කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය හා ඉල්ලීමක් ඉදිරිපත් කර තිබූ අතර පවත්නා නීති, රීති අනුව එම ඉල්ලීම ඉටුකල නොහැකි බව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2019 ඔක්තෝබර් 11 දින උක්ත පාසලේ අධ්‍යක්ෂ වෙත දන්වා ඇත.

නමුත් මෙම ව්‍යාපාර නාමය වෙනස් කිරීමට 2007 අංක 7 දරන සමාගම් පනතේ 471(2) වැනි වගන්තිය සමඟ කියවිය යුතු එහිම 8(1) වගන්තියෙන් සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙතින් 2019 ජුනි 29 දින අනුමැතිය ලබාදී ඇති බව සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ අංක පීබී 549 දරණ ලිපියෙන් දක්වා ඇත.

**(ඇ) සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් නිවැරදි තොරතුරු වාර්තා නොවීම**

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි පාසල් ලෙස පාසල් 21ක දත්ත පමණක් විගණනය වෙත ලබා දී ඇති අතර 2000 වර්ෂයෙන් පසුව ජාත්‍යන්තර පාසල් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි නොකරන ලද බව දන්වා ඇත.

තවද බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණේ කැබිනට් තීරණයක් මත පිහිටා ඔවුන් ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය සඳහා අනුමැතිය ලබා නොදෙන බවයි. එහෙත් විගණනය වෙත සෘජුව ලද දත්ත හා සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවෙන් හා බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලද තොරතුරු අනුව පරස්පරතා පවතින බව

නිරීක්ෂණය විය. එනම් ඔවුන්ගේ පිළිතුරු තුල සඳහන් නොවුන ද ජාත්‍යන්තර පාසල් වශයෙන් පවත්වාගෙන යන අධ්‍යාපන ආයතන බොහොමයක් ලංකාවේ පවතින බව නිරීක්ෂණය විය.

ඒ අනුව නිරීක්ෂණය වන්නේ 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තියට අනුව රජයට හැර වෙනත් පෞද්ගලික පාර්ශවයකට අනිවාර්ය අධ්‍යාපන වයස් සීමාවේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල් ආරම්භ කිරීමේ නෛතික බාධාවක් පවතින බැවින් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිවීමක් නොකලද, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී අධ්‍යාපනික ආයතන වශයෙන් කටයුතු කරන බවයි.

**3.3.3.4ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ ලියාපදිංචි කරන ලද ජාත්‍යන්තර පාසැල්**

මේ සම්බන්ධයෙන් පළාත් මට්ටමින් නිරීක්ෂණය වූ කරුණු පහත පරිදි විය.

(අ) බස්නාහිර පළාත් ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් කරන ලද විමසීමකට අනුව 2011 අංක 05 දරන බස්නාහිර පළාතේ වෙළඳ, සංස්ථා හා සංස්ථාගත කරනු නොලැබූ වෙළඳ ආයතනයන්හි ව්‍යාපාර නාම ප්‍රඥප්තිය යටතේ, අංක 01/71/11/004 හා 2001 ජනවාරි 05 දිනැති කැබිනට් තීරණය මත පිහිටා ජාත්‍යන්තර පාසල් ලියාපදිංචි වී නොමැති බව දන්වා ඇත. එහෙත් පළාත් පාලන ආයතන මගින් ලද තොරතුරු අනුව ව්‍යාපාරික ආයතන මට්ටමින් ආරම්භ කර පවත්වාගෙන යන ජාත්‍යන්තර පාසල් තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) දකුණු පළාත් සභාවේ ලේකම්ගේ අංක දපස/ආ/26/2/20 හා 2020 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මගින් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගෙන් විමසා ඇති පරිදි දකුණු පළාත තුල ජාත්‍යන්තර පාසල් ලියාපදිංචිය සම්බන්ධව නිර්දේශ ලබාගත යුතු ආයතන සම්බන්ධව උපදෙස් ඉල්ලා තිබුණි.

මෙම ලිපියට පිළිතුරු ලෙස අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2020 සැප්තැම්බර් 28 දින දක්වා ඇත්තේ 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය අනුව අවුරුදු 5-14 වයස් සීමාවේ පසුවන දරුවන්ට අධ්‍යාපනය ලබාදීම සඳහා පාසල් ආරම්භ කිරීමට පෞද්ගලික පාර්ශවයන්ට නොහැකි බව සඳහන් කර ඇති බැවින් මෙම නෛතික විධිවිධාන සංශෝධනය වනතුරු පෞද්ගලික පාසල් වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමට හෝ අධ්‍යාපන ආයතන ආරම්භ කිරීම සඳහා නිර්දේශ/ උපදෙස් ලබාදීමට හැකියාවක් නොමැති බවයි.

(ඇ) තවද නියැදි පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි රජයේ අනුමත පෞද්ගලික පාසලක් තනි පුද්ගල ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කිරීමට අයදුම්කල බවත් ඒ සඳහා ලබාගත යුතු නිර්නායකයන් මොනවාද යන්න පිළිබඳවත් 2020 අගෝස්තු 03 දිනැති මාවතගම ප්‍රාදේශීය ලේකම්ගේ ලිපියක් මගින් අධ්‍යාපන ලේකම්ගෙන් විමසා ඇත. මේ අනුව නිරීක්ෂණය වන්නේ පෞද්ගලික පාර්ශවයන් විවිධ ආකාරයෙන් ජාත්‍යන්තර පාසල් ලියාපදිංචි කිරීමට උත්සාහ දරණ බවයි.

(ඇ) විගණනය විසින් දිවයින පුරා පිහිටි මහා නගර සභා සහ නගර සභා වලින් කරන ලද තොරතුරු කැඳවීමට ලද පිළිතුරු අනුව එම බල ප්‍රදේශ තුල අධ්‍යාපන කටයුතු සිදුකරනු ලබන ජාත්‍යන්තර පාසැල් ව්‍යාපාරික පරමාර්ථයෙන් ආරම්භ කර කිසිඳු ආයතනයකින් නියාමනය නොවන ව්‍යාපාරික මධ්‍යස්ථාන ලෙස පමණක් ලියාපදිංචිය ලැබූ ආයතන බව විගණනයේදී නිරීක්ෂණය විය.ඒ අනුව පළාත් 9ට අයත් පළාත් පාලන ආයතන 66 කින් තොරතුරු කැඳවීමේදී විගණන දිනට තොරතුරු ලබා දුන් ආයතන 48න් ආයතන 30ක එවැනි පාසල් 97ක් පවතින බව වාර්තා වී තිබූ අතර පළාත් පාලන ආයතන 17කින් ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. මේ අනුව දිවයින පුරාම ජාත්‍යන්තර පාසල් සීඝ්‍රයෙන් ව්‍යාප්තවන බවත්, කිසිඳු නියාමන යාන්ත්‍රණයක් නොමැතිව පළාත් පාලන ආයතන මට්ටමින් ජාත්‍යන්තර පාසල් පවත්වාගෙන යන බවත් නිරීක්ෂණය විය.

**3.3.3.5ජාත්‍යන්තර පාසල්වල ශාඛාවන් පිහිටුවීම**

(අ) වර්තමානය වනවිට ක්‍රියාත්මක වෙමින් පවතින ජාත්‍යන්තර පාසල් ඒවායේ ශාඛාවන්ද ස්ථාපිත කිරීම අරඹා ඇති අතර ඇතැම් ඒවා ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශ ඉල්ලා ඇත. එවැනි අවස්ථාවන්හිදී ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතිචාරය වී ඇත්තේ 1961 අංක 08 දත්ත උපකෘත පාඨශාලා පනත සංශෝධනය වනතුරු නිර්දේශය/උපදෙස් ලබාදිය නොහැකි බවයි. ශාඛා පාසල් ස්ථාපිත කිරීමට අනුමැතිය අපේක්ෂා කරන ලද එවැනි පාසල් දෙකක් පිළිබඳ විස්තර නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) පළාත් පාලන ආයතන වලින් ලද තොරතුරු අනුව එක්වරක් සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වූ ජාත්‍යන්තර පාසල් එම ලියාපදිංචි අංකය යටතේම දිවයිනපුරා පළාත් පාලන ආයතන මට්ටමින් ශාඛා පාසල් ආරම්භ කර පවත්වාගෙන යනු ලබන බව ද නිරීක්ෂණය විය.

**3.3.3.6 ජාත්‍යන්තර පාසල්වල අයිතිය පැවරීම**

2020 මැයි 26 දින ගාල්ල ජාත්‍යන්තර පාසලක දෙමාපිය සංගමය විසින් ජනාධිපතිතුමා වෙත යවන ලද පැමිණිල්ලක දක්වා ඇත්තේ එම පාසල මූල්‍ය සමාගමක් යටතේ පාලනය වූ බවත්, 2017 වසරෙහි මෙම පාසල විකිණීම සඳහා ලද ටෙන්ඩරයකට අනුව වෙනත් ජාත්‍යන්තර පාසලකට පැවරීමට උත්සාහ ගනිමින් සිටින බවත්ය.

මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිතුර වී ඇත්තේ පවතින නෛතික විධිවිධාන අනුව ජාත්‍යන්තර පාසල් ගැටළු සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට ඍජුව මැදිහත්වීමේ හැකියාවක් නොමැති බැවින් පාසලේ කළමනාකාරීත්වය සමඟ සාකච්ඡා කර ප්‍රශ්නය විසඳාගන්නා ලෙසය.

මේ අනුව නිරීක්ෂණය වන්නේ විධිමත් නියාමන ආයතනයක් නොමැති වීම හේතුවෙන් ජාත්‍යන්තර පාසල් සම්බන්ධව පැනනගින ගැටළු සඳහා දෙමාපියන් හට විසඳුම් ලබා ගත හැකි කිසිදු රාජ්‍ය ආයතනයක් නොමැති බවයි.

**3.3.4 ජාත්‍යන්තර පාසල් අලුතින් ආරම්භ කිරීම**

**3.3.4.1 රජයේ පාසලක් අලුතින් ආරම්භ කිරීමේ සාමාන්‍ය තත්ත්වය**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 1981 දී පිළියෙල කරන ලද පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 2.1 ඡේදය අනුව රජයේ නව පාසලක් ආරම්භ කිරීමේ දී අදාළ නිර්දේශය ලබා දිය යුත්තේ ඒ සඳහා අත්‍යවශ්‍ය අවස්ථාවක පමණි. ඒ අනුව පහත සඳහන් අවස්ථාවන්හීදී නව පාසලක් විවෘත කිරීමේ අවශ්‍යතාවය මතු විය හැකිය. ඒ අනුව අදාල නිර්ණායක පූර්ණ වශයෙන් ජාත්‍යන්තර පාසල් ආරම්භ කිරීමට අදාල කර ගැනීම දුෂ්කර හා ප්‍රායෝගික නොවුණද ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා වන නිර්ණායක ජාත්‍යන්තර පාසල් සඳහාද අදාල කර ගැනීමේ අවශ්‍යතාවය මෙහිදී බැහැරකල නොහැක.

**(අ) පාසල සඳහා ඇති දුර**

ඊට අදාල නිර්ණායක පහත පරිදි විය.

(i) ප්‍රදේශය තුල සිටින වයස අවුරුදු 10ට අඩු ළමුන් හට කි.මී.2 කට වැඩි දුරක් ගෙවා ප්‍රාථමික පාසලකට යාමට සිදුවන අවස්ථා

(ii) ප්‍රදේශය තුල සිටින 6-11 පන්තිවල අධ්‍යාපනය ලබන සිසුන්ට කි.මී.4 කට වැඩි දුරක් ගෙවා ද්විතියිත පාසලකට යාමට සිදුවන අවස්ථා

(iii) ඉහත සඳහන් පරිදි නියමිත දුර ප්‍රමාණයන්හි ප්‍රාථමික හා ද්විතියික පාසල් පැවතිය ද පහත සඳහන් අවස්ථාවන්හිදී,

- පවත්නා පාසල්වල ඇති ඉඩකඩ ප්‍රමාණයට වඩා වැඩි පාසල් යායුතු වයසේ පසුවන ශිෂ්‍ය ජනගහණයක් අදාළ ප්‍රදේශය තුළ වාසය කිරීම. (ජන හා සංගණන වාර්තා මගින් ඔප්පු කල යුතුය.)
- නියමිත දුර ප්‍රමාණයන්හි පාසල් පැවතියද වනාන්තර, ගංගා පිහිටීම, කඳුවැටි වැනි ස්වාභාවික බාධක නිසා එම පාසල් කරා ළඟා වීම අපහසු වීම.

**(ආ) නව ජනාවාස බිහි වීම**

මහවැලි ව්‍යාපෘතිය වැනි නව ජනාවාස හෝ ගොවි ජනපද හෝ ආදර්ශ ගම්මාන ආරම්භ කිරීමේ දී ප්‍රදේශයේ පදිංචියට පැමිණෙන පවුල් සංඛ්‍යාවේ පාසල් යා යුතු වයසේ පසුවන ශිෂ්‍ය සංඛ්‍යාව හා එහි වර්ධනය අනුව ද අලුතින් පාසලක් ආරම්භ කළ හැක.

**(ඇ) අලුතින් පාසලක් ආරම්භ කිරීමට යෝජනා ඉදිරිපත් වීම**

නව පාසලක් ආරම්භ කිරීමේ දී දෙයාකාරයෙන්ම ඉදිරිපත් විය හැකි යෝජනා පහත සඳහන් පරිදි සලකා බැලිය හැකිය.

(i) කලාප අධ්‍යාපන කාර්යාලයෙහි සැලසුම් අංශය මගින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් අනුව

(ii) ප්‍රදේශයේ දෙමාපියන්, ග්‍රාම නිලධාරින් හෝ වෙනත් බාහිර සංවිධානයක් මගින් ඉදිරිපත් කරන යෝජනාවක් අනුව

**(ඈ) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කිරීම**

ඉහත (ඇ) පරිදි එසේ යෝජනා ඉදිරිපත් වූ විට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පහත සඳහන් කරුණු පිළිබඳ අදාළ දත්ත හා සංඛ්‍යා ලේඛන සලකා බලා යෝජනාව පිළිබඳ ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතුය.

(i) අදාළ පෝෂක ප්‍රදේශය තුල එම වර්ගයේ පාසලක් නොමැති වීම.

(ii) අදාළ පෝෂක ප්‍රදේශය තුල නව පාසලක් ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් තරම් ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටීම.

(iii) අදාළ පෝෂක ප්‍රදේශය තුල ඇති පාසලෙහි/ පාසල්වල නියමිත අධ්‍යාපන තලයේ සියලු දරුවන් සඳහා ඉඩකඩ නොමැති වීම.

(iv) නව පාසලක් ඉදිකිරීම සඳහා සුදුසු හා ප්‍රමාණවත් ගොඩනැගිලි සඳහා භූමියක් පැවතීම.

**(ඉ) නව පාසලක් පිහිටුවීම සඳහා අවම භූමි ප්‍රමාණය පිළිබඳව සලකා බැලීම**

නව පාසලක් ආරම්භ කිරීමේ යෝජනාව සාධාරණීකරණය කළ පසු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නව පාසල ඉදිකිරීම සඳහා සුදුසු ඉඩමක් තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත් විය යුතුය. ප්‍රාථමික පාසලක් ආරම්භ කිරීම සඳහා අවම වශයෙන් අක්කර 02 භූමි ප්‍රමාණයක් අවශ්‍ය වන බව පාසල් ව්‍යූහ කටයුතු පිළිබඳ උපදෙස් සංග්‍රහයේ 2.2 (ආ) ජේදයේ සඳහන් වේ.

**3.3.4.2 ජාත්‍යන්තර පාසලක් ස්ථාපිත කිරීමේදී උක්ත නිර්ණායක සලකා නොබැලීම**

දිවයිනපුරා ජාත්‍යන්තර පාසල් ස්ථාපිත කිරීමේදී ඒ පිළිබඳව නියාමනයක් සිදුනොවීම හේතුවෙන් ඉහත දක්වා ඇති අවශ්‍යතා වලින් බැහැරව ජාත්‍යන්තර පාසල් ස්ථාපිත වී ඇති බව නිරීක්ෂණය විය. ඉතා අවම පහසුකම් හා අඩු භූමි ප්‍රමාණයක් සහිත නිවාස වැනි ස්ථානවල ඇතැම් ජාත්‍යන්තර පාසල් ආරම්භ කර ඇති බවත්, දරුවෙකුට සුදුසු ඉගෙනුම් වටපිටාවක් නොමැති බවත් ඇතැම් දෙමාපිය පැමිණිලි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. විස්තර 3.3.5 ජේදයේ දක්වා ඇත.

**3.3.4.3 ජාත්‍යන්තර පාසල් සඳහා ගොඩනැගිලි ස්ථාපිත කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය**

ජාත්‍යන්තර පාසලක් ඉදිකිරීමේදී නාගරික සංවර්ධන අධිකාරිය වෙත අදාල ගොඩනැගිලි අයදුම්පත් ඉදිරිපත් කර මූලික සැලසුම් නිරාකරණ අනුමැතිය ලබාගැනීමේදී නාගරික සංවර්ධන අධිකාරිය විසින් අදාල නිරවුල් සහතිකය ලබාදීමට ඉල්ලනු ලබන අනෙකුත් නිර්දේශ අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශයද ඉල්ලා සිටී.

මෙහිදී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අදාල ඉල්ලීමට පිළිතුරු ලෙස දක්වා ඇත්තේ 1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තියට අනුව රජයට හැර පෞද්ගලික පාර්ශවයකට පාසල් ආරම්භ කිරීමේ නීතිමය හැකියාවක් නොමැති බවත් උක්ත කරුණට අදාලව උපදෙස් හෝ නිර්දේශයක් ලබාදීමට නොහැකි බවය.

මේ හේතුවෙන් පාසලක් ඉදිකිරීමේදී අදාලකර ගත යුතු නිර්ණායක වලින් බැහැරව තම අභිමථය පරිදි ඒවා ගොඩනැගීමට ඉඩ ප්‍රස්ථා ලැබී ඇති බව නිරීක්ෂණය විය.

**3.3.5 පාසලක පැවතිය යුතු භෞතික සම්පත්**

ඉහත නිර්ණායකයන්ට අමතරව අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් ගොඩනැගිලි ශාඛාව විසින් 2010 ජනවාරි පිළියෙල කරන ලද භෞතික සම්පත් කළමනාකරණය සහ භෞතික සම්පත්

සඳහා මානයන් නැමති මාර්ගෝපදේශයෙහි පාසලකට අවශ්‍ය භෞතික සම්පත් සඳහා මානයන් පහත පරිදි දක්වා ඇත. විස්තර ඇමුණුම 01 හි දැක්වේ.

- ප්‍රාථමික පාසල් (1-5 ශ්‍රේණි) සඳහා (Type 3 Schools)
- කණිෂ්ඨ ද්විතීයික පාසල් (1-9 ශ්‍රේණි හෝ 1-11 ශ්‍රේණි) සඳහා (Type 2 Schools)
- ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් (විද්‍යා විෂයයන් රහිත) සඳහා (Type 1C Schools)
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් (විද්‍යා විෂයයන් සහිත) සඳහා (Type 1AB Schools)
- අනෙකුත් පහසුකම්
- ගුරු නිවාසය හා තනිකඩ නිවාසය
- වැසිකිළි කැසිකිළි

නමුත් ජාත්‍යන්තර පාසල් සම්බන්ධව මෙම ප්‍රමිතීන් අනුව කටයුතු කරන්නේද යන්න අධ්‍යාපන අමාත්‍යාංශයෙන් අධීක්ෂණයක් සිදු නොවේ. එහෙත් මෙම පාසල්වල භෞතික සම්පත් ප්‍රමාණාත්මක නොවන අවස්ථා පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වරින් වර මහජන නියෝජන ලැබී තිබුණි. විස්තර පහත දැක්වේ.

(i) ඇහැළියගොඩ පවත්වාගෙන යන ජාත්‍යන්තර පාසලක ගොඩනැගිලි පහසුකම් හා සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත් නොවන බව 2019 ජූලි 31 දින දෙමාපියකු විසින් රත්නපුර කලාප අධ්‍යක්ෂ වෙත එවන ලද ලිපිය සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතත් ඔහු 2019 සැප්තැම්බර් 02 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යක්ෂ වෙතත් එවා ඇත.

(ii) වයඹ පළාත් සභාවට අයත් මල්ලවපිටිය ප්‍රදේශයේ පවත්වාගෙන යන ජාත්‍යන්තර පාසලක පාසල් විද්‍යාගාරයක්, පුස්තකාලයක්, පරිගණක ඒකකය, රැස්වීම් ශාලාව, පිරිසිදු වැසිකිළි, පිරිසිදු පානීය ජලය, සුදුසුකම් සහිත ගුරුවරු යනාදී පහසුකම් නොමැති බවට දෙමාපියන් විසින් 2019 ජූලි 15 දින දැනුම් දී ඇත.

(iii) නාවල පිහිටි ජාත්‍යන්තර පාසලක 3 වසර පන්ති අනාරක්ෂිත ලෙස පවත්වාගෙන යාම පිළිබඳව දෙමාපියන් 2019 මැයි 22 දින පැමිණිලි කර ඇත. ශාස්ත්‍ර අයකරන ඉහත සඳහන් පරිදි පවත්වාගෙන යන මෙම පාසල් සම්බන්ධයෙන් කිසිඳු නියාමනයක් නොමැතිව පවත්වාගෙන යාම නිසා අදාළ පහසුකම් නොමැතිව පවත්වාගෙන යාමට ඉඩකඩ ලැබී තිබුණි.

### 3.3.6 ජාත්‍යන්තර පාසල්වල ඉගැන්වීම් කටයුතු

#### 3.3.6.1 අධ්‍යාපනයේ ගුණාත්මක බව

අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වරින්වර ඉදිරිපත් කළ මහජන නියෝජන අතර පහත දැක්වෙන දිවයිනේ ප්‍රසිද්ධ යැයි සම්මත වැඩි දෙමාපිය ආකර්ශනයක් හිමි කරගත් පාසල්වල ගුරුවරුන් නිසි පරිදි ඉගැන්වීම් නොකිරීම, වරින් වර ගුරුවරුන් මාරුවීම, සුදුසුකම් නොලත් ගුරුවරුන් ඉගැන්වීම, විෂය නිර්දේශය ආවරණය නොකිරීම, ළමා මානසික තත්ත්වය තේරුම්නොගත් ඉගැන්වීම් ක්‍රම භාවිතා කිරීම, ගුරුවරුන් හා විදුහල්පතිවරුන් විසින් දරුවන් ලිංගික අපයෝජනයට ලක්කිරීම් වැනි ක්‍රියාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයට ඒ පිළිබඳ මැදිහත් වන ලෙස ඉල්ලා ඇත. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙම සෑම ඉල්ලීමකදීම ඒ සඳහා මැදිහත්වීමට නොහැකි බවට ලිඛිතව දන්වා ඇත. එසේ වුවද විගණනයට ලද තොරතුරුවලට අනුව නියැදි පරීක්ෂාවට ලක්වූ පාසල් 14 කට අදාලව ගුරුවරුන්ගේ සුදුසුකම්, ප්‍රමාණවත් ගුරු සංඛ්‍යාවක් නොසිටීම, විෂය නිර්දේශ ගැටළු හා එය ආවරණය නොකිරීම හා නොමනා හැසිරීම් පිළිබඳ කරුණු අනාවරණය වී තිබුණි.

#### 3.3.6.2 විෂය නිර්දේශ ඉගැන්වීම්

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මේ වන විට ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර පාසල් 391ක් හඳුනාගෙන ඇත. මෙම පාසල්වල අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමත විෂය නිර්දේශය මෙන්ම වෙනත් විෂය නිර්දේශයන් ද ඉගැන්වේ. ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

**(අ) දේශීය විෂය නිර්දේශය ඉගැන්වීම**

මෙම ජාත්‍යන්තර පාසල් 391න් පාසල් 202ක් ම දේශීය විෂය නිර්දේශය පමණක් උගන්වන පාසල් බව දක්වා ඇත. රජයේ පාසලක මෙන් මෙම පාසල්වල දේශීය විෂය නිර්දේශය නියමිත ප්‍රමිතීන්ට අනුකූලව ඉගැන්වීම් කෙරේද යන්න පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හෝ වෙනත් අධ්‍යාපනයට අදාළ රාජ්‍ය ආයතනයකින් පරීක්ෂා කිරීමක්/නියාමනයක් සිදු නොවේ. එසේම දේශීය විෂය නිර්දේශය පමණක් උගන්වන පාසල් ජාත්‍යන්තර පාසල් යන නාමය භාවිතා කිරීමද ගැටළු සහගතය.

**(ආ) දේශීය හා විදේශීය විෂය නිර්දේශ දෙකම උගන්වන පාසල්**

ඇතැම් ජාත්‍යන්තර පාසල් විෂය නිර්දේශ දෙකම උගන්වන බව නිරීක්ෂණය වූ අතර, එක් එක් විෂය නිර්දේශ ඉගෙන ගන්නා සිසුන් ප්‍රමාණය කොපමණද යන්න සනාථ නොවුණි.

#### 3.3.6.3 ළමුන්ට සිදුවන කායික හා මානසික දුෂ්කරතා

ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන් සම්බන්ධව ජාතික ළමාරක්ෂක අධිකාරියට 2018, 2019 හා 2020 වර්ෂයන්හිදී දරුවන්ට කෲර ලෙස සැලකීම, ලිංගික කරදර සහ වෙනත් ලෙස පිළිවෙලින්

පැමිණිලි 13ක්, 11ක් හා 06ක් වශයෙන් ලැබී තිබූ අතර විගණන දින වන විටත් ඒවායින් නොවිසඳී තිබූ පැමිණිලි සංඛ්‍යාව පිළිවෙලින් 06ක්, 08ක් හා 05ක් වශයෙන් විය.

| **කාරණය** | **පැමිණිලි සංඛ්‍යාව** | | |
|---|---|---|---|
| | **2018** | **2019** | **2020** |
| දරුවන්ට කෲර ලෙස සැලකීම | 08 | 07 | 05 |
| ලිංගික කරදර | 02 | 02 | - |
| වෙනත් | 03 | 02 | 01 |
| මුළු සංඛ්‍යාව | **13** | **11** | **06** |
| නොවිසඳුනු සංඛ්‍යාව | **06** | **08** | **05** |

### 3.3.6.4 විභාග පැවැත්වීම

**(අ) ජාත්‍යන්තර පාසල් සිසුන්ට දේශීය විභාග සඳහා සම්බන්ධ වීමට ඇති අවස්ථා**

විස්තර පහත පරිදි විය.

(i) පෞද්ගලික පාසල් ශාඛාව මගින් හඳුනාගෙන තිබූ 391ක් වූ ජාත්‍යන්තර පාසල් වලින් පාසල් 202 ක් ම දේශීය විෂය නිර්දේශය භාවිතා කරන බව හඳුනාගෙන තිබුණි. එලෙස දේශීය විෂය නිර්දේශය හදාරණ සිසුන් හට අ.පො.ස.(සා/පෙළ) හා අ.පො.ස.(උ.පෙළ) විභාග සඳහා පෞද්ගලික අයදුම්කරුවන් ලෙස පෙනී සිටීමට අවස්ථාව ලැබේ. එලෙසම එම විභාග දෙක සඳහාම පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට පෙනී සිටින්නේ නම් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් එම අයදුම්කරුගේ වයස සලකා බලනු නොලැබේ. එමෙන්ම විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අ.පො.ස.(උ.පෙළ) ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූ සියලුම අයදුම්කරුවන් පිළිබඳව සලකා බැලේ. එහිදී අයදුම්කරුගේ වයස සලකා බලනු නොලැබේ.

(ii) ඒ අනුව රජයේ හෝ රජයේ අනුමත පාසලක ශිෂ්‍යයකු ලෙස එම විභාගවලට පෙනී සිටින අයදුම්කරුවන්ට නොලැබෙන අවස්ථාවක් ජාත්‍යන්තර පාසලක ඉගෙනුම ලැබූ පෞද්ගලික අයදුම්කරුවකු ලෙස විභාගයට පෙනී සිටින සිසුවෙකු හට ලැබෙන බවත් ඒ තුලින් අධ්‍යාපනයේ සම අවස්ථා ගිලීහීමට ලක්වන බවත් ඒ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ අවධානයට ලක්වී නොමැති බවත් නිරීක්ෂණය විය.

**(ආ) ජාත්‍යන්තර පාසල්වල සිසුන් අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනී සිටීම**

දිවයිනේ රජයේ පාසල් හා උපකෘත පාසල් යටතේ ලියාපදිංචි වී ඇති පාසල්වල සිසුන් අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) විභාගයට පෙනීසිටීමේදී පාසල් සිසුන් ලෙස සටහන් නොවන අතර පෞද්ගලික අයදුම්කරුවන් ලෙස කාණ්ඩගත කෙරේ. අදාල විභාගය අයදුම්කරන අයදුම්පත්‍රයේ පාසලේ නම සඳහන් කිරීම දක්වා නැත. මේ සම්බන්ධව ඇතැම් ජාත්‍යන්තර පාසල් විසින් ඉල්ලීම්කර තිබූ බවද විගණනයේදී නිරීක්ෂණය විය. ඒ අනුව උක්ත විභාගයන්හිදී පළමුවර විභාගයට පෙනී සිටින අයදුම්කරු ඉගෙන ගන්නා පාසල සඳහන් නොවීම හේතුවෙන් දිවයිනේ එක් වර්ෂයක් තුල පාසල් අයදුම්කරුවන් ලෙස පෙනී සිටින ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳව නිවැරදි දත්ත පවත්වාගෙන යාමට එය බාධාවක් වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

### 3.3.7 ජාත්‍යන්තර පාසල්වල ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය

#### 3.3.7.1 ගාස්තු අයකිරීම් සම්බන්ධ පැමිණිලි

එක් එක් ජාත්‍යන්තර පාසල්වල අයකරන ගාස්තු විවිධ වන අතර ඒවා අයකරන ක්‍රමවේදයන්හිද යම්යම් සදාචාරාත්මක ගැටළු පවතින බව දෙමාපිය පැමිණිලි අනුව නිරීක්ෂණය විය. එනම් අයකරන පාසල් ගාස්තුවට සරිලන පරිදි ඉගැන්වීම් නොකිරීම, පන්ති ගාස්තු ගෙවීම පමා වූ විට දරුවන්ට කුරිරු ලෙස දඬුවම් කිරීම, පාසල් ගාස්තුවලට අමතරව විවිධ කටයුතු සඳහා මුදල් අයකිරීම, අත්තනෝමතික ලෙස පාසල් ගාස්තු අය කිරීම, පාසල් ගාස්තු ගෙවීමට අපොහොසත් වන දරුවන්ගේ පාසල් ශිෂ්‍ය කාර්ය දර්ශකය (අස්වීමේ සහතිකය) ලබා නොදීම වැනි කරුණු සඳහා වරින් වර අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කර තිබුණි. නියැදි පරීක්ෂණයේදී පාසල් 05ක් සම්බන්ධයෙන් එවැනි සිදුවීම් අනාවරණය විය.

#### 3.3.7.2 කොරෝනා වසංගත කාලය තුල පාසල් ගාස්තු අයකිරීම සම්බන්ධ ගැටළු

කොරෝනා වසංගත කාලය තුල ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ගෙන් වාර ගාස්තු අයකිරීම් සාධාරණ ක්‍රමවේදයක් නොමැති බව දක්වමින් දෙමාපියන් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට විවිධ පැමිණිලි එවා තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) හැටන් හි පිහිටි ජාත්‍යන්තර පාසලක දෙමාපියන් පිරිසක් 2020 සැප්තැම්බර් 04 දින අතිගරු ජනාධිපතිතුමා අමතා දක්වා ඇත්තේ එම පාසලේ භෞතික හා මානව සම්පත්වල අඩුපාඩු මෙන්ම කොරෝනා වසංගතය පැවති කාලයේ පාසල වසා තිබුණද (2020 අප්‍රේල්/මැයි/ජූනි) දරුවන්ගෙන් පාසල් ගාස්තු අයකිරීමේ සහනයක්

ලබා දී නොමැති බවත්, ගාස්තු නොගෙවූ දරුවන් පාසලට ඇතුලත් නොකිරීමටද කටයුතු කර ඇති බවත්ය.

(ආ) තවත් ජාත්‍යන්තර පාසලක ඉගෙනුම ලබන සිසුන්ගේ දෙමාපියන් පිරිසක් 2020 සැප්තැම්බර් 12 දින අධ්‍යාපන අමාත්‍යාංශයට කරන ලද පැමිණිල්ලක දක්වා ඇති කරුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කොරෝනා වසංගත කාලසීමාව තුල පාසල් ගාස්තු සහන සැලසීම පිළිබඳව උපදෙස් ලබාදී ඇතත් විදුහලේ කළමනාකාරීත්වය එය නොසලකා හැර ඇති බවයි.

**3.3.7.3 ජාත්‍යන්තර පාසල් සම්බන්ධව ජාතික ළමාරක්ෂක අධිකාරියට පැමිණිලි ලැබීම**

2020 මාර්තු 15 සිට 2021 මාර්තු 05 දින තෙක්වූ කොරෝනා වසංගත සමය තුල ජාත්‍යන්තර පාසල්වල ගාස්තු අයකිරීම සම්බන්ධව අපහසුතාවයට පත්වූ දෙමාපියන් විසින් ජාතික ළමාරක්ෂක අධිකාරියට පැමිණිලි 11ක් ඉදිරිපත් කර තිබුණු අතර විගණන දින වන විට ඉන් පැමිණිලි 03ක් පමණක් විසඳා තිබුණි. ඒ අනුව පාසල් 08කට ආසන්න සංඛ්‍යාවකින් ලද පැමිණිලි පිළිබඳ විස්තර පහත දැක්වේ.

| දිනය | පැමිණිලිඅංකය |
|---|---|
| 2021.03.29 | PP/21/03/04/2688 |
| 2021.04.01 | CC/21/03/975/5/2813 |
| 2021.02.11 | CH/ 21/2/61/5/1184 |
| 2021.03.30 | CC/21/03/978/05/2816 |
| 2021.01.09 | CC/21/01/195/5/241 |
| 2021.03.11 | CH/20/08/19/4/5120 |
| 2021.02.09 | CC/21/2/058/4/1093 |
| 2021.01.25 | CC/21/1/668/4/598 |
| 2021.01.26 | CC/21/1/593/4/540 |
| 2021.02.09 | CC/21/2/114/5/1154 |
| 2020.08.27 | CC/20/8/629/4/5443 |

ඒ අනුව මෙසේ පැමිණිලි ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත්තේ මෙම ගැටළු වලින් පීඩාවට පත්වී ඇති සුළු කොටසක් බව පිළිගතහැකි බැවින් සමස්තයක් ලෙස ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් මෙවැනි ගැටළු පැවතිය හැකි බවට වන තර්කය මෙයින් බැහැර කල නොහැක.

### 3.3.8 ළමුන්ගේ ශාරීරික සෞඛ්‍ය පවත්වාගෙන යාම

#### 3.3.8.1 පාසල් සෞඛ්‍ය වැඩසටහන් සම්බන්ධ පොදු තත්ත්වය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ 2016 ජනවාරි 06 දිනැති පොදු චක්‍රලේඛ අංක 01-37/2007(1) අනුව සියළු පාසල් දරුවන්ට පාසල තුල සෞඛ්‍ය සේවා සැපයීමට සෞඛ්‍ය අමාත්‍යාංශය බැඳී ඇති බව දක්වා ඇත. ඒ අනුව වෛද්‍ය පරීක්ෂණ සිදු කිරීම, ආබාධ සහිත දරුවන්ට ප්‍රතිකාර කර නිවැරදි කිරීම, අවශ්‍ය විශේෂඥ වෛද්‍ය සේවාවන් වෙත යොමු කිරීම, පසු විපරම් කිරීම ආදිය පාසල් සෞඛ්‍ය වැඩසටහන යටතේ සිදු කරනු ලබයි.

ඒ අනුව පහත සඳහන් සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රමවේදයන් අධ්‍යාපන අමාත්‍යාංශයේ පරිපාලනය යටතේ පවතින, දිවයින පුරා ඇති සියලු රජයේ පාසල්, විශේෂ අධ්‍යාපන ඒකක, පිරිවෙන් හා පෞද්ගලික පාසල්වලට හඳුන්වා දීමට කටයුතු යොදා ඇත.

- සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති සැකසීම
- සෞඛ්‍ය ප්‍රවර්ධන සඳහා අවශ්‍ය නිපුණතා වර්ධනය
- සෞඛ්‍ය ප්‍රවර්ධනයට හිතකර පරිසරයක් ඇති කිරීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පාසල් ප්‍රජා සබඳතා වර්ධනය
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය සේවාවන් ලබාදීම

පාසල් සෞඛ්‍ය වැඩසටහනින් පහත සඳහන් අරමුණු අපේක්ෂා කෙරේ.

- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීමෙහිලා, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල ඇති සහයෝගය හා සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම.
- පාසල් ළමුන්ගේ පූර්ණ වර්ධනය සහ සංවර්ධනය සඳහා අවශ්‍ය අවස්ථා හඳුනා ගැනීම
- සුදුසු සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් මගින් පාසල් ළමුන්ට තමන්ගේ සෞඛ්‍යයට බලපාන හේතු සාධක පාලනය කිරීම හා ප්‍රවර්ධනය කිරීමට ඇති හැකියාවන් වැඩිදියුණු කිරීම
- පවුල හා සමාජය තුළ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා විපර්යාස කාරකයන් ලෙස කටයුතු කිරීමට පාසල් ළමුන් තුල ඇති හැකියාව වැඩිදියුණු කිරීම
- ඉගෙනීම හා ඉගැන්වීම සඳහා සුදුසු පරිදි පාසල් පරිසරය සෞඛ්‍යවත් ලෙස හා ආරක්ෂාකාරී ලෙස සකස් කිරීම
- බෝ වන හා බෝ නොවන රෝගවලින් පාසල් දරුවන් ආරක්ෂා කිරීම
- සෞඛ්‍ය ගැටළු හැකි ඉක්මනින් හඳුනා ගෙන පිළියම් කිරීම සඳහා පාසල් ළමුන් වෛද්‍ය පරීක්ෂණවලට ලක් කිරීම

- නිතිපතා සොයා බැලීම් හා සුදුසු මැදිහත්වීම් තුලින් පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීම හා හිතකර සෞඛ්‍ය පුරුදු ප්‍රගුණ කිරීම
- පාසල් සෞඛ්‍ය කටයුතු සංවර්ධනය සඳහා උපරිම ප්‍රජා සහභාගීත්වය ලබා ගැනීම
- පාසල් සෞඛ්‍ය වැඩසටහනේ සාර්ථකත්වය සඳහා නියාමන හා ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම

පළාත් මට්ටමින් එම වගකීම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතද, දිස්ත්‍රික් මට්ටමින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතද පැවරී ඇත. පාසල් සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී දිස්ත්‍රික් මට්ටමින් මාතෘ හා ළමා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්වරුන්, ප්‍රාදේශීය මට්ටමින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරුන්ද (නගර සභා බල ප්‍රදේශ තුල ප්‍රධාන වෛද්‍ය නිලධාරීන්/පාසල් වෛද්‍ය නිලධාරීන්ද) කේන්ද්‍රීය වගකීම දරණ නිලධාරීන් බවට පත්වේ. ඔවුන්ගේ අධීක්ෂණය යටතේ පාසල තුල පාසල් සෞඛ්‍ය වැඩසටහන සංවිධානය කිරීමේ වගකීම මහජන සෞඛ්‍ය පරීක්ෂක සතු වේ. මෙම වැඩසටහන රජයේ සියලු පාසල් හා පිරිවෙන් පාසල්වලට පෞද්ගලික පාසල්වලද (උපකෘත පාසල්), ක්‍රියාත්මක වන නමුත් ඇතැම් ජාත්‍යන්තර පාසල්වල ක්‍රියාත්මක නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. මෙම වැඩසටහන නිර්ණායක 23ක් යටතේ ඇගයීමට ලක් වේ. විස්තර ඇමුණුම 02හි දැක්වේ.

### 3.3.8.2 ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශයේ නියාමනය

සෞඛ්‍ය අමාත්‍යාංශයේ පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ මාතෘ හා ළමා සෞඛ්‍ය අධ්‍යක්ෂකගේ අංක FHB/SH/Gen/2020 දරන 2020 සැප්තැම්බර් 07 දිනැති ලිපිය අනුව පාසල් වෛද්‍ය පරීක්ෂණය සඳහා ඉල්ලීම් කර ඇති පාසල්වල පමණක් වෛද්‍ය පරීක්ෂණ සිදුකර ඇති බව දන්වා ඇත.

එහෙත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කරන ලද පාසල් සෞඛ්‍ය වැඩසටහන චක්‍රලේඛ අංක 01-37 (2007 (i)) මගින් සියළු පාසල් දරුවන් වෙත සෞඛ්‍ය සේවාව සැපයීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත. මේ සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) පාසල් වෛද්‍ය පරීක්ෂණය සඳහා ඉල්ලීම් කර ඇති ජාත්‍යන්තර පාසල්**

ජාත්‍යන්තර පාසල් සම්බන්ධ විධිමත් දත්ත පද්ධතියක් නැති නමුත්, අධ්‍යාපන අමාත්‍යාංශයට වාර්තා වී ඇති ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව 391ක් වන අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පාසල් වෛද්‍ය පරීක්ෂණය සඳහා ඉල්ලීම් කර ඇති පාසල් සංඛ්‍යාව 151 ක් වේ. ඒ අනුව මෙය ඉතාම පහළ අගයක් එනම් සමස්ත පාසල් සංඛ්‍යාවෙන් සියයට 40ක් පමණ බව නිරීක්ෂණය වේ.

| | දිස්ත්‍රික්කය | අධ්‍යාපන ආමාත්‍යාංශ දත්ත අනුව ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව | පාසල් වෛද්‍ය පරීක්ෂණය සිදු කරගත් ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) | කොළඹ | 98 | 07 |
| (ii) | ගම්පහ | 79 | 09 |
| (iii) | මහනුවර | 44 | 35 |
| (iv) | මාතලේ | 12 | 15 |
| (v) | මාතර | 9 | 04 |
| (vi) | අනුරාධපුර | 3 | 03 |
| (vii) | පොලොන්නරුව | 1 | 03 |
| (viii) | කුරුණෑගල | 28 | 0 |
| (ix) | මන්නාරම | 2 | 0 |
| (x) | යාපනය | 3 | 04 |
| (xi) | වව්නියාව | 4 | 02 |
| (xii) | අම්පාර | 3 | 02 |
| (xiii) | මඩකලපුව | 3 | 02 |
| (xiv) | කළුතර | 16 | 02 |
| (xv) | ගාල්ල | 13 | 09 |
| (xvi) | හම්බන්තොට | 0 | 01 |
| (xvii) | නුවරඑළිය | 13 | 15 |
| (xviii) | බදුල්ල | 6 | 10 |
| (xix) | මොනරාගල | 0 | 0 |
| (xx) | රත්නපුර | 13 | 13 |
| (xxi) | කල්මුනෙයි | 0 | 01 |
| (xxii) | කිලිනොච්චි | 0 | 01 |
| (xxiii) | කෑගල්ල | 17 | 10 |
| (xxiv) | පුත්තලම | 19 | 0 |
| (xxv) | ත්‍රිකුණාමලය | 5 | 03 |
| | | ----- | ----- |
| | | 391 | 151 |
| | | === | === |

ඉහත තොරතුරු අනුව, මාතලේ, මොණරාගල, හම්බන්තොට, පොළොන්නරුව, යාපනය, නුවරඑළිය, බදුල්ල, කල්මුණෙයි සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කවල පවතින ජාත්‍යන්තර පාසල් සියල්ලම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුනාගෙන නොමැති බව නිරීක්ෂණය විය. එමෙන්ම ජාත්‍යන්තර පාසල් බහුලව පවතින කොළඹ හා ගම්පහ දිස්ත්‍රික්කවල පවත්වාගෙන යන ජාත්‍යන්තර පාසල් 177කින් පාසල් සෞඛ්‍ය පරීක්ෂණ සිදුකර ඇත්තේ පාසල් 16ක් වැනි ඉතා අඩු ප්‍රමාණයක පමණි. එසේම සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කුරුණෑගල, මන්නාරම හා පුත්තලම දිස්ත්‍රික්කවල කිසිදු ජාත්‍යන්තර පාසලක පාසල් සෞඛ්‍ය පරීක්ෂණ සිදුකර නොමැති බව නිරීක්ෂණය විය.

**(ආ) ජාත්‍යන්තර පාසල්වල ජල සැපයුම**

මේ සම්බන්ධව සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව පහත නිර්ණායක ඔස්සේ පරීක්ෂා කර තිබුණි.

- ජල සැපයුම් මූලාශ්‍රය (Water Supply -Source)
- ජල සාම්පල ලබා ගැනීම්
- ලද ජල විශ්ලේෂණ වාර්තා

- ජල සැපයුම් (Water Adequacy)
- ජල සැපයුමේ සුරක්ෂිත බව
- පානීය ජලය ලබාගත හැකි බව (Water Supply Availability)
- පානීය ජල සැපයුම් මනින ලද සංඛ්‍යාව

සෞඛ්‍ය අමාත්‍යාංශය විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) අනාරක්ෂිත ළිං මගින් ජලය ලබා ගැනීම**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව පරීක්ෂාවට ලක් කළ ජාත්‍යන්තර පාසල් 151 න් පාසල් 02 ක් අනාරක්ෂිත ළිං මගින් ජලය ලබා ගන්නා පාසල් බව නිරීක්ෂණය කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ම.සෞ.ප කොට්ඨාශ |
|---|---|
| ගම්පහ | කල්එළිය |
| බදුල්ල | බණ්ඩාරවෙල |

ය

**(ii) ජල සැපයුම අනාරක්ෂිත වීම**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ මාර්ගෝපදේශ අනුව පරීක්ෂාවට ලක් කළ පාසල් 151 න් පාසල් 05 ක ජල සැපයුම ආරක්ෂිත නොවන බව නිරීක්ෂණය කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

| දිස්ත්‍රික්කය | ම.සෞ.ප කොට්ඨාශ |
|---|---|
| පොළොන්නරුව | තඹල |
| මහනුවර | ගලහා |
| කෑගල්ල | අල්ගම |
| රත්නපුර | රක්වාන |
| රත්නපුර | එරත්න |

**(ඇ) ජාත්‍යන්තර පාසල්වල වැසිකිළි පහසුකම්**

සෞඛ්‍ය අමාත්‍යාංශ මාර්ගෝපදේශ අනුව ජාත්‍යන්තර පාසල් 152ක වැසිකිළි පහසුකම් පරීක්ෂාවේදී පාසල් 12ක පවතින වැසිකිළි ප්‍රමාණවත් නොවන බවත්, එහි ජල පහසුකම් ප්‍රමාණවත් නොවන බවත් නිරීක්ෂණය කර තිබුණි.

**(ඇ) ජාත්‍යන්තර පාසල්වල කසල කළමනාකරණය හා පාරිසරික කරුණු**

සෞඛ්‍ය අමාත්‍යාංශ මාර්ගෝපදේශ අනුව පරීක්ෂාවට ලක් කරන ලද ජාත්‍යන්තර පාසල් 152කින් කසල කළමනාකරණය හා අනෙකුත් පාරිසරික කරුණු සම්බන්ධ පහත නිරීක්ෂණයන් කර තිබුණි. විස්තර පහත දැක්වේ.

**(i) විධිමත්ව කසල බැහැර නොකරන ලද පාසල්**

විධිමත්ව කසල බැහැර නොකරන ලද පාසල් 13ක් නිරීක්ෂණය කර තිබුණු අතර මේ හේතුවෙන් සිසුන්ගේ සෞඛ්‍යමය හා පාරිසරික ගැටළු ගණනාවක් ඇති වීමට ඉඩකඩ සැලසී තිබුණි.

(ii) පරීක්ෂා කරන ලද පාසල් 152කින් පාසල් පරිශ්‍රයන් පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශ නිර්දේශ පහත පරිදි වේ.

- මදුරුවන් බෝවන ස්ථාන සහිත පාසල් සංඛ්‍යාව - 09
- මැසසන් බෝවන ස්ථාන පැවති පාසල් සංඛ්‍යාව - 06
- අනතුරු විය හැකි ස්ථාන සහිත පාසල් සංඛ්‍යාව - 10
- නිදැල්ලේ හැසිරෙන සතුන් සහිත පාසල් සංඛ්‍යාව - 27
- සෙල්ලම් මිදුල් රහිත පාසල් සංඛ්‍යාව - 36
- ගෙවත්තක් රහිත පාසල් සංඛ්‍යාව - 44
- පිරිසිදු වටපිටාවක් රහිත පාසල් සංඛ්‍යාව - 07

**(ඉ) ජාත්‍යන්තර පාසල්වල ආපනශාලා**

ජාත්‍යන්තර පාසල් 152ක සෞඛ්‍යමය දත්ත පරීක්ෂාවේදී ඉන් පාසල් 66ක ආපනශාලා නොමැති බවට සෞඛ්‍ය අංශ තහවුරු කරගෙන ඇති අතර, පාසල් ආපනශාලා ප්‍රතිපත්තිය අනුව කටයුතු නොකරන ලද පාසල් සංඛ්‍යාව 37ක් විය.

**(ඊ) ජාත්‍යන්තර පාසල්වල ක්‍රීඩාංගන පහසුකම්**

පාසල් දරුවකුගේ කායික, මානසික නීරෝගීතාවය සඳහා ක්‍රීඩාව අත්‍යාවශ්‍ය මෙවලමක් වේ. පාසලක තිබිය යුතු භෞතික පහසුකම් අතර ක්‍රීඩා පිට්ටනිය හා ක්‍රීඩාගාර යනු පාසලක තිබිය යුතු අත්‍යවශ්‍ය සාධකයකි. නමුත් ජාත්‍යන්තර පාසල්වල සිසුන්ට ක්‍රීඩා කිරීමට ක්‍රීඩාංගන පහසුකම් පවතින බවට අධ්‍යාපන හෝ සෞඛ්‍ය අංශ විසින් තහවුරු කර ගැනීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. මේ අනුව ඒම පාසල්වල සිසුන්ට ඒම වයස් සීමාවන්ට සරිලනසේ අවශ්‍ය වන ශාරීරික ක්‍රියාකාරකම් නොලැබීම හේතුවෙන් අනාගත පරපුර අතර, බෝනොවන රෝග සෑදීමේ වැඩි ඉඩකඩක් පවතින බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

**3.3.8.3කොවිඩ් 19 වසංගතය කාලය තුල උපදෙස් පිළිපැදීම**

කොවිඩ් 19 වසංගත කාල සීමාව තුල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව කටයුතු කරන ලද ජාත්‍යන්තර පාසල් ඇති බව විගණනයේදී

නිරීක්ෂණය විය. නිදසුනක් ලෙස මීගමුව ප්‍රදේශයේ ජාත්‍යන්තර පාසලක ගුරුවරුන් පිරිසක් 2020 ඔක්තෝබර් 06 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශය වෙත දන්වා ඇත්තේ කොවිඩ් 19 වසංගත තත්ත්වය පවතින ප්‍රදේශවල සිට සේවයට වාර්තා කරන ලෙසයි.

**3.3.9 ජාත්‍යන්තර පාසල් සිසුන් සුරක්ෂා රක්ෂණාවරණය සඳහා දායක කර ගැනීම**

ජාත්‍යන්තර පාසල් නියාමනය කිරීම සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යශය කිසිඳු මැදිහත්වීමක් නොකරන නමුත් රජයේ අයවැය යෝජනාවක් අනුව රජයේ පාසල් ළමුන් වෙනුවෙන් ලබාදෙන සුරක්ෂා සෞඛ්‍ය රක්ෂණාවරණ ක්‍රමයේදී පමණක් එම පාසල් ද සම්බන්ධ කරගෙන ඇත. මෙම ජාත්‍යන්තර පාසල් නිශ්චිත වශයෙන්ම පවතී ද යන්න පිළිබඳ භෞතික පරීක්ෂාවක් සිදුකර නොතිබියදී, සංගණන අංකයක් පමණක් ලබා දී ඇති අතර අවස්ථා 308කදී රු.13,561,516 ක මුදලක් ජාත්‍යන්තර පාසල් 64 ක ඉගෙනුම ලබන සිසුන් වෙනුවෙන් වන්දි මුදල් ලෙස ලබා දී තිබුණි.

**3.3.10 ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් ලැබෙන නියෝජනයන්**

ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් දෙමාපියන් හා විවිධ පාර්ශවයන් විසින් වරින්වර ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කර තිබුණි. එහෙත් මෙම ලිඛිත නියෝජනයන් සඳහා මැදිහත් වීමට අධ්‍යාපන අමාත්‍යාංශයට විධිමත් බලතල නොමැති බැවින් අදාල පාසලේ විදුහල්පති /කළමණාකාරීත්වය අමතා යම් උපදෙස් ලබාදීමක් පමණක් සිදුකරනබව විගණනයේදී නිරීක්ෂණය විය. එසේ වුවද එම උපදෙස් ලබාදීම මගින් පවතින ගැටළු නිවැරදි නොවන බවට ඉහත පරිච්ඡේදයන්වල ඉදිරිපත් කරන ලද විගණන නිරීක්ෂණයන් අනුව පැහැදිලි වේ.

**3.3.10.1ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන ළමුන්ට සිදුවන කායික/මානසික හිංසන සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීම**

විස්තර පහත පරිදි විය.

(අ) විවිධ ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන සිසුන්ට පාසලේ කළමනාකාරිත්වයෙන්/ ගුරුවරුන්ගෙන් සිදුවන කායික/මානසික අපයෝජන හා හිංසාවන් පිළිබඳ දෙමාපියන් විසින් වරින්වර අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයට පැමිණිලි ඉදිරිපත් කර තිබුණි. මෙම පැමිණිලි ඉදිරිපත් කිරීම තුළින් එම දෙමාපියන් තම දරුවන්ට සිදුවූ අකටයුතුකම් සඳහා යම් නෛතික ආවරණයක්/ සහනයක් බලාපොරොත්තු වී තිබූ අතරම ඉදිරියේදී අනෙකුත් දරුවන්ට එවැනි ගැටළු ඇති නොවීමට සුදුසු වටපිටාවක්ද බලාපොරොත්තු වී තිබුණි. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙවැනි ගැටළුවලදී මැදිහත්වීමට නෛතික ප්‍රතිපාදන නොමැති බව දක්වා අදාල පාසලටම පැමිණිල්ල විසඳාගැනීමට යොමුකිරීම හෝ අදාල රාජ්‍ය ආයතනයකට පැමිණිල්ල යොමු කිරීම පමණක් සිදු කරනු ලබයි.

(ආ) මෙවැනි පැමිණිලිවලට නිදසුනක් ලෙස 2020 සැප්තැම්බර් 23 දින එක් ජාත්‍යන්තර පාසලක දෙමාපියන් 2300 කට අධික පිරිසක් විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට හා ජාතික ළමාරක්ෂක අධිකාරියට වාර්තා කර ඇත්තේ වත්මන් කළමනාකාරිත්වයේ අයහපත් හැසිරීම නිසා එහි දරුවන්ට ලිංගික කරදර, හිරිහැර, තර්ජනය කිරීම් හා බලය අනිසි ලෙස යෙදීම පිළිබඳ මැදිහත්වන ලෙසයි.

(ඇ) මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ 2020 දෙසැම්බර් හා අංක ED/03/10/02/02/23(iii) දරන ලිපියෙන් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් අමතා දක්වා ඇත්තේ මෙම ගැටළුව සඳහා සම්බන්ධ විය නොහැකි බැවින් ළමාරක්ෂක අධිකාරියට පැවරී ඇති බලතල අනුව අවශ්‍ය පියවර ගැනීමට යොමු කරන බවයි. ඒ අනුව පවතින ගැටළුවලදී අධ්‍යාපන අමාත්‍යාංශයට විය හැකි මැදිහත්වීම අවම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

**3.3.10.2ජාත්‍යන්තර පාසල් සම්බන්ධ වෙනත් පැමිණිලි**

ඉහත දක්වන ලද ගැටළුවලට අමතරව ජාත්‍යන්තර පාසල් සම්බන්ධව විවිධාකාරයේ ලිඛිත මහජන නියෝජනයන් ලැබී තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය. එහිදි ලිඛිත නියෝජන යොමු කල පාසල් අතර දරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි ඒවා පවත්වාගෙන යාමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව එවැනි පාසල් 11ක් සම්බන්ධයෙන් ලිඛිත නියෝජන ලැබී තිබූ අතර ඉන් බොහොමයක් ලිඛිත නියෝජන දරැවන්ට අමානුෂික ලෙස සැලකීම, විනය කරුණු පිළිබඳ හා වෙනත් පහසුකම් පිළිබඳ ගැටළු විය.

**3.3.10.3ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට ගුරුවරුන්ගෙන්/ සේවකයන්ගෙන් ලද ලිඛිත මහජන නියෝජන**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 10 කට අධික කාලයක් සේවය කළද ඔවුන් ස්ථිර නොකරන බව, වැටුප් වර්ධක නොගෙවන බව, ක්ෂණිකව සේවයෙන් නෙරපා හරින බව නුගේගොඩ ජාත්‍යන්තර පාසලක සේවකයෙකු 2018 මැයි 04 දින අධ්‍යාපන අමාත්‍ය වෙත දන්වා ඇති අතර එම ජාත්‍යන්තර පාසල් ජාලයේ සේවක වැටුප් මද බව, ගිවිසුම් අත්සන් කිරීමේදී අසාධාරණ වගන්ති ඇතුලත් කිරීම, අවම මාතෘ පහසුකම්, වෛද්‍ය ප්‍රතිලාභ නොමැතිවීම පිළිබඳව ගුරුවරුන් ද පැමිණිල්ලක් කර ඇත.

(ii) ගවර් වීදිය, කොළඹ 05 හි පිහිටි ජාත්‍යන්තර පාසලක සුදුසුකම් නොමැති ගුරුවරුන් බඳවා ගන්නා අතර, ඔවුන්ට පත්වීමේ ලිපියක්වත් විධිමත්ව ලබා නොදෙන බව, රාජකාරී කාලයක් නියමිතව නොමැති අතර, සියලු නිවාඩු දිනවල පවා සේවයට කැඳවන බව, විධිමත් දීමනා, වැටුප්, උසස්වීම් ආදී සේවක ප්‍රතිලාභ නොගෙවන බවට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිතව සඳහන් කර තිබුණි.

### 3.3.11 ජාත්‍යන්තර පාසල් සම්බන්ධව රාජ්‍ය තාන්ත්‍රික මට්ටමින් ඇති උනන්දුව

මෙරට ජීවත්වන විවිධ මට්ටමේ විදේශීය ප්‍රජාවගේ දරුවන් අධ්‍යාපනය හදාරන ආයතන ඇතුළු ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් විවිධ රාජ්‍ය ත්‍රාන්තික මට්ටමින් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් වරින් වර විමසීම් කරනු ලබයි. නමුත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ සඳහා සාධනීය මැදිහත් වීමක් නොකරන්නේ අවශ්‍ය නෛතික ප්‍රතිපාදන නොමැති බව පවසමිනි. මේ තත්ත්වය රාජ්‍ය ත්‍රාන්තික මට්ටමින් සිදුවන ගනුදෙනුවලදී ශ්‍රී ලාංකේය කීර්තිනාමයට අයහපත් බලපෑමක් විය හැකි බව විගණනයේ අදහස වේ. විස්තර පහත පරිදි විය.

**(අ) කොළඹ වරාය නගරයේ ජාත්‍යන්තර පාසලක් ඉදිකිරීම**

"රාජ්‍ය පෞද්ගලික හවුල් කාරිත්වය (PPP) මගින් කොළඹ වරාය නගරය තුල රජයට ගොඩකරන ලද ඉඩම් හි ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය, ජාත්‍යන්තර පාසල හා රෝහල් ආදී කඩිනම් සංවර්ධන කාර්යයන් සඳහා උපාය මාර්ගික ආයෝජකයන් සෙවීමේ යෝජනා" යන මැයෙන් මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2019 අගෝස්තු 19 දින පිළියෙල කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ CP19/2388/116/016-II අංක දරන හා 2019 අගෝස්තු 27 දිනැති ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව උක්ත කැබිනට් සංදේශයේ දක්වා ඇති කොළඹ වරාය නගරයේ ඉදිකිරීමට අපේක්ෂිත ජාත්‍යන්තර පාසල සම්බන්ධ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිරීක්ෂණ ඉල්ලා ඇත. මෙම ලිපියට පිළිතුරු දක්වමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයේ අධ්‍යක්ෂකවරයා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (සැලසුම්) වෙත දක්වා ඇත්තේ මෙම කරුණු සම්බන්ධව මතයක් ලබා ගැනීම ආයෝජන මණ්ඩලය (BOI) වෙතින් කිරීම සුදුසු බවයි. ඒ අනුව විගණනයේදී නිරීක්ෂණය වන්නේ මෙවැනි අන්තර්ජාතික කටයුතුවලදී පවා අධ්‍යාපන කාර්යයන් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට මැදිහත්වීමක් සිදු කළ නොහැකි බවයි.

(ආ) පාකිස්තානු ඉස්ලාමීය ප්‍රජාත්‍රාන්ත්‍රික මහ කොමසාරිස් කාර්යාලය විසින් 201 ජූලි 10 දින මෙරට ජාත්‍යන්තර පාසල් විසින් ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) අයකිරීමේ ඇති නෛතික තත්ත්වයන්හි දුර්වලතාවයන් පිළිබඳව දක්වා ඇත.

### 3.3.12 ජාත්‍යන්තර පාසල් සම්බන්ධව විවිධ රාජ්‍ය ආයතන මගින් කරනු ලබන ඉල්ලීම්

විවිධ කරුණු සම්බන්ධව රාජ්‍ය ආයතන මට්ටමින් ජාත්‍යන්තර පාසල් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයෙන් කරුණු විමසීම් කරනු ලබයි. එයින් අදහස් වන්නේ ජාත්‍යන්තර පාසල් ස්ථාපිත කිරීම, පවත්වාගෙන යාම සම්බන්ධ නියමිත අධිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය බවට සමස්ත ප්‍රජාව විශ්වාස කිරීමයි. නමුත් මෙම සියළු විමසීම්වලදී අධ්‍යාපන අමාත්‍යාංශය තමන්ගේ මැදිහත්වීමක් නොමැති බවට ඒ ඒ ආයතනවලට පිළිතුරු ලෙස ලබා දුන්නද ස්ථිරසාර පිළිතුර එය නොවන බව විගණනයේදී නිරීක්ෂණය විය. ඉදිරිපත් වූ එවැනි ඉල්ලීම් කිහිපයක් පහත දැක්වේ.

(අ) 2018 මැයි 03 දින ජනාධිපති විශේෂ ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන ලේකම් ඇමතූ ලිපියක් අනුව ජාත්‍යන්තර පාසලක් කුලී පදනමෙන් ඉවත්ව වැලිවිට ප්‍රදේශයේ ඔවුන්ගේම ගොඩනැගිල්ලක් තැනීමට යාමේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිශ්කාශණ (Clearance) සහතිකයක් ඉල්ලා සිටීම පිළිබඳව අවධානය යොමු කර තිබුණි.

(ආ) මීගමුව පිහිටි ජාත්‍යන්තර පාසලක ඉගෙනුම ලබන සිසුන් දෙදෙනකුගේ පන්ති තහනම් කිරීම් සම්බන්ධව 2018 මැයි 18 දින අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාතික අධිකාරිය විසින් අධ්‍යාපන ලේකම් අමතා තිබුණි.

(ඇ) තොරතුරු දැන ගැනීමේ පනත යටතේ දෙමව්පියෙකු විසින් 2019 ඔක්තෝබර් 15 දින තොරතුරු දැනගැනීමේ පනත යටතේ කොළඹ ප්‍රදේශයේ ජාත්‍යන්තර පාසල් ප්‍රමිතිය පරීක්ෂා කිරීමේ නිර්ණායක පිළිබඳව හා අධීක්ෂණ වාර්තාවද ඉල්ලා තිබුණි.

(ඈ) ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් 2020 සැප්තුම්බර් 18 දින දෙමව්පියෙකු විසින් අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අංශයෙන් කරන ලද ඉල්ලීමක දක්වා ඇත්තේ කෑගල්ල ජාතික පාසලක ඉගෙනුම ලැබූ නිවුන් දරුවන් කෑගල්ල ජාත්‍යන්තර පාසලකට ඇතුලත් කිරීමේදී 7 වසරට ඇතුලත් කලයුතු නිවුන් දරුවන්ගෙන් එක් දරුවකු 5 වසරට ඇතුලත් කර ඇති බැවින් මේ සම්බන්ධ කෑගල්ල දිසා අධිකරණයේ නඩුවක්ද පවරා ඇති බවයි.

කෙසේවුවද ජාත්‍යන්තර පාසල් සම්බන්ධයෙන් මහජන නියෝජන ලැබෙන සෑම අවස්ථාවකදීම අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිතුර වන්නේ ඔවුන්ට ඒ සඳහා මැදිහත්වීමක් සිදු කල නොහැකි බවයි. ඒ අනුව මෙවැනි ගැටළු විසඳා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොමැති වීම තුල එම ගැටළු අධිකරණය වෙත යොමු වේ.

### 3.4 ආගමික පාසල්

#### 3.4.1 අධ්‍යාපනයේ අවශ්‍යතාවය

මෙම වාර්තාවේ 3.1 ඡේදය යටතේ දක්වා ඇති පරිදි අධ්‍යාපන ආඥා පනත අනුව සියළු දෙමාපියන් අනිවාර්යයෙන් වයස අවු. 5-14 අතර, දරුවන් හට පාසල් අධ්‍යාපනය ලබා දිය යුතුය. එසේම එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුවද විශ්ව ව්‍යාප්ත මට්ටමින් සෑම ළමයෙකුම භුක්ති විදිය යුතු අයිතිවාසිකම් තහවුරු කිරීම වැඩිහිටියන්ගේ මෙන්ම රාජ්‍යයන්ගේ වගකීම බවද අවධාරනය කරයි. මෙම සම්මුතියේ 28 වන වගන්තිය අනුව අධ්‍යාපනය ලැබීමට සියලු ළමුන්ට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්යය කිරීමටත්, එය නොමිලේ ලබා දීමට කටයුතු කිරීමත් රජයේ වගකීම බව දක්වා ඇත. එසේම මෙහි 29 වන වගන්තිය අනුව අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ළමයාගේ පෞරුෂත්වය, දැනුම, කුසලතා සහ මානසික ශාරීරික හැකියාවන් පරිපූර්ණ වර්ධනය කිරීමයි. වගකීමෙන්, සාමකාමීව නිදහස් සමාජයක ජීවත් වීමටද අනිත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වටහා ගෙන පරිසරයට ගරු කරමින් ජීවත් වීමටද අධ්‍යාපනය තුළින් ළමුන් සූදානම් කල යුතුය.

එසේම 2016 වසරේ පිළියෙල කර ඇති යෝජිත සාමාන්‍ය අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුව ද, ළමයින් ජීවත්වන සමාජය ඔවුන්ට තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සහ වැඩිහිටියන් සමඟ එක්ව ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා සූදානම් කර තැබීම සාමාන්‍ය අධ්‍යාපනයෙන් කළ යුතු වේ. ඔවුන් පාසල හැරයන විට සැබැවින්ම වැඩිහිටියන් බවට පත්වන අතර ඔවුන්ගේ පවුලේ, ජීවත් වන සමාජයේ සහ සමස්තයක් වශයෙන් ජාතියේ ම සුභසාධනය සඳහා දායකත්වය ලබාදීමට හැකිවන ලෙස දැනුම සහ අනෙකුත් නිපුණතාවලින් ළමයින් සන්නද්ධ කළ යුතු වේ. නමුත් වර්තමානයේ ශ්‍රී ලංකාවේ ඇතැම් ආගමික පාසල් විසින් අනිවාර්යය අධ්‍යාපනය හදාරන වයසේ දරුවන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබානොදෙන බවත්, එවැනි ආයතන නියාමනය නොවන බවත් පහත කරුණු අනුව නිරීක්ෂණය විය.

#### 3.4.2 ආගමික පාසල් වර්ගීකරණය (සති අන්ත දිනවල පවත්වන දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳව මෙහිදී සාකච්ඡා නොකෙරේ)

ශ්‍රී ලංකාවේ ආගමික පාසල් මූලික වශයෙන් බෞද්ධ, හින්දු, කතෝලික හා ඉස්ලාම් වශයෙන් තම ආගම මුල්කර ගනිමින් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් ලබාදුන් දත්ත අනුව ආගමික පාසල් සඳහා දරුවන් යොමුවී ඇති ආකාරය පහත පරිදි විය.

| ආගම | ආයතන සංඛ්‍යාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| බෞද්ධ - පිරිවෙන් අධ්‍යාපනය (2019) | 801 | 68,319 |
| - සීලමාතා ආයතන | 03 | 45 |
| හින්දු - පූජකවරුන් උදෙසා | 03 | 40 |
| කතෝලික - කන්‍යාරාම, සෙමනේරි | 04 | 16 |
| ඉස්ලාම් - අරාබි පාසල්/ මද්‍රසා පාසල් | 317 | 28,424 |

මෙම එක් එක් ආගමික අධ්‍යාපනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

### 1.2.4.3 බෞද්ධ/ පිරිවෙන් ආගමික අධ්‍යාපනය

බෞද්ධ පුද්ගලයන්ට පූජකත්වයට පත්වීම සඳහා ලබාදෙන අධ්‍යාපනය පිරිවෙන් අධ්‍යාපනය වේ. පිරිවෙන් අධ්‍යාපනය සම්බන්ධව ස්ථාපිත කර ඇති 1979 අංක 64 දරන පිරිවෙන් අධ්‍යාපන පනතේ අරමුණු ලෙස භික්ෂූන් වහන්සේලාට හා පිරිවෙනක පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට කැමැත්තෙන් සිටින්නා වූ බෞද්ධ පරිසරයක ස්වකීය අධ්‍යාපනය ලැබීමට අපේක්ෂා කරන්නා වූ ද වයස අවුරුදු 14 ඉක්ම වූ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට අධ්‍යාපන පහසුකම් සැලසීම පිරිවෙන් අධ්‍යාපනයේ අරමුණ වේ. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාපිත පිරිවෙන් අධ්‍යාපන ඒකකය මගින් මෙම පිරිවෙන් කටයුතු පරිපාලනය වන අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත් වීමෙන් ජාතික අධ්‍යාපන ආයතනය සමඟ පිරිවෙන් විෂය නිර්දේශ ගුරු පුහුණු, ගුරු අත්පොත් ආදිය සම්බන්ධව කටයුතු සිදු වේ. මෙම පිරිවෙන් අධීක්ෂණය කිරීමේ වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් ඒකකයෙන් සිදු කෙරේ. උක්ත කරුණු අනුව බෞද්ධාගම පිළිබඳ පවත්වාගෙන යන පිරිවෙන් අධ්‍යාපනය පිළිබඳ (පෙර අධ්‍යාපන අමාත්‍යාංශය මගින්) වර්තමානයේදී අදාල රාජ්‍ය අමාත්‍යාංශය විධිමත් නියාමනයක් සිදු කිරීමට බැඳී සිටී.

### 3.4.2.2කතෝලික (සෙමනේරි/ කන්‍යාරාම) අධ්‍යාපනය ලබාදෙන ආයතන

ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 පෙබරවාරි 09 දිනැති අංක ක්‍රිකදෙ/සං/විවිධ/වා/ස/ති/2020-21 දරණ ලිපිය අනුව දිවයින පුරා කතෝලික දෙව්සත්හල් 04ක් ක්‍රියාත්මක වන බවත් , මෙම අධ්‍යාපන ආයතනවල ආගමික අධ්‍යාපනය ලබාදෙන්නේ සාමාන්‍ය අධ්‍යාපනය නිම කරන ලද වයස් මට්ටම්වල සිටින අය සඳහා බවත් අනාවරණය විය.

### 3.4.2.3හින්දු අධ්‍යාපනය ලබාදෙන ආයතන

හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 ජනවාරි 08 දිනැති අංක HA/5/GEN/39-2021 දරණ ලිපිය අනුව දිවයින පුරා හින්දු ආගමික පූජකවරුන් ලෙස

අධ්‍යාපනය ලබාදෙන ආයතන 03ක් ක්‍රියාත්මක වන බවත්, මෙම අධ්‍යාපන ආයතනවල ආගමික අධ්‍යාපනය ලබාදෙන්නේ සාමාන්‍ය අධ්‍යාපනය නිම කරන ලද වයස් මට්ටම්වල සිටින අය සඳහා බවත් අනාවරණය විය.

### 3.4.2.4 අරාබි පාසල්/ මද්‍රසා පාසල්

මෙම පාසල් අධ්‍යාපන අමාත්‍යාශයේ නියාමනයකින් තොරව අනිවාර්යය අධ්‍යාපන වයසේ සිටින දරුවන් සඳහා නියමිත පිළිගත් සාමාන්‍ය අධ්‍යාපනයෙන් බැහැරව ක්‍රියාත්මක වන බවත්, මූලික වශයෙන් අරාබි භාෂාව හා ඉස්ලාම් දැනුම ලබාදීම සඳහා පිහිටුවා ඇති බවත් අනාවරණය විය. මේ සම්බන්ධ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ දායකත්වය**

මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව ස්ථාපනය කිරීමට පෙර එවකට අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබූ අරාබි පාසල්වල පරිපාලනය 1980 දශකයේ මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවීමත් සමඟ එයට භාර දී ඇත. එම දෙපාර්තමේන්තුව මගින් මෙම ආයතන ලියාපදිංචි කිරීමේදී එම ආයතන සඳහා ඇති භෞතික පහසුකම් මත මූල්‍ය ශක්තිය, කළමනාකරණ මණ්ඩලය, විෂය නිර්දේශය, සිසුන් හා ගුරුවරුන් පිළිබඳ තොරතුරු, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් වාර්තා මගින් තොරතුරු ලබාගන්නා බව දක්වා ඇත. මෙම අරාබි පාසල්වල ඉගෙනුම ලබන සිසුන් සඳහා "අල්-ආලිම්" පාඨමාලාව සඳහා වන විෂය නිර්දේශය 1961 දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකසන ලදුව 1976 දී හා 2012 දී නැවත සංශෝධනය කර ඇත. මෙම විභාගයන් විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලැබේ. 2020 අගෝස්තු 13 දින වන විට මෙම පාසල් 317 ක් මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කර ඇත. මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුව මගින් මෙම පාසල්වල සංවර්ධන කටයුතු සඳහා 2015-2019 තෙක් පහත පරිදි අරමුදල් ලබා දී තිබුණි.

| වර්ෂය | දිස්ත්‍රික් සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | මුදල රු. |
|---|---|---|---|
| 2015 | 04 | 04 | 698,066 |
| 2016 | 04 | 04 | 100,000 |
| 2017 | 06 | 07 | 975,000 |
| 2018 | 05 | 06 | 2,600,000 |
| 2019 | 01 | 01 | 400,000 |
| | | ---- | ----------- |
| | | 22 | 4,773,066 |

**(ආ) අරාබි පාසල්/ මදුසා පාසල්වල ව්‍යාප්තිය**

2020 අගෝස්තු 19 දින මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවෙන් ලද වාර්තාවට අනුව එහි ලියාපදිංචි වී ඇති අරාබි පාසල් 317 ක් පහත පරිදි කාණ්ඩ 4 ක් යටතේ ස්ථානගත වී ඇත.

| පාසල් වර්ගය | සංඛ්‍යාව | ළමුන් සංඛ්‍යාව | ගුරුවරුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ අරාබි පාසල් | 19 | 3,117 | 390 |
| (ii) අරාබි පාසල් | 93 | 11,269 | 1,419 |
| (iii) මූලික අරාබි පාසල් | 147 | 13,569 | 1,800 |
| (iv) මූලික අරාබි පාසල් (තාවකාලික) | 58 | 4,367 | 537 |
| **එකතුව** | **317** | **32,322** | **4,146** |

මුස්ලිම්, ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ MRCA/R/9/1/1 දරන හා 2020 අගෝස්තු 12 දිනැති ලිපිය අනුව මෙම අරාබි විදුහල්වල අධ්‍යයන කාලය වසර 6-8 ත් අතර වන බවත් සාමාන්‍යයෙන් වයස අවු.13-15 අතර වයස ආරම්භක වයස ලෙසින් බඳවා ගන්නා බවත් දක්වා ඇත.

අනිවාර්යය අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ සිටින මෙම දරුවන්ට සාමාන්‍ය අධ්‍යාපනය ලබාදෙන රජයේ පාසල් අදාල දිස්ත්‍රික්කවල පිහිටා තිබියදී මෙවැනි පාසල් සඳහා දරුවන් යොමුවීම පිළිබඳ නියාමනය කිරීමට අධ්‍යාපන අමාත්‍යංශය මැදිහත් වී නොතිබුණි. ඒ හේතුවෙන් අනිවාර්යය අධ්‍යාපනය හැදෑරිය යුතු වයසේ සිටින මෙම දරුවන්ට ලැබිය යුතු ප්‍රමිතිසහගත විෂයානුබද්ධ දැනුම, ක්‍රීඩාව, සෞන්දර්‍යය, ජීවන කුසලතා වැනි අත්‍යවශ්‍ය මෙවලම් නොමැතිව වැඩිහිටියෙකු ලෙස සමාජ ගතවීමට ඉඩකඩ සැලසී ඇති බව අධ්‍යාපන අමාත්‍යංශයයේ හා මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ අවධානයට ලක් වී නොමැති බව නිරීක්ෂණය විය.

**(ඇ) අරාබි පාසල්වල විභාග කටයුතු**

මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර අරාබි විදුහලක තුන් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කළ අය "අල් ආලිම් මුතවස්සිතා" විභාගයටත්, පස් අවුරුදු පාඨමාලාව සම්පූර්ණ කළ අය "අල් ආලිම් සානවියියා" විභාගයටත් පෙනී සිටීමට සුදුසුකම් ලබන බව විභාග දෙපර්තමේන්තුව මගින් දන්වා ඇත. එසේම අරාබි විදුහලක අධ්‍යාපනය නොලබන අයකු පෞද්ගලික අයදුම්කරුවකු වශයෙන් ආසන්න අරාබි විදුහලක් මගින් විභාගයට පෙනී සිටිය යුතු බවත්, අල් ආලිම් මුතවස්සිතා

විභාගය සමත් නොවී අල් ආලිම් සානවියිය විභාගයට පෙනී සිටිය නොහැකි බවත් දක්වා ඇත. විස්තර පහත දැක්වේ.

| විභාගයේ නම | වර්ෂය | පෙනී සිටි සංඛ්‍යාව | සමත් සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය |
|---|---|---|---|---|
| අල්-ආලිම් සහතික පත්‍ර විභාගය | 2014/2016 (පැරණි නිර්දේශය) | 363 | 73 | 20 |
| අල්-ආලිම් සහතික පත්‍ර විභාගය | 2015/2017 (පැරණි නිර්දේශය) | 204 | 24 | 12 |
| අල්-ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගය | 2015/2016 (නව නිර්දේශය) | 354 | 87 | 25 |
| අල්-ආලිම් සානවියියා සහතික පත්‍ර විභාගය | 2017/2018 (නව නිර්දේශය) | 396 | 104 | 26 |
| අල්-ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගය | 2016 (නව නිර්දේශය) | 1866 | 483 | 26 |
| අල්-ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගය | 2017/2018 (නව නිර්දේශය) | 3050 | 802 | 26 |

**(මූලාශ්‍රය:-ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව)**

මූලික අරාබි පාසල් 205 ක ළමුන් 17,936 ක් පමණ අධ්‍යාපනය හැදෑරුවද අල් - ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගයට පෙනී සිට ඇත්තේ 2017/2018 වර්ෂයන්හිදී සිසුන් 3,050 ක් එනම් මුළු සිසුන් සංඛ්‍යාවෙන් සියයට 17 ක් බවත් නිරීක්ෂණය විය. එසේම මෙම විභාග සමත්වන සිසුන් ප්‍රමාණය සියයට 26 ක ටත් වඩා අඩු ප්‍රමාණයක් බවත් නිරීක්ෂණය විය.

**(ඈ) විභාග පැවැත්වීමේ පිරිවැය**

මෙම විභාග පැවැත්වීම සඳහා 2016 හා 2017 වර්ෂයන්හිදී ඇස්තමේන්තු සකස් කර මුදල් ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොකල බවත් 2018 වර්ෂයේ මෙම විභාගයන් පැවැත්වීම වෙනුවෙන් රු.10,126,352 ක් වැය වී ඇති බවත්, එම වියදම දරන ලද පාර්ශවයන් නොමැති බවක් විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ 19/IA/EX/2020/82 අංක දරන හා 2020 නොවැම්බර් 13 දිනැති ලිපියෙන් විගණනය වෙත දන්වා ඇත.

**(ඉ) මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති පාසල්**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් ලබා ගත දත්ත අනුව දිවයිනේ දිස්ත්‍රික් මට්ටමින් අල්-ආලිම් මුතවස්සිතා සහතික පත්‍ර විභාගයට දරුවන් ඉදිරිපත් කර ඇති අරාබි පාසල් 133 ක් මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. දිස්ත්‍රික් මට්ටමින් සංඛ්‍යාත්මක දත්ත පහත දැක්වේ.

| දිස්ත්‍රික්කය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 09 |
| ගම්පහ | 10 |
| කළුතර | 07 |
| ගාල්ල | 03 |
| මාතර | 07 |
| හම්බන්තොට | 02 |
| කෑගල්ල | 09 |
| කුරුණෑගල | 16 |
| පුත්තලම | 05 |
| අනුරාධපුරය | 08 |
| පොලොන්නරුව | 02 |
| මාතලේ | 05 |
| මහනුවර | 11 |
| නුවරඑළිය | 02 |
| රත්නපුර | 01 |
| බදුල්ල | 04 |
| අම්පාර | 12 |
| මඩකලපුව | 06 |
| ත්‍රිකුණාමලය | 10 |
| වවුනියාව | 03 |
| මන්නාරම | 01 |
| | ------ |
| | 133 |

**3.4.2.5 මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ MRCA/R/DP/01/2021 අංක දරන හා 2021 සැප්තැම්බර් 06 දිනැති ලිපිය අනුව එම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති අරාබි විද්‍යාල 317 න් පාසල් 32 ක් ක්‍රියාත්මක නොවන බව දක්වා ඇත. එසේම පාසල් 205 ක සාමාන්‍ය පෙළ පමණක් උගන්වන බවත් පාසල් 122 ක සාමාන්‍ය පෙළ හා උසස් පෙළ උගන්වන බවත් දක්වා ඇත. මෙම පාසල් සම්බන්ධව විගණනය විසින් තවදුරටත් විස්තර ඉල්ලා සිටියදී උක්ත දෙපාර්තමේන්තුව විසින් MRCA/R/8/1/1 අංක දරන හා 2021 නොවැම්බර් 10 දිනැති ලිපිය අනුව අ.පො.ස (සා.පෙළ) පමණක් පවත්වන පාසල් 202 ක තොරතුරුද , සාමාන්‍ය පෙළ හා උසස් පෙළ උගන්වන පාසල් 112 ක තොරතුරුද විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

එම තොරතුරු අනුව පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

(අ) අ.පො.ස (සා.පෙළ) විභාගය සඳහා සිසුන් පෙනී සිටින අරාබි පාසල් සංඛ්‍යාව 202 ක් වන බව උක්ත ලිපිය අනුව දක්වා තිබුණද ඉන් පාසල් 48 කම 2019 වසර සඳහා එම විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව දක්වා නොතිබුණු අතර ඉතිරි පාසල් 154 හි සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| පාසලේ සිටින මුළු ළමුන් සංඛ්‍යාවේ විස්තරය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| ළමුන් 1-10 දක්වා | 90 |
| ළමුන් 11-20 දක්වා | 44 |
| ළමුන් 21-30 දක්වා | 06 |
| ළමුන් 31-40 දක්වා | 09 |
| ළමුන් 41-50 දක්වා | 01 |
| ළමුන් 50 ට වැඩි | 04 |
| | 154 |

(ආ) අ.පො.ස (උ.පෙළ) විභාගය සඳහා සිසුන් පෙනී සිටින අරාබි පාසල් සංඛ්‍යාව 112 ක් වන බව දක්වා තිබුණද ඉන් පාසල් 23 කම 2019 වසර සඳහා උසස් පෙළ විභාගයට පෙනී සිටි සිසුන් සංඛ්‍යාව දක්වා නොතිබුණි. ඉතිරි පාසල් 89 හි සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| පාසලේ සිටින ළමුන් සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව |
|---|---|
| ළමුන් 1-10 දක්වා | 53 |
| ළමුන් 11-20 දක්වා | 20 |
| ළමුන් 21-30 දක්වා | 08 |
| ළමුන් 31-40 දක්වා | 02 |
| ළමුන් 41-50 දක්වා | 02 |
| ළමුන් 50 ට වැඩි | 04 |
| | 89 |

### 3.4.2.6 මද්‍රසා අධ්‍යාපනය පරීක්ෂා කිරීමට පත්කල කමිටු හා පර්යේෂණ

**(අ) ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තුවේ ආංශික කමිටු වාර්තාව හා මද්‍රසා පාසල්**

මෙම පාසල්වල නාමය 2019 අප්‍රේල් 21 දින පාස්කු ප්‍රහාරයත් සමඟ වඩාත් ප්‍රචලිත වූ අතර මෙම පාසල් සම්බන්ධ පහත දැක්වෙන නිරීක්ෂණ 2020 පෙබරවාරි 19 දිනැති ජාතික ආරක්ෂාව පිළිබඳ පාර්ලිමේන්තු ආංශික කමිටු වාර්තාව මත පදනම්ව ඉදිරිපත් කෙරේ.

(i) මෙම කමිටුවට අනුව මද්‍රසා පාසල් 1679 ක් ඇති අතර ලියාපදිංචි පාසල් සංඛ්‍යාව 317කි. ඉගෙනුම ලබන ළමුන් සංඛ්‍යාව 22,000ක් පමණ වන බව.

(ii) ජාතික වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් විෂය නිර්දේශයක් මෙම පාසල්වල ඉගැන්වීම් සිදු නොකිරීම.

(iii) ජාතික වශයෙන් හෝ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ආයතනයක් මගින් මෙම පාසල්වල ඉගැන්වීම් කටයුතු අධීක්ෂණය සිදු නොකිරීම.

(iv) මෙම පාසැල්වල පහත කරුණු පිළිබඳව කිසිදු රාජ්‍ය ආයතනයකින් නියාමනයක් නොවීම

- මෙම පාසල්වල ඉගෙන ගන්නා ළමුන් සංඛ්‍යාව කොපමණද යන්න
- මෙම පාසල්වල උගන්වන ගුරුවරු සංඛ්‍යාව කොපමණද යන්න හා ඔවුන් ලාංකිකද විදේශිකද යන්න
- මෙම පාසල්වල උගන්වන ගුරුවරුන්ගේ සුදුසුකම් මොනවාද යන්න
- මෙම පාසල්වල ළමුන් ට මූලික පහසුකම් පවතීද යන්න
- මෙම පාසල්වල මූල්‍ය ත්ත්වය කුමක්ද යන්න හා අරමුදල් සපයා ගන්නා ප්‍රභවය කුමක් ද යන්න

ඒ අනුව මෙවැනි පාසල් විධිමත්ව නියාමනය නොවීම හේතුවෙන් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳව මෙන්ම එම ආයතනවල පැවතිය යුතු මූලික පහසුකම් පිළිබඳ සහතිකවීමක් සිදුකල නොහැකි බව නිරීක්ෂණය විය.

**(ආ) මද්‍රසා අධ්‍යාපනය සම්බන්ධ පර්යේෂණ**

අරාබි භාෂාවෙන් පාසල යන අර්ථය ඇති මද්‍රසා පාසල් ඉස්ලාම් ආගමික පාසල් විශේෂයකි. මෙම පාසල් සම්බන්ධව A Study on Contemporary Madrasah Education System in Sri Lanka යන නමින් Community Association of Professionals (CAP) යන සංවිධානය විසින් 2019/2020 වර්ෂයේදී පර්යේෂණයක් සිදුකර තිබුණි.

මෙම පර්යේෂණය තුන් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමකින්ද හිටපු කුවේට් තානාපති හා කොළඹ විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් දෙදෙනෙකුගෙන් යුත් සංස්කාරක මණ්ඩලයකින්ද සමන්විතව සිදු කරන ලද්දකි. එකී පර්යේෂණය මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති මද්‍රසා පාසල් 317 පදනම් කර ගෙනද මද්‍රසා පාසල් 50 ක චාරක පරීක්ෂණයකින් හා තවත් මද්‍රසා පාසල් 24 කින් තැපැල් මගින් තොරතුරු ලබා ගනිමින්ද සිදු කරන ලද්දකි.
ඒ අනුව මෙම පරීක්ෂණයෙන් අනාවරණය වූ නිරීක්ෂණයන් පහත දැක්වේ.

**(i) මද්‍රසා පාසල් සංඛ්‍යාව**

මෙම අධ්‍යයනයෙන් හඳුනාගෙන ඇති පරිදි මද්‍රසා පාසල් 317 ක් මුස්ලිම් හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත.මෙයින් දළ වශයෙන් සියයට 73 ක් සිසුන් 50 ට වැඩි සංඛ්‍යාවක් සිටින අතර සියයට 27 ක සිසුන් 50 ට අඩු සංඛ්‍යාවක් සිටිති. මුස්ලිම් ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති මද්‍රසා පාසල් 317 න් 09 ක් 1948 ට පෙර (නිදහස ලබා ගැනීමට පෙර) ආරම්භ කර ඇති අතර, 308 ක් ඉන්පසු ආරම්භ කර ඇති බව.

**(ii) සිසුන් ඇතුලත් කිරීමේ නිර්ණායක**

මෙම පර්යේෂණයෙන් හෙළි වූයේ මදුසා පාසල්වලින් සියයට 75 ක් වයස අවුරුදු 16 ට අඩු සිසුන් ඇතුළත් කර ගන්නා බවයි. තවද, මෙම අධ්‍යයනයට අනුව මදුසා පාසල්වලින් සියයට 22 කට 5 වන ශ්‍රේණිය ලෙස අවම අධ්‍යාපන සුදුසුකම් ඇති බැවින් ඔවුන් මදුසා පාසල් අධ්‍යාපනය ආරම්භ කිරීමට පෙර අල් කුරානය කටපාඩම් කර ඇති බවයි. මදුසා පාසල් වලින් සියයට 52 ක් නවවන ශ්‍රේණිය ලෙස අවම අධ්‍යාපන සුදුසුකම් ලබා ඇති අතර මදුසා පාසල්වලින් සියයට 22 ක් අවම අධ්‍යාපන සුදුසුකම් හා අ.පො.ස.(සාමාන්‍ය පෙල) මට්ටමේ සිටිති.

**(iii)** මෙම පාසල්වලින් සියයට 90ක් පූර්ණකාලීන පාඨමාලා වන අතර, සියයට 10 ක් අර්ධකාලීන (Part time) වේ. ඉගැන්වීම් කාලය වසර 04 ත් වසර 08 ක් අතර වන බව.

**(iv) නෛතික පදනම**

පවත්නා මදුසා පාසල් මුස්ලිම් ආගමික දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇතත්, මදුසා පාසල් ලියාපදිංචි කිරීම හා පිළිගැනීම සඳහා වන නෛතික පදනම තවමත් නිශ්චය කර නොමැත.

**(v) මදුසා පාසල් නියාමනය හා අධීක්ෂණය**

මදුසා පාසල්වල අධ්‍යාපන පද්ධතියේ කාර්යයන් සම්බන්ධයෙන් විෂයමාලා, මදුසා පාසල් කළමනාකරණය සහ වෙනත් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් රට තුළ පවතින මදුසා පාසල් පද්ධතිය අධීක්ෂණය කිරීමට හෝ ඇගයීමට කේන්ද්‍රීය ආයතනයක් නොමැත. අධීක්ෂණය සහ මගපෙන්වීම නොමැතිවීම හේතුවෙන් සෑම මදුසා පාසල් වර්ගයක්ම තමන්ගේම පද්ධති හා රටාවන් මත ක්‍රියාත්මක වන අතර ඒවායේ ක්‍රියාකාරීත්වයේ හා පරිපාලනයේ අසමමිතික රටාවක් ඇත.

**(vi) ඉගැන්වීමේ මාධ්‍යය**

මදුසා පාසල් වලින් සියයට 96 ක් දෙමළ මාධ්‍යය පාසල් ලෙස ක්‍රියාත්මක වන අතර සිංහල සහ ඉංග්‍රීසි වැනි වෙනත් භාෂාවන්ට ප්‍රමාණවත් අවධානයක් හා පුහුණුවක් ලබා නොදේ.

**(vii) සංවිධානාත්මක ව්‍යුහය**

මෙම පර්යේෂණයෙන් හෙළි වූයේ මද්‍රසා පාසල්වලින් සියයට 44කට සංවිධානාත්මක ව්‍යුහයක්/ ක්‍රමානුකූල ධූරාවලියක් නොමැති බවයි. මෙය වැඩ පැවරීම, මානව සම්පත් කළමනාකරණය, වාර්තාකරණය සහ සමස්ත පරිපාලනය පිළිබඳ ගැටළු ඇති කරන බව දක්වා ඇත.

**(viii) මානව සම්පත් කළමනාකරණය**

මෙම පර්යේෂණයෙන් හෙළි වූයේ මද්‍රසා පාසල්වලින් සියයට 49කට ඔවුන්ගේ කාර්ය මණ්ඩලය සඳහා නිසි වේතන ක්‍රමයක් හෝ වැටුප් ව්‍යුහයක් නොමැති බවයි. එහි ප්‍රතිඵලය වී ඇත්තේ කාර්ය මණ්ඩලයට අභිප්‍රේරණයක් නොමැති වීම සහ අතෘප්තියයි. තවදුරටත්, මද්‍රසා පාසල් වලින් සියයට 52කට නිසි බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැත. නිසි කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැතිවීම හේතුවෙන්, නුපුහුණු හා අකාර්යක්ෂම ගුරුවරුන් බඳවාගෙන ඇති අතර එය සිසුන්ගේ අධ්‍යයන කටයුතුවලට අහිතකර ලෙස බලපායි.

**(ix) මූල්‍ය කළමනාකරණය**

මෙම අධ්‍යයනයෙන් හඳුනාගෙන ඇත්තේ මද්‍රසා පාසල්වලින් සියයට 72 ක් නිසි ගිණුම් /පොත් තැබීම සිදු නොකරන බවත් සහ සහතික කළ විගණකවරයකු හරහා ඔවුන්ගේ ගිණුම් විගණනය නොකරන බවත්ය. මෙය අරමුදල් වැරදි ලෙස කළමනාකරණය කර මූල්‍ය අර්බුදයකට තුඩු දිය හැකි බව නිරීක්ෂණය කර ඇත.

**(x) විෂයමාලාව**

- <u>විෂය නිර්දේශය</u>

  පර්යේෂණ සොයාගැනීම්වලට අනුව, මද්‍රසා පාසල්වලින් සියයට 52 ක් පමණක් විෂය නිර්දේශ රාමුව අනුගමනය කරමින් සිටින අතර එය විභාග දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලද අතර අල්-අලිම් මුතවාසියා සහ අල්-අලිම් සනාවියා විභාග සඳහා මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

- <u>භාෂාව</u>

  මද්‍රසා පාසැල් වලින් සියයට 89ක්ම සිංහල උගන්වන බවත්, මද්‍රසා පාසල්වලින් සියයට 97ක්ම තම ඉගැන්වීමේ මාධ්‍යයට අමතරව වෙනත් භාෂාවන් ලෙස දමිළ භාෂාව උගන්වන බවත් මෙම අධ්‍යයනයෙන් හෙළි වී තිබේ. ජාතික භාෂා දෙකම මද්‍රසා පාසල්වල උගන්වනු ලැබුවද, මෙම

භාෂාවන්ට කළමනාකාරිත්වය මෙන්ම සිසුන් ද ප්‍රමාණවත් ප්‍රමුඛතාවයක් ලබා නොදෙන බවද හෙළි වී තිබේ.

**(xi) භෞතික පහසුකම්වල තත්ත්වය**

| භෞතික පහසුකම | ඇති ප්‍රමාණය සියයට | නැති ප්‍රමාණය සියයට |
|---|---|---|
| 1. පංති කාමර වෙන් වෙන් වශයෙන් | 93 | 7 |
| 2. පංති කාමර සඳහා ප්‍රමාණවත් වාත්‍රාශය | 97 | 3 |
| 3. පුස්තකාල පහසුකම් | 95 | 5 |
| 4. ආහාර හා නේවාසිකාගාර | | |
| (a) නේවාසිකාගාර | 81 | 19 |
| (b) ඇඳන් | 41 | 59 |
| (c) ආහාර මෙනු | 75 | 25 |
| 5. ක්‍රීඩා පහසුකම් | 73 | 27 |
| 6. ක්‍රීඩා පිට්ටනි | 55 | 45 |

**(xii) සෞඛ්‍ය පහසුකම්**

සනිපාරක්ෂක තත්ත්වය ඉතාම සතුටුදායක සියයට 35ක් ද, තරමක් සතුටුදායක සියයට 47ක් ද, සහ අසතුටුදායක සියයට 18 ක් ද විය.

මේ අනුව සමස්තයක් ලෙස මෙම පාසල් ස්ථාපිත කිරීම, ලියාපදිංචි කිරීම, පවත්වාගෙන යාම පිළිබඳ පිළිගත් නිර්නායක අනුව සිදුකල යුතු බවත් ඒවායේ ඉගෙනුම ලබන අනිවාර්යය අධ්‍යාපන වයසේ සිසුන් පිළිබඳව විධිමත් නියාමනයක් සිදුවිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

## 04. නිර්දේශ

**4.1** අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සංවර්ධනය, අධ්‍යාපන සැලසුම්කරණය හා කළමනාකරණය, ඉගෙනුම් පරිසරය යනාදී කරුණු පිළිබඳ අවධානයට ලක්කරමින් සමස්ත අධ්‍යාපනය සඳහාම යාවත්කාලීන කරන ලද අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස්කර පොදු නීතියක් බවට පත් කිරීම.

**4.2** 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතෙහි 25 වන වගන්තිය අනුව අවුරුදු 5-14 වයස් සීමාවේ පසු වන දරුවන් සඳහා අධ්‍යාපනය ලබා දීමට පෞද්ගලික පාසල් ආරම්භ කල නොහැකි බව දක්වා ඇතත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමකින් තොරව ව්‍යාපාරික ආයතන ලෙස ජාත්‍යන්තර පාසල් ද, ආගමික පාසල් ලෙස මද්‍රසා පාසල් ද පවත්වාගෙන ගෙන යන බැවින් පනත සක්‍රීයව බලාත්මක කිරීමට අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම.

**4.3** අමාත්‍ය මණ්ඩල තීරණයකින් ද උපදෙස් ලබා දී ඇති පරිදි රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා ශිෂ්‍යයන් පාසලට ඇතුලත් කර ගැනීම, ගාස්තු අය කිරීම, විනය ක්‍රියාමාර්ග ගැනීම, ගුරුවරුන් සම්බන්ධ කටයුතු, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණය යනාදී සියළු අවස්ථාවන්වලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමාණවත් මැදිහත් වීමක් සිදුවිය යුතු බැවින් ඒ සඳහා විධිමත් මාර්ගෝපදේශන සකස්කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.

**4.4** රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ශාඛා පාසල් ආරම්භ කිරීමට ලබා දී තිබූ කැබිනට් මණ්ඩල අනුමැතියට අනුව, ඉදිරියේදී යම් මව් පාසලක් විසින් දිවයිනේ යම් ස්ථානයක ශාඛා පාසලක් ආරම්භ කිරීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ලබා දෙන නිර්ණායකවලට යටත්ව පූර්ව අනුමැතිය ලබා දිය යුතු බැවින්, ඒ සඳහා අවශ්‍ය නිර්ණායක සකස් කිරීම.

**4.5** රජයේ අනුමත අක්‍රීය පෞද්ගලික පාසලක් නැවත සක්‍රීය කිරීමේදී ඒ සඳහා අවශ්‍ය විධිමත් නිර්ණායක සකස් කිරීම.

**4.6** අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ හා ප්‍රමිති ශාඛාව මගින් සිදුකෙරෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා වූ නව ඇගයීම් ක්ෂේත්‍ර ප්‍රමිති ඔස්සේ සිදුකෙරෙන අධීක්ෂණ ක්‍රියාවලිය අනෙකුත් පාසල් මෙන්ම මෙම රජයේ අනුමත පෞද්ගලික පාසල් සඳහා ද අනුගමනය කිරීම.

**4.7** රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2005 ඔක්තෝබර් 31 දිනැති අංක 2005/31 දරණ චක්‍රලේඛයේ අංක 4(අ)(iii) ඡේදය

ප්‍රකාරව පාසල් කටයුතු පරීක්ෂා කිරීමට හෝ තොරතුරු ලබා ගැනීමට හෝ අධීක්ෂණය කිරීම සඳහා හෝ පැමිණෙන පළාත් අධ්‍යාපන නිලධාරීන් සහ රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ බලධාරීන් ගේ අනන්‍යතාවය තහවුරු කොට ගෙන අවශ්‍ය ලේඛන පරීක්ෂාව, ඉගෙනුම්/ ඉගැන්වීම් ක්‍රියාවලිය අධික්ෂණය කොට වාර්තා තබා ගැනීම, සටහන් තැබීම් සඳහා අවශ්‍ය පහසුකම් සැලැස්විය යුතු බව දන්වා ඇති නමුත් එම චක්‍රලේඛවල සඳහන් කරුණුවලට අනුගත නොවන රජයේ අනුමත පෞද්ගලික පාසල් සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශයේ දැනට පවතින නීතිමය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේ නම් එම තත්ත්වය ලඝාකර ගැනීමට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් තවදුරටත් කටයුතු කිරීම.

**4.8** වර්තමාන රැකියා වෙළඳපොලට ගැලපෙන ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමේ පරමාර්ථයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් හඳුන්වා දී ඇති තාක්ෂණවේදය වැනි විෂය ධාරාවන් සියළු රජයේ අනුමත පෞද්ගලික පාසල්වල ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම සැලකිල්ලට ගැනීම.

**4.9** රජයේ අනුමත පෞද්ගලික පාසල්වල කාල සටහන් අනුමත කිරීම, ගුරුවරුන් බඳවා ගැනීම, ගුරුවරුන්ගේ විනය කටයුතු සම්බන්ධයෙන් ආගමික නිකායන් විසින් සිදුකරන මැදිහත්වීම් පාලනය කර අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පමණක් අදාල නියාමනයන් සිදුකිරීම පිළිබඳ අවධානය යොමු කිරීම.

**4.10** රජයේ අනුමත පෞද්ගලික පාසල්වලට නව ගුරුවරුන් බඳවා ගැනීමට පෙර යෝජනාපත්‍ර නිර්දේශ කර අනුමත කරගත යුතු වීම හා අදාල යෝජනා පත්‍ර සඳහා නිර්දේශ ලබා දීමේ දී ගුරුවරයාගේ සුදුසුකම් සනාථකර යෝජනා පත්‍ර අනුමත කර එවූ පසු පත්වීම් ලිපිය නිකුත් කිරීම.

**4.11** පෞද්ගලික පාසල්වලට ගුරුවරුන් බඳවා ගැනීමේදී උපාධිධාරීන් හා ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීම් කෙරෙහි උනන්දු කිරීම.

**4.12** රජයේ අනුමත පෞද්ගලික පාසල් හා ජාත්‍යන්තර පාසල්වල දරුවන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් එම පාසල්වලට බලපෑම් කිරීමට හැකි නෛතික ප්‍රතිපාදන සෞඛ්‍ය අමාත්‍යාංශයට ලබා දීම.

**4.13** 1961 අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වගන්තිය අනුව වයස අවුරුදු 5-14 වයස් සීමාවේ පසුවන දරුවන් සඳහා අධ්‍යාපනය ලබාදෙන පෞද්ගලික පාසල් ආරම්භ කළ නොහැකි බව දක්වා තිබුනද, සමාගම් පනත යටතේ සමාගමක් වශයෙන් හෝ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ආඥා පනත යටතේ තනි පුද්ගල

හෝ හවුල් ව්‍යාපාර වශයෙන් මෙම ජාත්‍යන්තර පාසල් නමින් වන ආයතන විශේෂය ලියාපදිංචි කරන බැවින්, අදාල උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත් සංශෝධනයන් සිදුකරන තෙක් ඒ සඳහා සුදුසු අන්තර්කාලීන වැඩපිළිවෙලක් දෙපාර්ශවයේ එකඟතාවය මත ක්‍රියාත්මක කිරීම.

**4.14** ජාත්‍යන්තර පාසල්වල ගුරුවරුන්ගේ අවම සුදුසුකම්, අවම භෞතික පහසුකම් හා ඉගෙනුම් ප්‍රමිතීන් පිළිබඳව මාර්ගෝපදේශනයන් සකස් කර ගැසට් කිරීම.

**4.15** මෙරට පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ජාත්‍යන්තර පාසල් හා පෞද්ගලික පාසල් විධිමත් කිරීම සඳහා 2013/ED/E/13 හා 2013 ජුනි 03 දින ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශය අනුව පත්කල නිලධාරි කමිටුව 2013 අගෝස්තු 28 දින සාකච්ඡා කර එකඟතාවයට එළඹි කරුණු පිළිබඳව කඩිනම් අවධානය යොමුකර අවශ්‍ය පියවර ගැනීම.

**4.16** වර්තමානයේ ශ්‍රී ලංකාවේ ආගමික කටයුතු මුවාවෙන් පවත්වාගෙන යනු ලබන ආයතන විසින් අනිවාර්ය අධ්‍යාපනය හදාරන වයසේ සිසුන්ට ගුණාත්මක අධ්‍යාපනයක් ලබානොදී විවිධ පරමාර්ථ උදෙසා පවත්වාගෙන යනු ලබන ආයතන නියාමනය කල යුතු වීම. විශේෂයෙන් අනිවාර්යය අධ්‍යාපන වයස් සීමාවන් තුල සිටින දරුවන්ට සාමාන්‍ය පාසල් අධ්‍යාපනය ලබානොදී පවත්වාගෙන යන වෙනත් ආයතනයන්ට එරෙහිව කටයුතු කලහැකි නෛතික ප්‍රතිපාදන බලාත්මක කර ගැනීම.

**4.17** එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන (2015-2030) න්‍යාය පත්‍රයේ අරමුණ 4හි ඉලක්ක කරා ලඟා වීමට රජයේ නොවන සියලු පාසල් ලියාපදිංචිය, ක්‍රියාත්මක කිරීම හා නියාමනයන්ට අදාල සියලු රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් ඒකකය මගින් විධිමත් ක්‍රමවේද සකස්කර ඒවා කාලීනව ඇගයීම.

**4.18** ශ්‍රී ලංකාවේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව සම්බන්ධ තීරණ ගැනීම සඳහා සියලු පාසල්වල දත්ත අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා ගැනීම හා ඒවා යාවත්කාලීන කිරීම මගින් අධීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කර ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති
2022 මාර්තු 02 දින

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

**ඇමුණුම 01**

**පාසල්වල පැවතිය යුතු භෞතික මානයන්**

**(i) ප්‍රාථමික පාසල් (1-5 ශ්‍රේණි) සඳහා (Type 3 Schools)**

- පරිපාලන ඒකකය- 20'x40'- විදුහල්පති කාමරය, කාර්යාලය, ගුරු විවේක කාමරය සහ වැසිකිළිය සහිතව
- පන්ති කාමරය- 20'x25'- ප්‍රාථමික පන්තියක උපරිම ළමුන් සංඛ්‍යාව 35
  ශිෂ්‍යයෙකුට අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය වර්ග අඩි 14.3
- පුස්තකාලය - 20'x40'
- පරිගණක කාමරය - 20'x20'- පරිගණක 10 ක් සහිතව
- සෙල්ලම් කාමරය - 20'x20'
- විදුහල්පති නිවාසය - වර්ග අඩි 1000
- සෞන්දර්ය ඒකකය - 20'x40'
- ක්‍රියාකාරකම්/විද්‍යා කාමරය- 20'x40'
- ගබඩා කාමරය - 20'x20'
- සෙල්ලම් මිදුල

**(ii) කණිෂ්ඨ ද්විතීයික පාසල් (1-9 ශ්‍රේණි හෝ 1-11 ශ්‍රේණි) සඳහා (Type 2 Schools)**

- පරිපාලන ඒකකය - 20'x60'- විදුහල්පති කාමරය, නියෝජ්‍ය විදුහල්පති කාමරය, කාර්යාලය, ගුරු විවේක කාමරය සහ වැසිකිළි (2) සහිතව
- පන්ති කාමර - 20'x25'
- පුස්තකාලය - 20'x60'
- පරිගණක කාමරය - 20'x20'- පරිගණක 20 ක් සහිතව
- සා/පෙළ විද්‍යාගාරය - 20'x20'- 6-11 පන්ති ගණන 18 කට වැඩි නම් විද්‍යාගාර 2 ක් අවශ්‍ය වේ.
- ගෘහ විද්‍යාගාරය - 20'x40'
- කෘෂි විද්‍යාගාරය - 20'x40'
- විදුහල්පති නිවාසය - වර්ග අඩි 1200
- ක්‍රීඩා කාමරය - 20'x20'
- උපදේශන කාමරය - 20'x20'
- සෞන්දර්ය ඒකකය - 20'x100'
  (නැටුම්, සංගීත, චිත්‍ර)
- ප්‍රායෝගික තාක්ෂණික කුසලතා කාමරය - 20'x40'

**(iii) ජ්‍යෙෂ්ඨ ද්විතියික පාසල් (විද්‍යා විෂයයන් රහිත) සඳහා (Type 1C Schools)**

- පරිපාලන ඒකකය - 20'x80'- විදුහල්පති කාමරය, නියෝජ්‍ය විදුහල්පති කාමර (2) කාර්යාලය, රැස්වීම් කාමරය, ගුරු විවේක කාමරය සහ වැසිකිළි (2) සහිතව
- පන්ති කාමර - 20'x25'- ද්විතියික පන්තියක උපරිම ළමුන් සංඛ්‍යාව 40
- පුස්තකාලය - 20'x80'
- පරිගණක කාමරය - 20'x20'- පරිගණක 20 ක් සහිතව
- සා/පෙළ විද්‍යාගාරය - 20'x20'- 6-11 පන්ති ගණන 18 කට වැඩි නම් විද්‍යාගාර 2 ක් අවශ්‍ය වේ.
- ගෘහ විද්‍යාගාරය - 20'x40'- ගෘහ විද්‍යා විෂය 6-11 පන්ති සඳහා පමණක් පැවැත්වේ නම් - 20'x60'- උසස් පෙළ පන්ති සඳහා ගෘහ විද්‍යා විෂය ඇතුළත් නම්
- කෘෂි විද්‍යාගාරය - 20'x40'
- විදුහල්පති නිවාසය - වර්ග අඩි 1500
- ක්‍රීඩා කාමරය - 20'x20'
- උපදේශන කාමරය - 20'x20'
- සෞන්දර්ය ඒකකය - 20'x100'
  (නැටුම්, සංගීත, චිත්‍ර)
- ප්‍රායෝගික තාක්ෂණික කුසලතා කාමරය - 20'x40'

**(iv) ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් (විද්‍යා විෂයයන් සහිත) සඳහා (Type 1AB Schools)**

- පරිපාලන කාමරය - 20'x80' - විදුහල්පති කාමරය, නියෝජ්‍ය විදුහල්පති කාමර (2)
- පන්ති කාමර - 20'x25' - ද්විතියික පන්තියක උපරිම ළමුන් සංඛ්‍යාව 40
- පුස්තකාලය - 20'x80'
- පරිගණක කාමරය - 20'x20' - පරිගණක 20 ක් සහිතව
- සා/පෙළ විද්‍යාගාරය- 20'x20'- 6-11 පන්ති ගණන 18 කට වැඩි නම් විද්‍යාගාර 2 ක් අවශ්‍ය වේ.

- උ/පෙළ විද්‍යාගාර - 25'x40' - භෞතික විද්‍යාගාරය
  - 25'x40' - රසායන විද්‍යාගාරය
  - 25'x40' - ජීව විද්‍යාගාරය

  12 සහ 13 ශ්‍රේණි සඳහා සමාන්තර පන්ති 3 ක් හෝ ඊට අඩු සංඛ්‍යාවක් ඇත්නම් ද්විත්ව විද්‍යාගාරයක් (25'x50') පමණක් ලබා ගත හැක.
- ගෘහ විද්‍යාගාරය - 20'x40' - ගෘහ විද්‍යා විෂය 6-11 පන්ති සඳහා පමණක් පැවැත්වේ නම්-
  20'x60' - උසස් පෙළ පන්ති සඳහා ගෘහ විද්‍යා විෂය ඇතුළත් නම්
- කෘෂි විද්‍යාගාරය - 20'x40'
- විදුහල්පති නිවාසය - වර්ග අඩි 1500
- ක්‍රීඩා කාමරය - 20'x20'
- උපදේශන කාමරය - 20'x20'
- සෞන්දර්ය ඒකකය - 20'x100'
  (නැටුම්, සංගීත, චිත්‍ර)
- ප්‍රායෝගික තාක්ෂණික කුසලතා කාමරය - 20'x40'

**(v) අනෙකුත් පහසුකම්**

- රැස්වීම් පහසුකම්
  40'x25' වර්ගය A- ශිෂ්‍යයින් 200- ළමුන් 100 ක් හෝ ඊට වැඩි
  50'x25' වර්ගය B- ශිෂ්‍යයින් 200- ළමුන් 100 – 400
  70'x30' වර්ගය C- ශිෂ්‍යයින් 400- ළමුන් 400 –800
  90'x35' වර්ගය D- ශිෂ්‍යයින් 600- ළමුන් 800 –1200
  බැල්කනිය සහිත E- ශිෂ්‍යයින් 800 - ළමුන් 1200 –1600
  බැල්කනිය සහිත F- ශිෂ්‍යයින් 1000 - ළමුන් 1600 න් ඉහළ

**(vi) ගුරු නිවාසය හා තනිකඩ නිවාසය**

සෑම පාසලකටම විදුහල්පති හෝ ගුරු නිවාසයක් තිබිය යුතුය. ඊට අමතරව පාසලේ අවශ්‍යතාවය මත ගුරු නිවාස හෝ තනිකඩ නිවාස ලබා ගත හැක.

**(vii) වැසිකිළි කැසිකිළි**

පිරිමි ළමුන් 200 ක් දක්වා එක් වැසිකිළියක් හා කැසිකිළි 2 ක්ද ගැහැණු ළමුන් 200 ක් දක්වා වැසිකිළි 3 ක්ද හිමිය. මීට වඩා ළමුන් වැඩි වන අවස්ථාවකදී වැසිකිළි හා කැසිකිළි ඒකක ගණනය කිරීම අමාත්‍යාංශයේ ප්‍රතිමාන අනුව කළ හැකිය.

(viii) ගිලන් කාමරය
(ix) ක්‍රීඩා පිට්ටනිය හා ක්‍රීඩාගාරය
(x) ගෘහස්ථ ක්‍රීඩාගාරය
(xi) ශිෂ්‍ය නේවාසිකාගාර (ශිෂ්‍යත්වලාභී සිසුන් ඇතුළත් කරන්නේ නම් පමණක්)
(xii) පාසල් වැට හෝ තාප්පය, නාම පුවරුව, මුර කුටිය
(xiii) ජල පහසුකම්, විදුලිය පහසුකම්, දුරකථන පහසුකම්
(xiv) විදුහල්පතිගේ අභිමතය පරිදි

- ආපන ශාලාව
- විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා වූ කාමර - ශිෂ්‍ය භට, බාල දක්ෂ
- සෞඛ්‍යදාන සමූපකාර ආදිය
- මුළුතැන් ගෙය - පෝෂණ වැඩසටහන් සඳහා

## පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ඇගයීම් පත්‍රිකාව

| | නිර්ණායක | දර්ශකය |
|---|---|---|
| 1. | පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව | 1. කමිටුවක් ඇත, සෞඛ්‍ය ප්‍රවර්ධන ප්‍රතිපත්ති හඳුනාගෙනඇත.<br>2. කමිටුව ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| 2. | පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමයේ දායකත්වය | 1. පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන සංගමයක් ඇත.<br>2. ශිෂ්‍ය සහභාගීත්වය 100% පවතී.<br>3. කායික සෞඛ්‍ය සම්බන්ධ ක්‍රියාකාරකම් ඇත.<br>4. මනෝ සමාජයීය යහපැවැත්මට අදාළ ක්‍රියාකාරකම්වල යෙදේ.<br>5. වාර්ෂික සැලැස්මක් ඇත. |
| 3. | ආරක්ෂාව සම්බන්ධයෙන් දැනුවත් කර ක්‍රියාත්මක කර ඇත. | 1. හදිසි අනතුරු සිදුවිය හැකි අවස්ථා නොමැත.<br>2. ප්‍රථමාධාර පහසුකම් ඇත.<br>3. හදිසි අවස්ථාවක දී ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳසැලැස්මක් ඇත.<br>4. ඒ පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකර ඇත. |
| 4. | පාසල් වෛද්‍ය පරීක්ෂණ සිදුකර හඳුනාගත් ගැටලු සඳහා ක්‍රියාමාර්ගගෙන ඇත. | 1. පාසල් වෛද්‍ය පරීක්ෂණය වාර්ෂිකව සිදුකර ඇත.<br>2. සිසුන් 80%කට වැඩියෙන් ආවරණය කර ඇත.<br>3. චර්යා ගැටලු හඳුනාගත් සිසුන් වෛද්‍ය පරීක්ෂණය සඳහාඉදිරිපත් කර එම උපදෙස් අනුව කටයුතු කරයි.<br>4. සෞඛ්‍ය ගැටලු හඳුනාගත් සිසුන් විශේෂඥ වෛද්‍ය සායන සඳහායොමුකර ඇත.<br>5. පසු විපරමක් සිදුකර ඇත. |
| 5. | පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන සහ ප්‍රජාව අතරසබඳතාවය | ප්‍රජාව මගින් පාසල සඳහා සිදුකරන වැඩසටහන්<br>1. වාර්ෂිකව ක්‍රියාකාරකම් 3ක් හෝ ඊට වැඩියෙන් සිදුකර ඇත.<br>2. වාර්ෂිකව වැඩසටහන් 1ක් හෝ 2ක් සිදුකර ඇත.<br>පාසල මගින් ප්‍රජාව සඳහා සිදුකරන වැඩසටහන්<br>1. වාර්ෂිකව ක්‍රියාකාරකම් 3ක් හෝ ඊට වැඩියෙන් සිදුකර ඇත.<br>2. වාර්ෂිකව වැඩසටහන් 1ක් හෝ 2ක් සිදුකර ඇත. |
| 6. | සනීපාරක්ෂක පහසුකම් ප්‍රමාණවත්ව හා පවිත්‍රව පවත්වාගෙනයාම | 1. ශිෂ්‍ය ගුරු හා සංඛ්‍යාවට ප්‍රමාණවත් සනීපාරක්ෂකපහසුකම් ඇත.<br>2. ගුරු ශිෂ්‍ය, ගැහැණු පිරිමි, ප්‍රාථමික හා ද්විතීක, ආර්ථව අවශ්‍යතා<br>3. සඳහා පහසුකම් සහිතව සනීපාරක්ෂක පහසුකම් සැලසුම් කර ඇත.<br>4. පිරිසිදු කිරීමේ අඛණ්ඩ වැඩපිළිවෙලක් ඇත.<br>5. පිරිසිදුව පවත්වාගෙන යයි.<br>අඛණ්ඩව ජල සැපයුම් ලබා දී ඇත. |
| 7. | ජල පහසුකම් කළමනාකරණය | 1. ජල පහසුකම් ඇත.<br>2. අඛණ්ඩව නඩත්තු කරයි.<br>3. පිරිමැසුම් ක්‍රම භාවිතා කරයි.<br>4. පානීය ජල පහසුකම් ඇත.<br>5. ජලයේ ගුණාත්මකභාවය පිළිබඳව වාර්තා පවතී. |
| 8. | ගුරු/ සිසු පැමිණීම | 1. සිසුන්ගේ පැමිණීමේ සාමාන්‍ය 90% හෝ ඊට වැඩිය.<br>2. සිසුන්ගේ පැමිණීමේ සාමාන්‍ය 80% සිට 89% දක්වා<br>3. සිසුන්ගේ පැමිණීමේ සාමාන්‍ය 70% සිට 79% දක්වා |
| 9. | පන්ති කාමර පරිසරය හා පාසල් පරිසරය සිසුන්ට හිතකරපරිදි පවතී. | 1. පාසල් වත්ත ක්‍රමවත්ව, අලංකාරව හා පිරිසිදුව ඇත.<br>2. පවතින ඉඩ පහසුකම් ක්‍රීඩා සඳහා සාර්ථකව යොදා ගනී.<br>3. පන්ති කාමරවල ආලෝකය හා වාතාශ්‍රය මැනවින් තිබේ.<br>4. පන්ති කාමර පිරිසිදුව ඇත. |
| 10. | සිසුන්ගේ පෝෂණ ගැටලු අවම කිරීමට කටයුතු කරයි. | 1. ශිෂ්‍යයින්ගේ පෝෂණ ගැටලු හඳුනාගෙන ඇත.<br>2. දැනුවත් කිරීම සිදුවේ.<br>3. නිපුණතා වර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ.<br>4. පෝෂණ ගැටලු සහිත සිසුන් සායනවලට යොමු කරයි. |

| | | |
|---|---|---|
| 11. | ශිෂ්‍ය ශාරීරික යෝග්‍යතාවය | 1. ශිෂ්‍යයින්ගේ ශාරීරික යෝග්‍යතාවය මැන තිබේ.<br>2. ශාරීරික යෝග්‍යතා සංවර්ධන වැඩසටහන් වාර්ෂික සැලැස්මටඇතුළත් කර ඇත.<br>3. ශාරීරික යෝග්‍යතා ක්‍රියාකාරකම් ඇත.<br>4. ශාරීරික යෝග්‍යතා ගැටලු සහිත සිසුන් හඳුනාගෙන ප්‍රතිකාර්යක්‍රියාමාර්ග ගෙන ඇත.<br>5. අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා යෝග්‍යතාසංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන ඇත. |
| 12. | ශරීර සුවතා වැඩසටහන් | 1. ශරීර සුවතා වැඩසටහන් සඳහා වේලාවක් වෙන්කර ඇත.<br>2. ද්විතියික අංශයේ ශරීර සුවතා වැඩසටහන හා/ හෝ ප්‍රාථමිකඅංශයේ ක්‍රියාකාරීව ප්‍රීතිමත් වෙමු වැඩසහන ක්‍රියාත්මක වේ.<br>3. සෑම ශිෂ්‍යයෙකුගේම සහභාගීත්වයක් ඇත.<br>4. ශරීර සුවතා වැඩසටහන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්හඳුනාගෙන ඇත.<br>5. ශරීර සුවතා වැඩසටහන් ඇගයීමේ වැඩපිළිවෙලක් පවතී. |
| 13. | පෞද්ගලික ස්වස්ථතාවය පිළිබඳ වැඩපිළිවෙලක් ඇත. | 1. දැනුවත් කිරීමක් සිදු කරයි.<br>2. අඛණ්ඩව සොයා බලයි.<br>3. පෞද්ගලික ස්වස්ථතාවය පිළිබඳ නිපුණතාසංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරයි. |
| 14. | ආපනශාලාව පවත්වාගෙන යාම සහ පාසලට ආහාර ගෙන ඒම | 1. පාසල් ආපනශාලා ශ්‍රේණිගත කිරීම් අනුව Aශ්‍රේණියට අයත්ය.<br>2. පාසල් ආපනශාලා ශ්‍රේණිගත කිරීම් අනුව Bශ්‍රේණියට අයත්ය.<br>3. පෝෂ්‍යදායී ආහාර පාසලට රැගෙන ඒම දිරිමත් කිරීම සඳහාවැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර ඇත.<br>4. ඒ පිළිබඳව සොයා බැලීමක් සිදුවේ. |
| 15. | සෞඛ්‍යවත් පරිසරයක් සඳහා මනෝ සමාජයීය ක්‍රියාකාරකම්යොදා ගනියි. | 1. මනෝ සමාජයීය ප්‍රතිපත්ති හඳුනාගෙන ඇත.<br>2. පාසලේ වාර්ෂික සැලැස්මට මනෝ සමාජයීය ක්‍රියාකාරකම් 3ක්වත් හඳුනාගෙන ඇත.<br>3. වර්ෂයේ එවැනි ක්‍රියාකාරකම් 3ක් හෝ ඊට වැඩි ගණනක් ක්‍රියාත්මකකර ඇත. |
| 16. | හිංසනය අපයෝජනය හා ප්‍රචණ්ඩත්වයෙන් තොර පාසල්පරිසරයක් සඳහා අවස්ථාවක් පවතී. | 1. හිංසනය අපයෝජනය හා ප්‍රචණ්ඩත්වය වළක්වා ගැනීම පිළිබඳවදැනුවත්කර ඇත.<br>2. වාර්තා කිරීමේ ක්‍රමවේදයක් පවතී.<br>3. සහන පෙට්ටියක් ඇත.<br>4. එහි තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරයි.<br>5. එම ගැටලු සඳහා විසඳුම් ලබාදෙයි. |
| 17. | පාසලේ දී සිසුන්ගේ විනය පාලනය සඳහා ධනාත්මක ප්‍රවේශයක්භාවිතා කරයි. | 1. විනය නීති මාලාවක් ඇත.<br>2. විනය නීති මාලාව ප්‍රදර්ශනය තුළින් ප්‍රජාව දැනුවත් කරඇත.<br>3. යහපත් චර්යාවන් ප්‍රවර්ධනය කිරීමේ ක්‍රමවේද පවතී.<br>4. අයහපත් චර්යාවන් නිර්න්දනය කිරීමේ ක්‍රියාකාරකම් හා ක්‍රමවේදක්‍රියාත්මක වේ.<br>5. ඒ පිළිබඳව පසු විපරමක් සිදු කරයි. |
| 18. | පාසල් සිසුන්ගේ මනෝ සමාජයීය නිපුණතා සංවර්ධනය සඳහා ක්‍රියාත්මකවේ. | පාසල තුළ 4, 7, 10 ශ්‍රේණිවල සිසුන් සඳහා නිපුණතාසංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වේ. |
| 19. | ඉගෙනුම් දුෂ්කරතා, සුහග හා චර්යාමය ගැටලු සහිත සිසුන්හඳුනා ගැනීම හා මැදිහත්වීම. | 1. ඉගෙනුම් දුෂ්කරතා, සුහග හා චර්යාමය ගැටලු සහිත සිසුන්හඳුනාගෙන ඇත.<br>2. මැදිහත් වීම සඳහා ගුරුවරුන් පුහුණුව ලබා සිටියි.<br>3. එවැනි සිසුන්හට නිසි මඟපෙන්වීමක් සිදුකරයි.<br>4. ප්‍රගතිය සම්බන්ධ වාර්තා තබාගනියි.<br>5. අවශ්‍ය යොමු කිරීම් සිදු කරයි. |

| | | |
|---|---|---|
| 20. | ගුරුවරුන්ගේ මනෝ සමාජයීය සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මකවේ. | 1. ගුරුවරයාගේ කාර්යභාරය පිළිබඳ ගුරුවරුන්ට ප්‍රමාණවත්දැනුමක් ලබා දී ඇත.<br>2. සෑම ගුරුවරයෙකුම මනෝ සමාජයීය නිපුණතා පිළිබඳවපුහුණුවක් ලබා ඇත.<br>3. ගුරුවරුන්ගේ ගැටලුවලදී සහය වීමේ අවස්ථා පවතී.<br>4. මානසික ආතති කළමනාකරණය පිළිබඳ දැනුවත් කර ඇත.<br>5. වර්ෂයකට වරක්වත් අවම වශයෙන් ලිහිල්කරණ(relaxation) හෝ විනෝදජනක වැඩසටහන්ක්‍රියාත්මක වේ.<br>6. ගුරුවරුන්ගේ සාමූහික ක්‍රියාකාරකම් දිරිගැන්වීමේ ක්‍රමවේදයක්ඇත. |
| 21. | උපදේශන හා මාර්ගෝපදේශ පහසුකම් සැපයීම | 1. පාසලේ උපදේශන/ මාර්ගෝපදේශන පුහුණුව ලත් ගුරුවරයෙක්සිටියි.<br>2. අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දෙයි.<br>3. සෑම සිසුවෙකුටම උපාද්‍යාය(mentor) ගුරුභවතකු හඳුන්වා දී ඇත.<br>4. සහය ක්‍රියාකාරකම් පවතී.<br>5. පසුවිපරම් ක්‍රියාත්මක වේ. |
| 22. | සතිමත් බව සංවර්ධනය කිරීම. | 1. සතිමත් බව සංවර්ධනය කිරීමේ වැඩසටහන් සැලසුම් කර ඇත.<br>2. සතිමත් බව සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක වේ.<br>3. ඒ පිළිබඳව පසුවිපරම් සිදුකරයි. |
| 23. | ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීම. | 1. පුද්ගලික ආරක්ෂාව හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව දැනුවත්කර ඇත.<br>2. තම ශරීරය පිළිබඳවප්‍රාථමික අංශයේ සිසු දරුවන් හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව 6, 7, 12 ශ්‍රේණිසඳහා විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක වේ. |